© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

4107

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017

| PE0110/PE710 | අධ්‍යාපන මනෝවිද්‍යාව<br>EDUCATIONAL PSYCHOLOGY |
|---|---|

2017.03.04    පෙ.ව 0900 - පෙ.ව 1200    කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

### I කොටස

විභාග අංකය:.................................

වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.

01. මනෝවිද්‍යාව හැඳින්වීමෙහි ලා වඩාත් උචිත ප්‍රකාශය කුමක් ද?
    1. මිනිසාගේ පැවැත්ම හා මනස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව කරන අධ්‍යයනයකි
    2. මිනිස් චර්යාව හා ඊට පදනම් වන මානසික ක්‍රියාවලිය පිළිබඳ ව කරන අධ්‍යයනයකි
    3. මානසික සංවර්ධනය සහ එහි ප්‍රගතිය පිළිබඳ ව කරන අධ්‍යයනයකි
    4. මිනිස් ඉගෙනුම සිදුවන ආකාරය පිළිබඳ ව කරන අධ්‍යයනයකි (........)

02. සුනිමල් 2 ශ්‍රේණියේ ඉගෙනුම ලබන බෙහෙවින් පහළ අධ්‍යාපන මට්ටමක් සහිත, අනාරක්ෂිත ව පීඩාකාරී ලෙස කටයුතු කරන ශිෂ්‍යයෙකි. ඔහු මෙම තත්ත්වයට පත්වීමට හේතු සොයා බැලීම සඳහා වඩාත් උචිත මනෝවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රමය,
    1. සම්මුඛ සාකච්ඡා ය    2. සම්පරීක්ෂණ ය
    3. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ය    4. ප්‍රශ්නාවලි ය (........)

03. මනෝවිද්‍යාත්මක පුද්ගල අධ්‍යයන ක්‍රමයක් වශයෙන් සම්පරීක්ෂණ,
    1. හේතුඵල සම්බන්ධතාව අනාවරණය කර ගැනීමට යොදා ගැනේ
    2. විශාල නියැදියකින් තොරතුරු රැස් කර ගැනීමට යොදා ගැනේ
    3. ගුරු පෞරුෂ ගුණාංග පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට යොදා ගැනේ
    4. සමාජයේ හුදකලා වූවන් හඳුනා ගැනීම සඳහා යොදා ගැනේ (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

04. එරික්-එරික්සන්ගේ මනෝ සමාජ න්‍යාය අනුව අවු. 6-12 (මැද ළමාවිය) වයස් කාණ්ඩයේ දරුවන් මුහුණ දෙන අර්බුදය කුමක් ද?

1. ස්වතන්ත්‍රතාව හෝ සැකය සහ ලැජ්ජාව
2. උත්පාදන ශක්තිය හෝ දෝෂත්ව හැඟීම
3. කාර්යශීලී බව හෝ අවප්‍රමාණ හැඟීම
4. අනන්‍යතාව හෝ භූමිකා ව්‍යාකූලත්වය (........)

05. පූර්ව ප්‍රසව අවධිය නියෝජනය වන උප අවධියක් වන කලල අවධියට අයත් කාල පරාසය වන්නේ,

1. පිළිසිඳ ගැනීමෙන් සතියක් පමණ වන කාලය යි
2. පිළිසිඳ ගැනීමෙන් සති අටක පමණ කාලය යි
3. පිළිසිඳ ගැනීමෙන් තුන්මසක සිට උපත දක්වා කාලය යි
4. පිළිසිඳ ගැනීමෙන් පසු සති 20ක කාලය යි (........)

06. සුනිලාගේ දරුවාට වයස මාස 18කි. චිත්‍රාගේ දරුවාට මාස 15කි. දෙදෙනා ම නිරෝගී දරුවෝ වෙති. චිත්‍රාගේ දරුවා ඇවිදියි. සුනිලාගේ දරුවාට තාමත් ඇවිදීමට නොහැකි ය. මෙයින් සුවිශේෂී වන පිළිතුර වන්නේ,

1. චාලක හැකියා වර්ධනය කෙරෙහි වයසෙහි බලපෑමක් තිබෙන බව ය
2. ළමා වර්ධන වේගයේ පෞද්ගලික විවිධතා පවතින බව ය
3. චාලක හැකියා වර්ධනය කෙරෙහි පරිසර සාධක බලපාන බව ය
4. ශාරීරික වර්ධනයේ පැහැදිලි රටාවක් නොමැති බව ය (........)

07. පියල් ඉගෙනුම් ක්‍රියාකාරකම්වල දී ගැටලුවට අදාළ සියලු අංග හොඳින් හැඳින, සක්‍රිය ලෙස ගැටලුව විසඳීමට යොමු වේ. මීට පදනම් වන මනෝවිද්‍යාත්මක මූලධර්මය වන්නේ,

1. සංඥා ඉගෙනුම ය
2. විභේදන ඉගෙනුම ය
3. ගවේෂණ ඉගෙනුම ය
4. ප්‍රතිවේධ ඉගෙනුම ය (........)

08. ඉගෙනුම පිළිබඳ පහත දැක්වෙන මූලධර්ම/අදහස් ඉදිරිපත් කොට තිබෙන මනෝවිද්‍යාඥයන් අනුපිළිවෙළින් නම් කර ඇති පිළිතුර කුමක් ද?

I අභ්‍යාසය පිළිබඳ නීතිය
II ඉගෙනුමට සුදුසු සමාජ ආකෘති
III ඉගෙනුම් ධූරාවලිය
IV උපස්ථම්භන චක්‍ර

1. ගානේ, බැන්ඩූරා, තෝන්ඩයික්, ස්කිනර්
2. තෝන්ඩයික්, බැන්ඩූරා, ගානේ, ස්කිනර්
3. ස්කිනර්, ගානේ, තෝන්ඩයික්, බැන්ඩූරා
4. තෝන්ඩයික්, ගානේ, ස්කිනර්, බැන්ඩූරා (........)

09. සංකල්පයක් සාධනය වන නිවැරදි අනුපිළිවෙළ වනුයේ,

1. සංවේදනය, අවධානය, සංවිධානය, සංජානනය ය
2. සංවේදනය, සංජානනය, අවධානය, සංවිධානය ය
3. සංවේදනය, අවධානය, සංජානනය, සංවිධානය ය
4. සංවේදනය, සංජානනය, සංවිධානය, අවධානය ය (........)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

10. සංයුතිය, ක්‍රියාකාරකම් සහ නිෂ්පාදන ඵලය බුද්ධියේ ප්‍රධාන අංශ තුනක් ලෙස බෙදා ඇත්තේ කවර මතයෙන් ද?

1. බුද්ධි ව්‍යුහ පිළිබඳ මතයෙන්     2. ද්වි සාධක මතයෙන්

3. බහු සාධක මතයෙන්     4. පැරණි මණ්ඩල මතයෙන් (........)

11. ගණිත ගැටලු නිතර වරද්දන සිසුන් කෙරෙහි ගුරුවරයා තුළ කෝපයක් පැන නැඟුන ද ඔහු එම කෝපය මැඩගෙන නැවත නැවතත් එම ගැටලු පහදා දෙයි. මෙයින් පෙනී යන්නේ මෙම ගුරුවරයා,

1. යහපත් ආකල්ප ඇති අයකු බව යි
2. චිත්තවේග බුද්ධියෙන් යුක්ත අයකු බව යි
3. ඉගැන්වීමට දක්ෂ අයකු බව යි
4. ඉතා සාමාකාමී අයකු බව යි (........)

12. ගුරුවරයෙක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වන විට වැඩි වශයෙන් කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතයට ගනියි. මේ ඔස්සේ ශිෂ්‍යයන් තුළ සංවර්ධනය වන ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යායට අයත් බුද්ධි වර්ගය මින් කුමක් ද?

1. දෘශ්‍ය අවකාශමය බුද්ධිය යි     2. තාර්කික ගණිත බුද්ධිය යි

3. අන්තඃ පුද්ගල බුද්ධිය යි     4. අන්තර් පුද්ගල බුද්ධිය යි (........)

13. පෞරුෂය පිළිබඳ විවිධ මනෝවිද්‍යාඥයින් විසින් ඉදිරිපත් කොට තිබෙන අදහස් සැලකිල්ලට ගත් විට අසත්‍ය ප්‍රකාශය වන්නේ කුමක් ද?

1. පෞරුෂයේ ස්ථාවර ලක්ෂණ මෙන් ම වෙනස් වන ලක්ෂණ ද පවතී
2. පෞරුෂය යන්න සැම කෙනකු තුළ ම පවතින්නක් නොවේ
3. යහපත් පෞරුෂය යන්න සමාජ ඇගයීම මත විනිශ්චය කරයි
4. පෞරුෂය යන්නෙන් පුද්ගල අනන්‍යතාව ප්‍රදර්ශනය වේ (........)

14. ස්වසංකල්පය පිළිබඳ ව ඉදිරිපත් ව පවත්නා පහත දැක්වෙන වගන්ති අතුරින් සත්‍ය වන්නේ මොනවා ද?

A – ස්වසංකල්පය තුළ පුද්ගලයන් තමා තක්සේරුකරණ ආකාරයක් අඩංගු වේ.

B – ස්වසංකල්පය හා චර්යාව අතර අන්‍යොන්‍ය සබඳතාවක් පවතී.

C – ස්වසංකල්පය පුද්ගලයා තුළ පවතින නොවෙනස්, ස්ථාවර ලක්ෂණයකි.

D – ස්වසංකල්පය පුද්ගලයා තමා සංජානනය කරන ආකාරය අනුව ගොඩ නැගෙයි.

1. ABC    2. ACD    3. ABD    4. BCD (........)

15. මැග්ඩූගල්ගේ සහජ ලැදියා මතය සම්බන්ධ ව දක්වා තිබෙන පහත දැක්වෙන ප්‍රකාශ හතර සැලකිල්ලට ගනිමින් නිවැරදි පිළිතුර තෝරන්න.

A – පුද්ගලයකු ලැදියා උරුම කර ගන්නේ ආරයෙනි.

B – ලැදියාවක් ක්‍රියාත්මක වීමේ අනුපිළිවෙළක් නැත.

C – ලැදියා ගොඩනැඟීමට පුහුණුවක් අවශ්‍යය.

D – සැම ලැදියාවක් ම චිත්තවේග පදනම් ව උත්පාදනය වේ.

1. AB ප්‍රකාශ සත්‍ය වන අතර CD ප්‍රකාශ අසත්‍ය වේ
2. AD ප්‍රකාශ සත්‍ය වන අතර BC ප්‍රකාශ අසත්‍ය වේ
3. CD ප්‍රකාශ සත්‍ය වන අතර AB ප්‍රකාශ අසත්‍ය වේ
4. BC ප්‍රකාශ සත්‍ය වන අතර AD ප්‍රකාශ අසත්‍ය වේ (........)

අ.පි.බ.



Rev Manikwela Suvathara Thero

16. සංජානනය යන්න වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ කවර ප්‍රකාශයෙන් ද?

1. පංචේන්ද්‍රිය මගින් ලබා ගත් තොරතුරු මොළයට ගෙන යාම යි
2. පංචේන්ද්‍රිය මගින් ලබා ගත් තොරතුරු ධාරණය කර ගැනීම යි
3. පංචේන්ද්‍රිය මගින් ලබා ගත් තොරතුරු දිගුකාලීන මතකයට ගැනීම යි
4. පංචේන්ද්‍රිය මගින් ලබා ගත් තොරතුරු අර්ථවත් ව අවබෝධ කර ගැනීම යි (........)

17. තර්කනය සම්බන්ධ ව ඉදිරිපත් ව පවතින පහත A සහ B උදාහරණ සැලකිල්ලට ගනිමින් නිවැරදි පිළිතුර තෝරන්න.

A – රත් වූ විට යකඩ ප්‍රසාරණය වේ. රත් වූ විට ජලය ප්‍රසාරණය වේ. රත් වූ විට වාතය ප්‍රසාරණය වේ. මේ අනුව සියලු ම ඝන, ද්‍රව හා වායු රත් වූ විට ප්‍රසාරණය වේ.

B – සියලු ම ද්‍රව්‍ය රත් වූ විට ප්‍රසාරණය වේ. යකඩ ද ද්‍රව්‍යයකි. එම නිසා යකඩ ද රත් වූ විට ප්‍රසාරණය වේ.

1. A උද්ගාමී තර්කනයට උදාහරණයකි. B නිගාමී තර්කනයට උදාහරණයකි.
2. B උද්ගාමී තර්කනයට උදාහරණයකි. A නිගාමී තර්කනයට උදාහරණයකි.
3. A හා B යන දෙක ම උද්ගාමී තර්කනයට උදාහරණයකි.
4. A හා B යන දෙක ම නිගාමී තර්කනයට උදාහරණයකි. (........)

18. ඉගැන්වීමේ ක්‍රමයක් වශයෙන් ගැටලු විසඳීම භාවිතයට ගැනීම සම්බන්ධ ව හර්බාර්ට් දක්වන ලද පියවරවල අනුපිළිවෙල රටාව සඳහන් පිළිතුර කුමක් ද?

1. සූදානම් වීම, ඉදිරිපත් කිරීම, සාමාන්‍යකරණය, තුලනය හා විච්ඡේදනය
2. සූදානම් වීම, තුලනය හා විච්ඡේදනය, සාමාන්‍යකරණය, ඉදිරිපත් කිරීම
3. සූදානම් වීම, සාමාන්‍යකරණය, තුලනය හා විච්ඡේදනය, ඉදිරිපත් කිරීම
4. සූදානම් වීම, ඉදිරිපත් කිරීම, තුලනය හා විච්ඡේදනය, සාමාන්‍යකරණය (........)

19. පහත දැක්වෙන චර්යාමය ලක්ෂණ හා ගැළපෙන විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය කාණ්ඩ නිවැරදි ව පිළිවෙළින් දක්වා තිබෙන පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| (i) | ඉක්මනින් කෝප වීම | A - ඔටිසම |
| (ii) | ගොත ගැසීම | B – චිත්තවේගීය |
| (iii) | පොතට ඇස ලං කර බැලීම | C – භාෂණ ඌනතා |
| (iv) | අපේක්ෂිත හැකියා සහ සැබෑ හැකියා අතර වෙනසක් පැවතීම | D – ඉගෙනුම් දුෂ්කරතා |
| | | E – දෘශ්‍යාබාධිත |

1. ABCE
2. ACED
3. BCED
4. BACE (........)

20. විශේෂ අවශ්‍යතාවන් අනුව දරුවන් වර්ග කරනු ලබන්නේ,

1. ගුරුවරුන්ට හැඳින ගැනීමේ පහසු ව සඳහා ය
2. ඔවුන්ට වෙන් වෙන් පන්ති කාමර ලබා දීම සඳහා ය
3. සුවිශේෂී අවශ්‍යතා පාදක ව ඉගැන්වීම සඳහා ය
4. ඉගැන්වීමේ කාර්ය පහසු කර ගැනීම සඳහා ය (........)

(ලකුණු 1 x 20 = ලකුණු 20යි)

Rev Manikwela Suwathana Thero

4107

© [ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0110/PE710 - අධ්‍යාපන මනෝවිද්‍යාව

**II කොටස**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පුද්ගල වර්ධනය හා සංවර්ධනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ගුරුවරයකු සතු ව පැවතිය යුතු ය.
   (i) පුද්ගල වර්ධනය හා සංවර්ධනය අතර පවත්නා වෙනස්කම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
   (ii) පුද්ගල සංවර්ධනයේ පවත්නා පැතිකඩ **පහක්** නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05යි)
   (iii) පුද්ගල සංවර්ධනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ගුරුවරයකුට පැවතීමේ වැදගත්කම උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 08යි)

2. බුද්ධි සංවර්ධනය සිදුවන ආකාරය පිළිබඳ පුළුල් විග්‍රහයක් ජීන් පියාජේ නම් මනෝවිද්‍යාඥයා විසින් සිදු කර ඇත.
   (i) බුද්ධි සංවර්ධනය සිදුවන ආකාරය විග්‍රහ කිරීමට පියාජේ විසින් ඉවහල් කර ගත් ස්කීමා, සමාග්‍රහණය හා ප්‍රතියෝජනය යන ක්‍රියාවලි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)
   (ii) පියාජේගේ බුද්ධි සංවර්ධන අවධි ව්‍යුහයේ එක් අවධියක් වන සංයුක්ත චින්තන අවධියේ පසුවන ශිෂ්‍යයින් තුළ දැකිය හැකි බුද්ධිමය හැකියා **පහක්** හඳුන්වන්න. (ලකුණු 05යි)
   (iii) ගුරුවරයකු වශයෙන් සංයුක්ත චින්තන අවධියේ පසුවන ශිෂ්‍යයන්ගේ බුද්ධිමය හැකියා සැලකිල්ලට ගනිමින්, ඔවුන් සඳහා ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරන ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08යි)

3. පන්ති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානය කර ගැනීම සඳහා පැව්ලොව්ගේ සම්භාව්‍ය ආරෝපණ න්‍යායෙන් ගුරුවරයාට විශාල මඟපෙන්වීමක් සිදු කරයි.
   (i) සම්භාව්‍ය ආරෝපණ න්‍යාය ඉදිරිපත් කිරීම සඳහා පැව්ලොව් විසින් සිදු කළ පරීක්ෂණය පියවර වශයෙන් දක්වන්න. (ලකුණු 03යි)
   (ii) සම්භාව්‍ය ආරෝපණ න්‍යායේ අන්තර්ගත ප්‍රබෝධක සාමාන්‍යකරණය හා ඉහළ පරිපාටියේ ආරෝපණය යන සංකල්ප උදාහරණ ඇසුරින් හඳුන්වන්න. (ලකුණු 05යි)
   (iii) සම්භාව්‍ය ආරෝපණ න්‍යායේ මූලධර්ම ගුරුවරයකු වශයෙන් ඔබට පන්ති කාමරයට අදාළ කර ගත හැකි ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev. Manikwela Sirirathana Thero

4. ඉගෙනුම් අවස්ථා සැලසුම්කරණයේ දී ළමයාගේ සංකල්ප සාධන හැකියාව පිළිබඳ අවබෝධයක් ගුරුවරයාට තිබීම වැදගත් වේ.

(i) ඩෙල්ගේ අත්දැකීම් කේතුවේ අන්තර්ගත සංකල්ප සාධනය හා සම්බන්ධ ප්‍රධාන අත්දැකීම් තුන හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) සංකල්ප ඉගෙනුමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

(iii) සංකල්ප ඉගැන්වීමේ දී ගුරුවරයාගේ සැලකිල්ල යොමු විය යුතු කරුණු නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 08යි)

5. පෞරුෂය යන්න සංවර්ධනය වන මෙන් ම සංවර්ධනය කළ හැකි සංකල්පයකි.

(i) පෞරුෂ සංවර්ධනය පිළිබඳ ගති ලක්ෂණ ප්‍රවේශය යටතේ ඕල්පෝට් විසින් දක්වන ලද පුද්ගල ගති ලක්ෂණ තුන කොටසයෙන් හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකක් නම් කර, ඒවා ඔස්සේ පෞරුෂ සංවර්ධනය සිදුවන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) සිසු පෞරුෂය ගොඩනැංවීම සම්බන්ධ ව ගුරුවරයාගේ කාර්යභාරය ඔබ ලබා තිබෙන අත්දැකීම් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු [illegible])

6. පුද්ගල අභිප්‍රේරණය සිදුවන ආකාරය පිළිබඳ විවිධ මනෝවිද්‍යාත්මක අදහස් රැසක් ඉදිරිපත් ව පවතී.

(i) අභිප්‍රේරණය යන්න අර්ථ දක්වා, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එහි පවත්නා වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 03යි)

(ii) ෆ්‍රොයිඩ් දක්වන පරිදි පුද්ගල අභිප්‍රේරණය කෙරෙහි අවිඥානික බලවේග බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය මගින් හඳුන්වා දුන් අවශ්‍යතා ධූරාවලිය නම් කොට, ශිෂ්‍යයන් ඉගෙනුමට පෙළඹවීම සඳහා මෙම න්‍යායේ මූලධර්ම ඉවහල් කර ගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 08යි)

7. මතකය හෙවත් ස්මෘතිය පිළිබඳ විද්‍යාත්මක අවබෝධයක් සෑම ගුරුවරයකු ම ලබා තිබීම ප්‍රයෝජනවත් වේ.

(i) මතකය හා සම්බන්ධ ප්‍රධාන අවධි තුන හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) අමතකවීම පිළිබඳ අන්‍යෝන්‍ය නිශේධන මතය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) පාසල් සිසුන්ගේ මතක හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයකුට අනුගමනය කළ හැකි ශිල්පීය ක්‍රම උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikwela Siriwathana Thero

8. සැමට අධ්‍යාපනය යන සංකල්පය යටතේ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ වර්තමානයේ විශාල උනන්දුවක් පවතී.

(i) විශේෂ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් සාමාන්‍ය පන්ති කාමරයට අන්තර්කරණය කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) ගුරුවරයකු විසින් තම පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයකු පිළිබඳ ව තබා තිබූ ප්‍රත්‍යවේක්ෂණ සටහනකින් ලබා ගන්නා ලද උපුටනයක් පහත දැක්වේ.

"කුමාර 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකි. මොහු උගන්වන විට දී ගුරුවරයාගේ තොල් සෙලවෙන ආකාරය හා කට දෙස බලා සිටියි. නිතර ම ශබ්දයක් ඇසෙන පැත්තට කන හරවමින් සවන් දෙයි. වාචික උපදෙස් කෙරේ අවධානය දක්වන්නේ මඳ වශයෙනි."

විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය වර්ගීකරණය යටතේ කුමාර අයත් විය හැක්කේ කුමන කාණ්ඩයකට ද යන්න නම් කර, මෙවැනි ශිෂ්‍යයන් සාමාන්‍ය පන්ති කාමරයට අන්තර්කරණය කිරීම සම්බන්ධ ව ගුරු කාර්යභාරය විස්තර කරන්න.

(ලකුණු 08යි)

********

Rev Manikwela Sirirathana Thera

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
ලිඛිත පරීක්ෂණය - 2018

PE0110/PE710 | අධ්‍යාපන මනෝවිද්‍යාව EDUCATIONAL PSYCHOLOGY

2018.12.14 | පෙ.ව 0900 - පෙ.ව 1200 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

**විභාග අංකය:..................................................**

**I කොටස**

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. විවිධ වයස් පරාසවල ශිෂ්‍ය කණ්ඩායම් කීපයක් එකට ගෙන කිසියම් චර්යා රටාවක් පරීක්ෂාවට ලක් කොට සාමාන්‍යකරණය සඳහා යොදා ගැනෙන අධ්‍යයන ක්‍රමය වන්නේ,

    1. අන්වායාම ක්‍රමය  2. හරස්කඩ ක්‍රමය
    3. සම්පරීක්ෂණ ක්‍රමය  4. නිරීක්ෂණ ක්‍රමය (..............)

02. මනෝවිද්‍යාත්මක පරීක්ෂණවලින් ලද හැකි ප්‍රයෝජන හතර කියවෙන වඩාත් නිවැරදි වරණය තෝරන්න.

    1. තරා කිරීම, ස්ථාපනය, අනාවරණය, පර්යේෂණ කාර්යය
    2. තරා කිරීම, ප්‍රක්ෂේපණය, අනාවරණය, පර්යේෂණ කාර්යය
    3. තරා කිරීම, නියාමනය, අනාවරණය, පර්යේෂණ කාර්යය
    4. තරා කිරීම, නියාමනය, ප්‍රක්ෂේපණය, පර්යේෂණ කාර්යය (..............)

03. සිසුන් විෂය කරුණුවලට අදාළ ව නිතර ප්‍රශ්න අසන විට ගුරුවරිය කෝන්ති ගනී. මෙයින් ගම්‍ය වන්නේ,

    1. සිසුන් අසන ප්‍රශ්න පිළිබඳ ව ගුරුවරියට අවබෝධයක් ලබාදිය යුතු බව ය.
    2. විෂය කරුණු පිළිබඳ අවබෝධයක් ගුරුවරියට ලබාදිය යුතු බව ය.
    3. චිත්තවේගය පාලනය පිළිබඳ අවබෝධයක් ගුරුවරියට ලබාදිය යුතු බව ය.
    4. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ගුරුවරියට ලබාදිය යුතු බව ය. (..............)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

04. නවයොවුන් වියේ පසුවන්නන් සඳහා දෙමව්පියන් විසින් අනුගමනය කළ යුතු වඩා හොඳ පිළිවෙත නම්,

1. ස්වාධීන ව කටයුතු කිරීමට ඉඩ දී ඔවුන්ගෙන් ඉවත්වීම යි.
2. ඔවුන් සමවයස් කණ්ඩායම්වල ඇසුරට පත් නොකිරීම යි.
3. ස්වාධීන ව කටයුතු කිරීමට ඉඩ දෙන අතර ඇතැම් විට තදින් සිටීම යි.
4. ඔවුන්ට නිදහසේ කටයුතු කිරීමට ඉඩ දෙන අතර මිත්‍රශීලී ලෙස උපදෙස් දීම යි. (..........)

05. ළමා සංවර්ධනයෙහි ස්වභාවය අනුව සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

1. ළමා සංවර්ධනය හා සම්බන්ධ තීරක අවධි ඇත.
2. ළමා සංවර්ධනයෙහි ලා අවධි අනුපිළිවෙළක් ඇත.
3. සෑම ළමයකුගේ ම සංවර්ධන වේගය සමාන ය.
4. ළමා සංවර්ධනය අවිච්ඡින්න ක්‍රියාවලියකි. (..........)

06. පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යාය භාවිතයට ගැනීමේ දී ගුරුවරයකු විසින් කළ යුතු වඩාත් සුදුසු කාර්යය වන්නේ,

1. ඉගැන්වීමට නියමිත කාලය එළඹෙන තෙක් බලා සිටීම ය.
2. ශිෂ්‍යයන්ට ක්‍රියාකාරිත්වයන් තුළින් ඉගෙනීමට සැලැස්වීම ය.
3. ශිෂ්‍යයන් තුළ වේගවත් ප්‍රජානන සංවර්ධනයක් ඇති කිරීම ය.
4. කරුණු රැසක් ඉදිරිපත් කරමින් එයින් කීපයක් හෝ ග්‍රහණය කර ගැනීමට ඉඩ සැලැස්වීම ය.

(..........)

07. සුගත් පාසල් ගුරුවරයෙකි. ඉගැන්වීමේ දී නිතර අභ්‍යාස ලබාදීම හා කරුණු පුනරීක්ෂණයට ලක් කිරීම කරයි. මෙහි ලා ඔහු අනුගමනය කරන න්‍යාය වන්නේ,

1. ස්කිනර්ගේ ප්‍රකාරක ආරෝපණ න්‍යාය යි.
2. ගෙස්ටෝල්ට්වාදීන්ගේ ප්‍රතිවේදී අධ්‍යයන න්‍යාය යි.
3. පැව්ලොව්ගේ සම්භාව්‍ය ආරෝපණ න්‍යාය යි.
4. තෝන්ඩයික්ගේ අභ්‍යාස නීතිය යි. (..........)

08. ගෙස්ටෝල්ට් න්‍යායෙන් ප්‍රකාශ වන සංජානන මූලධර්ම හා එකඟ නොවන ප්‍රකාශය කුමක් ද?

1. රූප රටා අතර අන්තර් සම්බන්ධතාවක් නොතිබුණ ද පහසුවෙන් සංජානනය කළ හැකි ය.
2. කිසියම් රූපයක හිඩසක් තිබුණ ද එය නොසලකා සමස්ත රූපය සංජානනය කළ හැකි ය.
3. එකිනෙකට සමීප ප්‍රබෝධක බොහෝ විට එකට ම සංජානනය කළ හැකි ය.
4. අඛණ්ඩ පේළියක් ඔස්සේ ඇති ප්‍රබෝධක එකවර පහසුවෙන් සංජානනය කළ හැකි ය.

(..........)

09. බුද්ධිය සම්බන්ධ ද්විසාධක මතයට අනුව යමකු දක්ෂ ලෙස නර්තනයක යෙදෙන අවස්ථාවක,

1. බුද්ධියේ විශේෂ සාධක පමණක් ක්‍රියාත්මක වේ.
2. බුද්ධියේ සාධක දෙක ම සමාන මට්ටමින් ක්‍රියාත්මක වේ.
3. පොදු සාධකයට වඩා විශේෂ සාධකය ක්‍රියාත්මක වේ.
4. විශේෂ සාධකයට වඩා පොදු සාධකය ක්‍රියාත්මක වේ. (..........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

10. වාචික අවබෝධ හැකියාව, වාචික ව්‍යක්ත භාවය යන මේවා ඇතුළත් වන්නේ,

1. බුද්ධිය පිළිබඳ වර්නන්ගේ ත්‍රිසාධක මතයෙහි ය.
2. තර්ස්ටන්ගේ බහුසාධක මතයෙහි ය.
3. ගිල්ෆර්ඩ්ගේ බුද්ධි ව්‍යුහයෙහි ය.
4. හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධියෙහි ය. (..........)

11. ආත්ම සම්මානන අවශ්‍යතාව යනු,

1. තම දක්ෂතා සඳහා ලැබෙන ත්‍යාග සහ සහතික පත්
2. වෙනත් අයගෙන් ලැබෙන ගරු නම්බුනාම
3. සමාජයේ කැපී පෙනීම
4. තමා සමාජය තුළ පිළිගැනීමට ලක්වීම (..........)

12. අභිප්‍රේරණ න්‍යායට අනුව පහත සඳහන් න්‍යායන් ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් දැ'යි ගළපා දැක්වූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| | | | |
|---|---|---|---|
| 1. | අවශ්‍යතා අනුක්‍රමාධිපත්‍යය | A | මැක්ඩුගල් |
| 2. | අවරෝධන මතය | B | සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් |
| 3. | සංස්කෘතික රටා මතය | C | මාස්ලෝ |
| 4. | ලැදියා මතය | D | මාගරට් මීඩ් |

1. C, B, D, A
2. B, A, C, D
3. B, A, D, C
4. C, D, B, A (..........)

13. නාම විශේෂණ උගත් සිසුන්ට, ක්‍රියා විශේෂණ පහසුවෙන් ඉගෙනීම සඳහා ඉගෙනුම් මාරුවක් සිදු කරනුයේ,

1. සංකල්ප මගිනි.
2. සම්බන්ධතා මගිනි.
3. කාර්ය සාධනය මගිනි.
4. මූලධර්ම මගිනි. (..........)

14. ඉගෙනීමට උනන්දුව නැති, නීති උල්ලංඝනය කරමින් පාසලින් කට්ටි පනින සිසුන් හඳුන්වනු ලබන්නේ,

1. පසුබට සිසුන් වශයෙනි.
2. අපචාරී සිසුන් වශයෙනි.
3. මන්ද මානසික සිසුන් වශයෙනි.
4. ඌන වර්ධිත සිසුන් වශයෙනි. (..........)

15. අමිල දහසාර ශිෂ්‍යයෙකි. පාඩමට උනන්දුවක් නොදක්වයි. ඔහුගේ හැසිරීම සෙසු ළමයින්ට මෙන් ම ගුරුවරයාගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයට ද බාධාවකි. ඔහු වෙනුවෙන් ගත යුතු වඩා සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,

1. අමිලගේ දෙමව්පියන් පාසලට ගෙන්වා උපදෙස් දීම ය.
2. විදුහල්පතිට දන්වා ඔහු පිළිබඳ නීත්‍යානුකූල පියවරක් ගැනීම ය.
3. ගුරු මණ්ඩලය සමඟ සාකච්ඡා කර අමිල පිළිබඳ තීරණයක් ගැනීම ය.
4. අමිලට ඇති ගැටලුව පිළිබඳ ව ඔහු හා ඔහුගේ දෙමව්පියන් සමඟ සාකච්ඡා කිරීම ය.

(..........)

අ.පි.බ.

Rev Maakuela Sirirathana Thero

16. සිසුන්ගේ අභ්‍යාස ඇගැයීම සම්බන්ධයෙන් වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය මින් කුමක් ද?

1. අභ්‍යාස නිම කළ විගස ම ඇගැයීමට ලක් කර ප්‍රතිඵල දැන ගැනීමට සැලැස්වීම ය.
2. අභ්‍යාස නිම කළ විගස ම ඇගැයීමට ලක් කර ප්‍රතිඵල දන්වා, කුසලතා දිරි ගන්වා දුර්වලතා මඟහැරවීම ය.
3. අභ්‍යාස නිම කළ විගස ම අගය කර, ප්‍රතිඵල පසුව දැන ගැනීමට සැලැස්වීම ය.
4. අභ්‍යාස නිම කළ විගස ම ඇගැයීමට ලක් කර ප්‍රතිඵල දන්වා, වැරදි පිළිතුරු පිළිබඳ සාකච්ඡා කිරීම ය. (..............)

17. නම්‍යතාව, නව්‍යතාව හා චින්තනයේ චතුර බව යන ලක්ෂණ,

1. නිර්මාපී චින්තනය සඳහා බලපාන කරුණු ය.
2. සුහග ලමුන් සම්බන්ධ ලක්ෂණයන් ය.
3. ප්‍රතිවේදි අධ්‍යයනයේ ලක්ෂණයන් ය.
4. සංකල්ප සාධනය හා සම්බන්ධ කරුණු ය. (..............)

18. චින්තනයේ අවස්ථා හතරක් විගොට්ස්කි දක්වයි. ඊට අයත් නොවන්නේ කුමක් දැ'යි තෝරන්න.

1. කාල්පනික චින්තනය
2. සංජානනික චින්තනය
3. තර්කානුකූල චින්තනය
4. නිර්මාපී චින්තනය (..............)

19. ගුරුවරයකු තුළ ආත්මාවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ,

1. සමාජයට ආදර්ශමත් අයකු වීමට ය.
2. අවශ්‍ය ගුරු පෞරුෂය මනා ලෙස සකස් කර ගැනීමට ය.
3. ශිෂ්‍යයන් පිළිබඳ අවබෝධයක් ලැබීමට ය.
4. ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට ය. (..............)

20. පාසල් පද්ධතිය දරුවන්ට ගැලපෙන සේ වෙනස් කෙරේ.

- දුබලතා නොව විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගැනේ.
- විෂයමාලාව නම්‍යශීලී කෙරේ.
- පන්ති කාමර වාතාවරණය සුදුසු පරිදි සකස් කෙරේ.

දුබලතා ඇති අයගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙසේ කරන්නේ,

1. දුබලතා පිටු දැකීමේ ප්‍රවේශය තුළ ය.
2. ඒකීකරණ ප්‍රවේශය තුළ ය.
3. අන්තර්කරණ ප්‍රවේශය තුළ ය.
4. සාම්ප්‍රදායික ප්‍රවේශය තුළ ය. (..............)

(ලකුණු 1 x 20 = ලකුණු 20)

Rev. Manikwela Siriathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் கிளை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0110/PE710 - අධ්‍යාපන මනෝවිද්‍යාව

### II කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. දරුවාගේ සංවර්ධන ක්‍රියාවලිය ඇරඹෙන්නේ මව්කුස තුළ දී ය.

(i) මව්කුසෙහි වැඩෙන දරුවාගේ සංවර්ධන අවධි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) එම අවධි තුන පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(iii) පූර්ව ප්‍රසව අවධියේ දී ගැබිනි මව විසින් සැලකිල්ලට ගතයුතු කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍ර අතර අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරුන් විසින් අවශ්‍යයෙන් ම හැදෑරිය යුතු කොටසකි.

(i) අධ්‍යාපන මනෝවිද්‍යාව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන මනෝවිද්‍යාව හැදෑරීමෙන් ගුරුවරයාට අත්වන ප්‍රයෝජන **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) ඔබ දැක්වූ ප්‍රයෝජනවලින් දෙකක් පන්ති කාමරයේ දී භාවිතයට ගන්නා අයුරු නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 08)

03. උපස්ථම්භන රටාවක් තුළින් ජීවියා හෝ පුද්ගලයා අවසාන ඉලක්කය කරා මෙහෙයවීම ස්කිනර්ගේ ප්‍රකාරක ආරෝපණ න්‍යායෙන් පැහැදිලි කෙරේ.

(i) උක්ත කාරණය පැහැදිලි කිරීම සඳහා ස්කිනර් යොදා ගත් පරීක්ෂණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) අවසාන ඉලක්කය සපුරා ගැනීම සඳහා උපස්ථම්භනය වැදගත් වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ප්‍රකාරක ආරෝපණ න්‍යාය පන්ති කාමරයට යොදා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

04. ඉගෙනුම් අවස්ථා සැලසුම්කරණයේ දී ළමයාගේ සංකල්ප සාධන හැකියාව පිළිබඳ අවබෝධයක් ගුරුවරයාට තිබිය යුතු ය.

(i) සංයුක්ත සංකල්ප හා වියුක්ත සංකල්ප කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

(ii) බෲනර් දක්වා ඇති සංකල්ප සාධන අවධි නම් කර, ඒවා ඩේල්ගේ අත්දැකීම් කේතුව සමඟ ගළපා දක්වන්න. (ලකුණු 05)

(iii) සංකල්ප ඉගැන්වීමේ දී ගුරුවරයා විසින් සැලකිය යුතු කරුණු **හතරක්** හඳුන්වන්න. (ලකුණු 08)

05. ගැටලු විසඳීමේ හැකියාව ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම ගුරුවරයාගේ කාර්ය භාරයකි.

(i) අන්තර්ඥානය හෙවත් ප්‍රතිවේදය තුළින් ගැටලු විසඳීම සම්බන්ධ ව වුල්ෆ්ගැන්ග් කොහ්ලර් විසින් චිම්පන්සියකු යොදා ගෙන කළ පරීක්ෂණය විස්තර කරන්න. (ලකුණු 03)

(ii) විද්‍යාත්මක ක්‍රමයට ගැටලු විසඳීමේ පියවර **පහ** නම් කරන්න. (ලකුණු 05)

(iii) ගැටලු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා ගුරුවරයාගේ කාර්ය භාරය විස්තර කරන්න. (ලකුණු 08)

06. මනෝවිද්‍යාඥයින් දක්වා ඇති අදහස් අනුව බුද්ධිය සාධක රාශියකින් සමන්විත ලක්ෂණයකි.

(i) බුද්ධිය පිළිබඳ සාධක විග්‍රහයට අයත් මත **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) එයින් එක් සාධක විග්‍රහයකට අනුව බුද්ධියේ ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) බුද්ධිය වැඩීම පිළිබඳ ජීන් පියාජේගේ අවධි සංකල්පය පැහැදිලි කර, එම සංකල්පය ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 08)

07. ගුරුවරයාගේ ප්‍රධාන කාර්යය ශිෂ්‍ය පෞරුෂය සංවර්ධනය කිරීම යි.

(i) ප්‍රකට නිර්වචනයක් ඇසුරින් පෞරුෂය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 03)

(ii) ආරය සහ පරිසරය පුද්ගල පෞරුෂ සංවර්ධනය කෙරෙහි කරන බලපෑම් උදාහරණ මගින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) 'ශිෂ්‍යයාගේ පෞරුෂය සංවර්ධනයෙහි ලා තීරණාත්මක සාධකය වන්නේ ගුරුවරයා ය.' මේ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 08)

08. විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ වැඩිදෙනාගේ අවධානය යොමු වී ඇත.

(i) විශේෂ අධ්‍යාපනයට පදනම් වූ මූලික ප්‍රඥප්තිය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) කායික ඌනතාවලින් පෙළෙන ළමුන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(iii) එම ළමුන් අන්තර්කරණ ප්‍රතිපත්තිය තුළට ඇතුළත් කර ගැනීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග **හතරක්** වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 08)

********

Rev. Manikwela Siriratana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016
## අවසාන පරීක්ෂණය 2017

**PE0120/PE720** | **අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම**
**THEORY & PRINCIPLES OF EDUCATION**

2017.03.11 පැය 1300 - පැය 1600 කාලය - පැය තුනයි.

*උපදෙස්:-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" සහ "ආ" යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:.............................

### I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති හිස්තැන් සහිත වරහන තුළ ලියන්න.**

01. අධ්‍යාපනය පිළිබඳ ව ඉදිරිපත් වූ දාර්ශනික අදහස් කිහිපයක් පහත දැක්වේ.
    - අකුරු ඉගෙනීම පමණක් අධ්‍යාපනය නොවේ,
    - පාසල ළමයාට ප්‍රිය උපදවන නිදහස් ස්ථානයක් විය යුතු ය,
    - ළමයාගේ සහජ හැකියා, දක්ෂතා බවට හැරෙන්නේ යම්කිසි කර්මාන්තයක් ඉගෙනීමෙනි,

    ඉහත දාර්ශනික අදහස් ප්‍රකාශ කළ දාර්ශනිකයා තෝරන්න.

    1. රවීන්ද්‍රනාත් තාගෝර් 2. ක්‍රිෂ්ණමූර්ති
    3. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර 4. මහත්මා ගාන්ධි (........)

02. සමාජයක් සිතාමතා තීරණය කර ගන්නා අධ්‍යාපන අරමුණු රැසක් ඉටු කර ගැනීම සඳහා පවත්වාගෙන යන අධ්‍යාපන ක්‍රමය මින් කුමක් ද?

    1. විධිමත් අධ්‍යාපනය 2. අවිධිමත් අධ්‍යාපනය
    3. නොවිධිමත් අධ්‍යාපනය 4. යාවජීව අධ්‍යාපනය (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

03. රටක අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේ අවශ්‍යතාව නිවැරදි ව දැක්වෙන කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. පවත්නා අධ්‍යාපන ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට
2. ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට
3. අධ්‍යාපනය පිළිබඳ ජනතාවගේ විශ්වාසය ඇති කර ගැනීමට
4. ගුරු වෘත්තිකභාවය සංවර්ධනය කර ගැනීමට (........)

04. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සාධාරණත්වය හා විවිධත්වය සම්බන්ධ අධ්‍යාපන ප්‍රමිතීන් පිරිහීමට බලපෑ හේතු දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. අධ්‍යාපන සහභාගීත්වය අවම වීම, අධ්‍යාපන සාධනයේ විෂමතා,අධ්‍යාපන ප්‍රවේශයට ඇති බාධා
2. අධ්‍යාපන සහභාගීත්වය අවම වීම, අධ්‍යාපන කළමනාකරණ දුර්වලතා, අධ්‍යාපන සාධනයේ විෂමතා
3. සම්පත්වල විෂම ව්‍යාප්තිය, දේශපාලන අවහිරතා, අධ්‍යාපන සාධනයේ විෂමතා
4. සම්පත්වල විෂම ව්‍යාප්තිය, අධ්‍යාපන කළමනාකරණ දුර්වලතා, දේශපාලන අවහිරතා (........)

05. සෑම ගුරුවරයකුට ම අනුගමනය කළ හැකි ස්වයං ඉගෙනුම් උපාය මාර්ග අතුරින් වඩාත් ගැළපෙන උපාය මාර්ගය වන්නේ,

1. තම විෂය සම්බන්ධ සම්මන්ත්‍රණවලට සහභාගි වීමෙන්
2. සඟරාවලට විවිධ ලිපි සැපයීමෙන්
3. ඉගැන්වීම සම්බන්ධ ප්‍රත්‍යවේක්ෂණයේ යෙදීමෙන්
4. ක්‍රියාමූලික පර්යේෂණවල යෙදීමෙන් (........)

06. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

A – පූර්ණ සමෝධානික පෞරුෂයක් ගොඩනැගීම.

B – ජීවිතයේ ගුණාත්මක අංශය වඩාත් දියුණු කර ගැනීමට ඉඩ ලැබීම.

C – ප්‍රජාතන්ත්‍රවාදී ලෝක සමාජයකට හුරුවීම.

D – සම අධ්‍යාපන අවස්ථා ලබාදීම.

E - රැකියා අවස්ථා ලබා ගැනීම.

ඒ අනුව යාවජීව අධ්‍යාපනය සම්බන්ධ කරුණු පමණක් පිළිවෙළින් ඇතුළත් වන පිළිතුර තෝරන්න.

1. A, B, C 2. A, B, D 3. A, C, D 4. A, D, E (........)

07. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධ්‍යාපන සමාජ විද්‍යාත්මක දැනුම ගුරුවරයකුට වැදගත් වන අවස්ථාවක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සම අධ්‍යාපන අවස්ථා නොලැබීම සහිත ශිෂ්‍යයින් හඳුනා ගැනීමට
2. ශිෂ්‍යයන්ට බලපෑ හැකි සමාජ බලවේග හඳුනා ගැනීමට
3. ශ්‍රම ඉල්ලුමට අධ්‍යාපනයේ නොගැලපීම වළක්වා ගැනීමට
4. ග්‍රාමීය ප්‍රදේශවල ශිෂ්‍යයින්ගේ ගැටලු දැන ගැනීමට (........)

08. සමාජානුයෝජනයේ දී වැදගත් වන පුද්ගල ශක්තීන් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අනුකරණය, අනුවේදනය, ව්‍යංග්‍යතාව
2. අනුකරණය, තදාත්මීකරණය, අනුවේදනය
3. උපදේශනය, ව්‍යංග්‍යතාව, තදාත්මීකරණය
4. උපදේශනය, අනුකරණය, තදාත්මීකරණය (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

09. පහත සඳහන් ප්‍රකාශයේ හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුරට අදාළ අංකය තෝරා ලියන්න.

"දරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යන කාලසීමාව දීර්ඝ වන විට එම සම්බන්ධතා තහවුරුවීම මෙන් ම එහි විශ්වසනීයත්වය ද වර්ධනය වේ. මෙම තත්ත්වය දරුවන්ගේ ________________ වර්ධනයට දායක වේ."

| | | | |
|---|---|---|---|
| 1. | සංස්කෘතික | 2. | ආර්ථික |
| 3. | සමාජ | 4. | සමාජ සංස්කෘතික (........) |

10. පාසල සම්බන්ධ ව ගුරුවරයාගේ භූමිකාවට අදාළ ප්‍රකාශ පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. චක්‍රලේඛවලට අනුව කටයුතු කිරීම, සුසාධ්‍යකාරකයකු වීම, දෙමාපියන් සමඟ කටයුතු කිරීම
2. චක්‍රලේඛවලට අනුව කටයුතු කිරීම, නියමිත කාලයේ රැඳී සිටීම, දෙමාපියන් සමඟ කටයුතු කිරීම
3. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වීම, නියමිත කාලයේ රැඳී සිටීම, චක්‍රලේඛවලට අනුව කටයුතු කිරීම
4. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වීම, නියමිත කාලයේ රැඳී සිටීම, සුසාධ්‍යකාරකයකුවීම

(........)

11. සංස්කෘතිය පවරාදීමේ දී ගුරුවරයාගේ ක්‍රියා කලාපය සම්බන්ධ තොරතුරු නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සංස්කෘතිය පිළිබඳ නිවැරදි අවබෝධය, සංස්කෘතික උරුම රැක ගැනීමේ ආකල්ප, සංස්කෘතිය පිළිබඳ විචාර බුද්ධිය
2. සංස්කෘතික සහජීවනය, සංස්කෘතික උරුම රැක ගැනීමේ ආකල්ප, සංස්කෘතිය පිළිබඳ විචාර බුද්ධිය
3. සංස්කෘතිය පිළිබඳ නිවැරදි අවබෝධය, සංස්කෘතික සහජීවනය, සංස්කෘතික උරුම රැක ගැනීමේ ආකල්ප
4. සංස්කෘතික සහජීවනය, සංස්කෘතිය පිළිබඳ නිවැරදි අවබෝධය, සංස්කෘතිය පිළිබඳ විචාර බුද්ධිය (........)

12. ගෝලීයකරණය අධ්‍යාපනයට බලපා ඇති ආකාරය දැක්වෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – සමානාත්මතාව පදනම් ව අධ්‍යාපන ක්‍රමය සකස් කිරීම.

B – සාර්ථක ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා ලබාදීම.

C – මතකය මනින ලිඛිත විභාග ක්‍රමය හඳුන්වාදීම.

D – ලෝකය පුරා පවතින දැනුම ලබා ගැනීමට නොහැකිවීම.

ඉහත ප්‍රකාශ අතුරින් ගෝලීයකරණය අධ්‍යාපනයට යහපත් ලෙස සහ අයහපත් ලෙස බලපා ඇති ප්‍රකාශ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A, B   2. A, C   3. B, C   4. B, D (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

13. පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.

- අධ්‍යාපන මාධ්‍යයක් ලෙසත් විනෝදය හා ආරංචි පැතිරවීමටත් වැදගත් වේ.
- ළමයින් නිහඬ ව තබා ගැනීමට හැකි වුව ද ඔවුන් සැදීමට සමත් නොවේ.
- වෙනත් කාර්යයක යෙදෙන අතරතුර ද භාවිත කළ හැකි වේ.
- සාක්ෂරතාව නොමැති කෙනකුට වුව ද ප්‍රයෝජනයට ගත හැකි වේ.

ඒ සම්බන්ධ සන්නිවේදන මාධ්‍ය අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. රූපවාහිනිය, සිනමාව, ගුවන්විදුලිය, පුවත්පත්
2. රූපවාහිනිය, සිනමාව, පුවත්පත්, ගුවන්විදුලිය
3. පුවත්පත්, සිනමාව, ගුවන්විදුලිය, රූපවාහිනිය
4. පුවත්පත්, රූපවාහිනිය, ගුවන්විදුලිය, සිනමාව (........)

14. පහත දක්වා ඇති අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රකාශය හා හේතුව සලකන්න.

ප්‍රකාශය - ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙන් රටේ වාසය කරන විවිධ ජන වර්ග අතර සමගිය සහ සහජීවනය තහවුරු කළ යුතු ය.

හේතුව - රටක වාසය කරන විවිධ ජන වර්ග අතර ඒකාබද්ධතාව හා සමගිය ඇති කිරීම එම රටේ සංවර්ධන කටයුතු සාර්ථක ව මෙහෙයවීමට අවශ්‍ය වේ.

ඒ පිළිබඳ ව දී ඇති වගන්ති අතුරින් නිවැරදි වගන්තිය තෝරන්න.

1. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය මනා ව පැහැදිලි කරයි
2. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය හොඳින් පැහැදිලි නොකරයි
3. ප්‍රකාශය හා හේතුව අතර කිසිම සම්බන්ධතාවක් නොමැත
4. ප්‍රකාශය හා හේතුව අසත්‍ය වේ (........)

15. පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A – සදාචාරාත්මක ආකල්ප හා මානුෂීය ගුණාංගවලින් යුක්තවීම.

B – ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබා ගැනීම.

C – අහිතකර සමාජ හා වාණිජ බලපෑම්වලින් ආරක්ෂාවීම.

D – යහපත් සෞඛ්‍යය පවත්වා ගැනීමේ සාක්ෂරතාව

ඒ අතුරින් 21 සියවස සඳහා අධ්‍යාපනයෙන් බිහි කරන පුද්ගලයකු තුළ දැකිය හැකි ලක්ෂණ පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | A, B | 2. | A, C |
| 3. | B, C | 4. | B, D |

(........)

16. පහත දැක්වෙන සමාජ විද්‍යාත්මක අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන්න.

- අන්තර් ක්‍රියා පැවතීම.
- පොදු අරමුණු හා අපේක්ෂා.
- සන්තතික බව.

ඒ අනුව එම ලක්ෂණවලින් නිරූපිත සමාජ විද්‍යාත්මක අවස්ථා අන්තර්ගත පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | සමාජ ස්ථරායනය | 2. | සමාජ සමූහ |
| 3. | සමාජ සචලනය | 4. | සමාජ පන්ති |

(........)

අ.පි.බ.

Rev Manikwela Siriwathana Thero

17. පහත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A – සමාජ පන්තිය උපතින් ලැබුව ද අධ්‍යාපනය මගින් වෙනස් කර ගත හැකි වේ.

B – ඉහළ ආදායම් ඇති රැකියාවක් ලබා ගැනීමෙන් සමාජ පන්තිය වෙනස් කර ගත හැකි වෙ.

C – පදිංචි ප්‍රදේශය මාරු කිරීමෙන් සමාජ පන්තිය වෙනස් කර ගත හැකි වෙ.

D – පෙළපත් නාමය වෙනස් කර ගැනීමෙන් සමාජ පන්තිය වෙනස් කර ගත හැකි වේ.

සමාජ පන්ති ක්‍රමය කුල ක්‍රමයට වඩා විවෘත ව පවතින බව නිරූපණය කරන සාධක පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A, B    2. A, C    3. B, C    4. B, D    (.......)

18. කිසියම් පාසලක් එහි ඉගෙනුම ලබන්නාගේ සාධන මට්ටම පිළිබඳ වැඩි අවධානයක් දැක්වුව ද ඔවුන් පෞරුෂ ගති, සමාජ කුසලතා වර්ධනය කර ගැනීමෙන් හදාවඩා ගැනීමට වැඩි අවධානයක් නොදක්වයි. මෙවැනි පාසලකින් නිරූපණය වන සංස්කෘතිය වන්නේ,

1. පවුල් සංස්කෘතිය යි    2. යාන්ත්‍රික සංස්කෘතිය යි

3. කැබරේ සංස්කෘතිය යි    4. සිර කඳවුරු සංස්කෘතිය යි    (........)

19. විදුහල්පති විසින් තම පාසලේ අවිධිමත් සමූහ නිරීක්ෂණය කර තොරතුරු ලබා දෙන ලෙස ගුරුවරුන්ගෙන් කරන ලද ඉල්ලීමට අනුව වැඩි දෙනකු ඉදිරිපත් කරන ලද නිගමන පහත දැක්වේ. ඒවා අතුරින් විදුහල්පති ලෙස වඩාත් ඵලදායී හා ප්‍රායෝගික නිගමනය ලෙස ඔබගේ තේරීම කුමක් ද?

1. පාසල තුළ අවිධිමත් සමූහ රැසක් ඇති බැවින් ඒවා වළක්වන නීතිරීති පැනවීම අත්‍යවශ්‍ය ය

2. අවිධිමත් සමූහ ඇතිවීම නොවැළැක්විය හැකි බැවින් පාසල් ක්‍රියාවලිය සඳහා ඒවා සහය කර ගැනීමේ වැඩපිළිවෙළක් අත්‍යවශ්‍ය ය

3. අවිධිමත් සමූහ රැසක් ඇති අතර පන්ති කාමරවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පමණක් ඒවා යොදා ගැනීම අත්‍යවශ්‍ය ය

4. පාසලේ අවිධිමත් සමූහවල සාමාජිකයන් නොවන අයට පමණක් ශිෂ්‍ය නායක පදවි ලබාදීමට වැඩපිළිවෙළක් අත්‍යවශ්‍ය ය    (........)

20. අතීතයේ සිට වර්තමානය දක්වා විවිධ සමාජයන්හි දක්නට ලැබෙන සමාජ ස්ථරායනයට අදාළ ව පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශය හා සම්බන්ධ සමාජ ස්ථරය "ආ" තීරුවෙන් තෝරා නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. ලබන අධ්‍යාපනයේ ස්වභාවය හා තත්ත්වය සමාජයෙන් තීරණය වේ. | A – වහල් ක්‍රමය |
| 2. වැඩ කළ ස්ථරය හා වැඩ ගත් ස්ථරය ලෙස ස්ථර වෙන් වී තිබේ. | B – කුල ක්‍රමය |
| 3. ස්ථර අතර පුද්ගලික සචලතා පවතී. | C – සමාජවාදී ක්‍රමය |
| 4. සමාන කෘත්‍යය ඉටු කරන පිරිස එක් සමාජ පන්තියක් ලෙස සැලකේ. | D – වැඩවසම් ක්‍රමය |
| | E – ධනවාදී ක්‍රමය |

1. B, A, D, E    2 B, A, E, D

3. C, A, D, E    4. C, A, B, E    (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)



Rev Manikwela Sirirathana Thera

4107

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0120/PE720 – අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම

**II කොටස**

"අ" සහ "ආ" යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**"අ" කොටස**

01. "අධ්‍යාපනය සහ දර්ශනය අතර අඛණ්ඩ මෙන් ම අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී." මෙම ප්‍රකාශය පිළිබඳ ව අවධානය යොමු කරමින්,

(i) අධ්‍යාපන දර්ශනය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) රටක අධ්‍යාපන ක්‍රියාවලිය සැකසීමේ දී අධ්‍යාපන දාර්ශනික චින්තා අදාළ කර ගත හැකි අවස්ථා **පහක්** දක්වන්න. (ලකුණු 05යි)

(iii) සාර්ථක ගුරුවරයකු ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවීමේ දී මහත්මා ගාන්ධිගේ දාර්ශනික චින්තාවන් උපයෝගී කර ගත හැකි අවස්ථා **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

02. "ජීන් ජැක්ස් රූසෝ 18 වැනි සියවසේ ප්‍රංශයේ දේශපාලන විප්ලවයකට මෙන් ම බටහිර ලෝකයේ අධ්‍යාපන විප්ලවයකට මඟ පෙන්වූ දාර්ශනිකයෙකි."

(i) රූසෝ නූතන ළමා මනෝවිද්‍යාවේ පියා ලෙස සැලකෙන්නේ ඇයි? (ලකුණු 03යි)

(ii) රූසෝගේ දර්ශනයට අනුව ළමයා ඉගෙනුම ලබන ප්‍රධාන මාධ්‍යයන් හා ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් අවස්ථා සම්පාදනය සඳහා රූසෝගේ දාර්ශනික චින්තා ගුරුවරයකුට යොදා ගත හැකි ආකාරය උදාහරණ **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

03. “මූලික මානව හිමිකමක් වශයෙන් අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ විධිමත් අධ්‍යාපනයට යි.” මේ පිළිබඳ ව අවධානය යොමු කරමින්,

(i) විධිමත් අධ්‍යාපනයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03යි)

(ii) විධිමත් අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීමට බැඳී සිටින පාසලට විරුද්ධ ව එල්ල වන විවේචන **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) සමාජ යහපැවැත්ම සහ සාරධර්ම සුරකින සමාජයක් ගොඩනැගීමෙහි ලා විධිමත් අධ්‍යාපනය සකස් විය යුතු ආකාරය ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

04. “ගුරුකම යනු එක ම දෙය එක ම විදියට ඉගැන්වීම නොවේ” යන කියමන සනාථ කිරීමට මා කෙසේ ක්‍රියා කළ යුතු ද? ගුරුවරයකුගේ දින පොතකින් උපුටා ගත් ඉහත ප්‍රකාශයට අනුව,

(i) ඵලදායී ගුරුවරයකු තුළ තිබිය යුතු ප්‍රධාන ගුණාංග **තුනක්** දක්වන්න. (ලකුණු 03යි)

(ii) ගුරු වෘත්තිය වෘත්තියක් ලෙස පිළිගැනීම සම්බන්ධයෙන් මතු ව ඇති ගැටලු **පහක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 05යි)

(iii) ඉහත ප්‍රකාශය කරන ලද ගුරුවරයාට ඵලදායී ගුරුවරයකු බවට පත්වීම සඳහා පාසල තුළ දී හා පාසලින් බැහැර දී අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතර** බැගින් යෝජනා කරන්න. (ලකුණු 08යි)

**“ආ” කොටස**

05. සමාජ සචලතාව රටක අධ්‍යාපනයට හිතකර මෙන් ම අහිතකර බලපෑම් ඇති කරයි.

(i) අධ්‍යාපන සාධකයට අමතර ව වර්තමානයේ සමාජ සචලනයට (Social Mobility) බලපෑනු ලබන හේතු **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) සමාජ සචලනයේ ප්‍රධාන ස්වරූප **දෙකක්** උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) 1945 සිට ක්‍රියාත්මක කන්නන්ගර යෝජනා ශ්‍රී ලංකාවේ සමාජ සචලනය ඇතිවීමට බලපා ඇති ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

06. “රටක් සංවර්ධනයේ දී පාසලින් ප්‍රජාවත්, ප්‍රජාවෙන් පාසලත් පෝෂණය වීම අත්‍යවශ්‍ය ය.” මේ පිළිබඳ ව අවධානය යොමු කරමින්,

(i) පාසල් ප්‍රජාව (School Community) යන්න හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) ප්‍රජා සම්බන්ධතා දුරස්ථ වූ පාසලක දැකිය හැකි ලක්ෂණ **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් හා ප්‍රජාව අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

07. "සඳුනි 3 වන ශ්‍රේණියේ ශිෂ්‍යාවකි. වසර දෙකක් පාසලේ ගත කළ ද තවමත් පන්තියේ අනෙක් සිසුන් සමඟ එක් ව වැඩ නොකරන ඇය, විවේකයේදී ද තනිව ම පන්තියේ රැඳී සිටීම පන්ති භාර ගුරුතුමියට විශාල ගැටලුවක් ව ඇත." මේ පිළිබඳ ව අවධානය යොමු කරමින්,

(i) ඉහත උන සමාජානුයෝගී ශිෂ්‍යාව සමාජගත කිරීමේ දී ගුරුවරිය ප්‍රථමයෙන් සොයා බැලිය යුතු පවුල ආශ්‍රිත කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03යි)

(ii) සමාජානුයෝජනයේ ප්‍රධාන අරමුණක් වන ක්‍රියාකාරී සාමාජිකයකුවීමෙහි ලා මෙම ශිෂ්‍යාවගේ හැසිරීම් ලක්ෂණ බාධාවක් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) මෙවැනි හැසිරීම් ලක්ෂණ ඇති සිසුන් සමාජගත කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ඔබ යොදා ගන්නා ක්‍රියාකාරකම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

08. "බහුවිධ සමාජයකට වඩාත් යෝග්‍ය වනුයේ බහු සංස්කෘතික අධ්‍යාපනයකි."

(i) බහු සංස්කෘතික අධ්‍යාපනය යනු කුමක් ද? (ලකුණු 03යි)

(ii) ශ්‍රී ලාංකික සමාජයට බහු සංස්කෘතික අධ්‍යාපනයක අවශ්‍යතාව සනාථ කිරීමට හේතු **පහක්** දක්වන්න. (ලකුණු 05යි)

(iii) බහු විධ සංස්කෘතිකයක් ඇති පාසලක සේවයේ නියුතු ගුරු භවතකු වශයෙන් ඔබ මුහුණ දෙන අභියෝග **දෙකක්** දක්වා, ඒවා ජය ගැනීමට ඔබ යොදා ගන්නා උපාය මාර්ග කවරේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

*********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]


ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016**
**නැවත පරීක්ෂණය - 2018**

| PE0120/PE720 | අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම<br>THEORY & PRINCIPLES OF EDUCATION |
|---|---|

2018.12.16 පැය 1300 - පැය1600 කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" සහ "ආ" යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:.............................................

**I කොටස**

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති තිත්ඉර සහිත වරහන තුළ ලියන්න.**

01. 'අධ්‍යාපනයේ බැංකු සංකල්පය හා උජාමා (Ujama) සංකල්පය' ඉදිරිපත් කළ දාර්ශනිකයින් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | පවුලෝ ප්‍රයරේ, කාල් මාර්ක්ස් | 2. | පවුලෝ ප්‍රයරේ, ජූලියස් නියරේරේ |
| 3. | කාල් මාර්ක්ස්, ජූලියස් නියරේරේ | 4. | කාල් මාර්ක්ස්, ජීන් ජැක්ස් රූසෝ (........) |

02. පහත දැක්වෙන කරුණුවලින් ප්‍රකාශ වන අංශය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

- නම්‍යශීලී වේ.
- නිෂ්පාදනයට සම්බන්ධ වේ.
- සම්පත් අඩුවෙන් වැය වේ.

| | | | |
|---|---|---|---|
| 1. | විධිමත් අධ්‍යාපනය | 2. | නොවිධිමත් අධ්‍යාපනය |
| 3. | අවිධිමත් අධ්‍යාපනය | 4. | සවිරාම අධ්‍යාපනය (........) |

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

03. පහත දැක්වෙන්නේ ජෝන් ඩුවී ඉදිරිපත් කළ අධ්‍යාපන දර්ශනයේ මූලික ලක්ෂණ කිහිපයකි. මින් අදාළ **නොවන** පිළිතුර තෝරන්න.

1. අධ්‍යාපනය යනු ජීවිතයට සූදානම්වීම නොව ජීවත්වීම යි.
2. කණ්ඩායම් වශයෙන් ඉගෙනීමට ව්‍යාපෘති ක්‍රමය සුදුසු වේ.
3. ඉගැන්වීමේ දී ගවේෂණ ක්‍රමය, ගැටලු විසඳීමේ ක්‍රමය සුදුසු වේ.
4. පුද්ගලයකුට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා පරිසරය, ද්‍රව්‍ය වැනි මාධ්‍යයන් ඇත. (........)

04. "මානව වර්ගයා කෙරේ ධනාත්මක ආකල්ප වර්ධනය අධ්‍යාපනය මගින් සිදුවිය යුතු බව හා අන්‍යොන්‍ය වෙනස්කම් ඉවසා සිටිය යුතු බවට අදාළ හුරුව පාසලේ සිට ලබාදිය යුතු ය."

ඉහත ප්‍රකාශය හා සම්බන්ධ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. ගැටුම් නිරාකරණය සඳහා අධ්‍යාපනය
2. ජාතික ඒකාග්‍රතාව සඳහා අධ්‍යාපනය
3. ගෝලීයකරණය සඳහා අධ්‍යාපනය
4. තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනය (........)

05. පහත දැක්වෙන්නේ පුවත්පතක පළ වූ ලිපියක් කියවා සාරාංශ කර ගත් කරුණු කිහිපයකි.

- සමාජයීය හා සංස්කෘතික වෙනස්කම් සමඟ අධ්‍යාපනයේ සබඳතාව හඳුනා ගැනීම.
- එක් එක් සමාජයට අවශ්‍ය සමාජ පද්ධතියක් ලෙස පාසල ගවේෂණය කිරීම.
- අධ්‍යාපන අරමුණුවල ප්‍රායෝගික බව විශ්ලේෂණය කිරීම.

මෙම කරුණු ඇතුළත් ලිපියට යෙදිය හැකි වඩාත් සුදුසු මාතෘකාව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සමාජ විද්‍යාවේ කාර්යභාරය
2. අධ්‍යාපන සමාජ විද්‍යාවේ කාර්යභාරය
3. පාසලක කාර්යභාරය
4. රටක අධ්‍යාපනයේ කාර්යභාරය (........)

06. පහත දැක්වෙන සමාජානුයෝගී කාරක ප්‍රබලතාව මත නිවැරදි ව පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.

1. පවුල, සම්ප කණ්ඩායම්, ජන සන්නිවේදන මාධ්‍ය, පොදු සංවිධාන
2. පවුල, ජන සන්නිවේදන මාධ්‍ය, සම්ප කණ්ඩායම්, පොදු සංවිධාන
3. සම්ප කණ්ඩායම්, පවුල, පොදු සංවිධාන, ජන සන්නිවේදන මාධ්‍ය
4. සම්ප කණ්ඩායම්, පොදු සංවිධාන, පවුල, ජන සන්නිවේදන මාධ්‍ය (........)

07. සම අධ්‍යාපන අවස්ථා ලබාදීමේ දී සමාජ පන්තියේ සම්බන්ධය .............................. යන අවස්ථා සමඟ සම්බන්ධ වන ආකාරය පරීක්ෂා කිරීම වැදගත් වේ.

ඉහත හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

1. සම්පත් බෙදී යාම හා අධ්‍යාපන උපයෝජනය
2. අධ්‍යාපනයට පිවිසීම හා මානව සම්පත් බහුලවීම
3. සම්පත් බෙදියාම සහ මානව සම්පත් බහුලවීම
4. අධ්‍යාපනයට පිවිසීම හා අධ්‍යාපන උපයෝජනය (........)

අ.පි.බ.

Rev Manikwela Siirathana Thero

08. පහත දැක්වෙන අධ්‍යාපන අරමුණු සම්බන්ධ වන අධ්‍යාපන ක්‍රමය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

- වාර්ගික කණ්ඩායම්වල අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරය හඳුනාගෙන ඒවා තුරන් කිරීමට යොමුවන ආකල්ප වර්ධනය.
- අධ්‍යාපන පද්ධතිය තුළ විවිධ වාර්ගික ළමුන්ගේ සුවිශේෂී අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත්වීම.

1. බහු සංස්කෘතික අධ්‍යාපනය 2. බහු වාර්ගික අධ්‍යාපනය

3. බහු ආගමික අධ්‍යාපනය 4. බහු භාෂා අධ්‍යාපනය (........)

09. පහත දැක්වෙන්නේ ගුරු ශිෂ්‍යයකු දේශනයකට සවන්දීමෙන් ලියා ගත් සටහනක ප්‍රධාන කරුණු ය.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති
- අධ්‍යාපනයේ විවිධාංගීකරණයක් හෝ ව්‍යුහමය වෙනසක් සිදු නොවීම
- පාසල් වැසීයාම

මෙම තේමාවලට අනුව දේශනයේ මාතෘකාවට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ස්වභාවය
2. අධ්‍යාපනය හා රාජ්‍ය ප්‍රතිපත්ති
3. අධ්‍යාපනයේ සමාජ සචලනයට ඇති බාධක
4. අධ්‍යාපනයේ සැබෑ මුහුණුවර හා ප්‍රතිසංස්කරණ (........)

10. පහත සඳහන් අධ්‍යාපන සංකල්ප හා පිළිවෙළින් ගැළපෙන ප්‍රකාශය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1) | ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය | A - | ගුරු-සිසු සබඳතා ඉහළ මට්ටමක තිබීම |
| (2) | ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය | B – | පුද්ගලයාගේ ස්වභාවයෙන් ම පිහිටන දක්ෂතා අනුව පුහුණු කිරීම |
| (3) | සමාජ කේන්ද්‍රීය අධ්‍යාපනය | C - | සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක විය |
| | | D - | අධ්‍යාපනය ආයෝජන කටයුත්තක් සේ සැලකීම |

1. ABC 2. ACD 3. CAB 4. CAD (........)

11. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් "ගුරු වෘත්තිකභාවය" වඩාත් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. උසස් වූ ගරුත්වයක් හා ආර්ථික ස්ථාවරත්වයක් හිමි වේ.
2. සාමාන්‍ය පුද්ගලයාට වඩා නිශ්චිත දැනුම් සම්භාරයක් ලබාගෙන තිබේ.
3. මහජන සේවය පිළිබඳ හැඟීමකින් යුක්ත ව රැකියාවට ජීවිතාන්තය දක්වා කැපවේ.
4. ශිෂ්‍යයින්ට ඉගැන්වීමේ කාර්යයට පිවිසීමත් සමඟ වෘත්තීක ස්වභාවය ඇරඹේ. (........)

12. අවිධිමත් සමූහ කණ්ඩායම්වල දැකිය හැකි ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ස්වේච්ඡාවෙන් පැන නැගීම, නිශ්චිත අරමුණු තිබීම, පෞද්ගලික සබඳතා තිබීම
2. බල අධිකාරිය පිළිබඳ ධූරාවලිය, නිශ්චිත අරමුණු තිබීම, ස්වේච්ඡාවෙන් පැන නැගීම
3. පෞද්ගලික සබඳතා තිබීම, ස්වේච්ඡාවෙන් පැන නැගීම, සාමාජිකයන්ට නිදහසේ කටයුතු කළ හැකි වීම, ආබාධ පිවිසුමක් හෝ පිටවුමක් තිබීම
4. නිශ්චිත අරමුණු තිබීම, බල අධිකාරිය පිළිබඳ ධූරාවලිය, ස්වේච්ඡාවෙන් පැන නැගීම, පෞද්ගලික අරමුණු තිබීම (........)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

13. අධ්‍යාපනයේ පාරිභෝගික ලක්ෂණයක් හා අධ්‍යාපනයේ ආයෝජන ලක්ෂණයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. පුද්ගල ආශාවන්ට මුල්තැන දීම, වෘත්තිය කේන්ද්‍ර වීම
2. කලා විෂයන් ගැන සැලකිලිමත් වීම, බුද්ධිමය කුසලතා සැලකීම
3. ව්‍යවහාරික විද්‍යා ගැන වැඩි අවධානය, ප්‍රායෝගික පුහුණුව පිළිබඳ සැලකීම
4. සමාජ සේවය පිළිබඳ වැඩි අවධානය, පෞද්ගලික අධ්‍යාපනයට වැඩි නැඹුරුව (........)

14. 'සමාජ ස්තරායනය' පිළිබඳ ව නිවැරදි ව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1. සමාජ ස්තරයට අනුව පුද්ගලයාගේ අධ්‍යාපන අවස්ථා තීරණය කිරීම
2. විවෘත සමාජවල ඉහළ ස්තරය නියෝජනය කරන්නන්ට පමණක් සීමා වූ අධ්‍යාපනය පැවතිණි.
3. ආවෘත සමාජවල දෙමාපියන්ගේ ආර්ථික ශක්තිය අනුව අධ්‍යාපන ප්‍රාප්තියේ විෂමතා තීරණය වේ.
4. අධ්‍යාපනය හා සමාජ ස්ථර යන විචල්‍යයන්ගේ එකිනෙක බලපෑමෙන් අන්‍යෝන්‍ය සම්බන්ධයක් ප්‍රදර්ශනය විය හැකි ය. (........)

15. "එක්තරා පාසලක ගුරු මේස හිඟයක් පවතින බව පාසල් සංවර්ධන රැස්වීමේ දී ප්‍රකාශ කළ විට දෙමව්පියන් මුදල් එකතු කර පාසලට ගුරු මේස දෙකක් සාදා පරිත්‍යාග කරන ලදී."
මෙම සිදුවීමට අනුව පාසලක ප්‍රජාව අතර විවෘත සබඳතාව නිවැරදි ව පැහැදිලි කරන පිළිතුර තෝරන්න.

1. පාසල ප්‍රජාවේ නියෝජනයකි.
2. පාසල ප්‍රජාවේ අවයවයකි.
3. පාසල හා ප්‍රජාව අතර මනා සබඳතාවක් පවතී.
4. ප්‍රජාව හා පාසල එක් ආයතනයක් සේ සැලකේ. (........)

16. පහත සඳහන් අධ්‍යාපන අරමුණු සහිත දර්ශනයන් ඉදිරිපත් කළ දාර්ශනිකයින් දී ඇති පිළිතුරු අතුරින් තෝරන්න.

- අධ්‍යාපනය තුළින් ස්වයං හැකියාව ලැබිය යුතු ය.
- අධ්‍යාපනය මව්බසින් දිය යුතු ය.
- අධ්‍යාපනය බලහත්කාරයෙන් නොදිය යුතු ය.

1. රවින්ද්‍රනාත් තාගෝර්  2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර
3. මහත්මා ගාන්ධි  4. ජේ.ඩී. ක්‍රිෂ්ණමූර්ති (........)

17. අධ්‍යාපනයේ නව ප්‍රවණතා විමර්ශනය කළ හැකි අංශ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. විෂයමාලාව, ගුරු කාර්යභාරය, ජාතික හා ගෝලීය අවශ්‍යතා
2. විෂයමාලාව, පාසල් ප්‍රජාව, ගුරු කාර්යයන්
3. පාසල් ප්‍රජාව, ජාතික හා ගෝලීය අවශ්‍යතා, නියාමනය හා ඇගයීම
4. පාසල් ප්‍රජාව, නියාමනය හා ඇගයීම, විෂයමාලාව (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

18. එක් පාසලක සංස්කෘතිය තවත් පාසලක සංස්කෘතියෙන් වෙන් කර හඳුනා ගැනීමට උදව් වන සාධක පමණක් ඇති පිළිතුර තෝරන්න.

1. පාසල් සම්ප්‍රදාය, සාමාජික සංඛ්‍යාව  2. සන්නිවේදන රටා, මානව සම්පත්
3. ආකල්ප හා ප්‍රතිමාන, භෞතික සම්පත්  4. ආවේණික සිරිත් විරිත්, විවිධ ගැටුම් (........)

19. ගුරු භූමිකාවේ ඇතිවන ගැටුම්වලට අදාළ ව "අ" තීරුවේ ගැටුම් වර්ගය විස්තර කරන ප්‍රකාශය "ආ" තීරුවෙන් තෝරා පිළිතුර ලියන්න.

| "අ" | "ආ" |
|---|---|
| (1) භූමිකා පෞරුෂ ගැටුම් | A – භූමිකා දෙකක් හෝ වැඩි ගණනක් දැරීම නිසා ඇති වේ. |
| (2) භූමිකා අන්තර ගැටුම් | B – පුද්ගලයාට දැරීමට සිදුවන භූමිකාවන් ස්වියත් ව ලක්ෂණ අතර විෂමතා නිසා ඇති වේ. |
| (3) භූමිකා ගැටුම් | C – භූමිකාව දරන්නා තුළ ඇති අවශ්‍යතා හා විෂමතා අතර ප්‍රතිවිරුද්ධතා නිසා ඇති වේ. |
| (4) පෞරුෂ ගැටුම් | D – එකිනෙක පරස්පර භූමිකා කිහිපයක එකවිට කටයුතු කිරීම නිසා ඇති වේ. |

1. BADC  2. BACD  3. CBAD  4. CBDA (........)

20. පහත දැක්වෙන සමාජ ප්‍රාග්ධනය හා සම්බන්ධ හේතුව හා ප්‍රකාශය සලකා බලන්න.

**ප්‍රකාශය** - දරුවකුගේ අධ්‍යාපන සංවර්ධනයට සමාජ ප්‍රාග්ධනය විශාල බලපෑමක් එල්ල කරයි.

**හේතුව** - දෙමව්පියන්ගේ සමාජ ප්‍රාග්ධනය දරුවකුට හුවමාරුවීම සඳහා දෙමව්පියන් හා දරුවන් අතර මනා සබඳතාවක් තිබිය යුතු ය.

1. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය මනාව පැහැදිලි කරයි.
2. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය මනාව පැහැදිලි නොකරයි.
3. ප්‍රකාශය හා හේතුව අතර කිසිම සබඳතාවක් නොමැත.
4. ප්‍රකාශය හා හේතුව අසත්‍ය වේ. (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev Manikwela Siriwathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0120/PE720 – අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම

### II කොටස

"අ" සහ "ආ" යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### "අ" කොටස

01. (i) රටක අධ්‍යාපන පරමාර්ථ ගොඩනැගීමේ දී දායක කර ගතයුතු මූලාශ්‍ර **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව සුදුසු උදාහරණ **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) "ශ්‍රී ලාංකිකයකු බිහි කිරීම සඳහා ජාතික අධ්‍යාපන අරමුණුවල දායකත්වය" මැයෙන් පුවත්පතකට ලිපියක් ලියන්න. (ලකුණු 08)

02. (i) ප්ලේටෝගේ අධ්‍යාපන දාර්ශනික අදහස්වලට පසුබිම් වූ කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනයේ සුලභ ලක්ෂණ **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ප්ලේටෝගේ අධ්‍යාපන දාර්ශනික අදහස් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා බලපෑම් කර ඇති ආකාරය උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) 'යාවජීව අධ්‍යාපනය' යන්න හඳුන්වන්න. (ලකුණු 03)

(ii) යාවජීව අධ්‍යාපනයේ අරමුණු **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) "ඉගෙනුම් සමාජයක මුල්ගල යාවජීව අධ්‍යාපනය වේ." මෙම අදහස සුදුසු උදාහරණ **තුනකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

04. (i) අධ්‍යාපන සංකල්පයක් ලෙස "විශිෂ්ටතාව" (Excellence) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) විශිෂ්ටත්වය සඳහා අධ්‍යාපනයේ පවතින ගැටලු **දෙකක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

**"ආ" කොටස**

05. (i) සමාජානුයෝජනය සඳහා පාසලේ දී ගුරුවරයකුට කළ හැකි කාර්ය **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) පාසලක සමාජානුයෝගී ක්‍රියාවලිය සජීවී ලෙස ක්‍රියාත්මක වීමට බලපාන සාධක **දෙකක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) සමාජානුයෝගී ක්‍රියාවලියේ දී පාසලක දැකිය හැකි ගැටලු **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. (i) සංස්කෘතිය පවරා දීම සඳහා පාසලකට භාවිත කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) ඉහත (i) හි දී ඔබ සඳහන් කළ එක් ක්‍රියාමාර්ගයක් ඇසුරින් පාසලකින් සංස්කෘතිය පවරා දෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පාසලකින් සංස්කෘතිය පවරාදීමේ දී ගුරුවරයාගේ ක්‍රියාකලාපය කෙසේ විය යුතු දැ'යි උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. (i) ප්‍රජාව යන්න නිවැරදි ව හඳුනා ගැනීමට බලපාන සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) පාසල් ප්‍රජා සබඳතාවේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ප්‍රජාවේ සංවර්ධනය සඳහා පාසලට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. (i) ගුරුවරයාගේ භූමිකාව තීරණය කරන සමාජයීය සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) ගුරු භූමිකාව හා සම්බන්ධ වගකීම් **දෙකක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඵලදායී ගුරු භූමිකාවක නිරතවීම සඳහා ගුරුවරයා සපුරා ගත යුතු යුතුකම් **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

********

Rev Mankuwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

4106

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
අවසාන පරීක්ෂණය 2017

PE0130/PE730

තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ගැටලු
COMPARATIVE EDUCATION & CONTEMPORARY ISSUES IN EDUCATION

2017.03.19 | පැය 1300 - පැය1600 | කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:..............................................

**I කොටස**

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. විවිධ රටවල් ඉතිහාසය, දර්ශනය, භූගෝලීය තත්ත්වය යන කරුණු සම්මිශ්‍රණය කරමින් තුලනාත්මක ව අධ්‍යයනය කිරීම සිදු කරයි. මෙය හැඳින්වීමට වඩාත් සුදුසු ප්‍රවේශය තෝරන්න.
    1. විද්‍යාත්මක ප්‍රවේශය 2. විස්තරාත්මක ප්‍රවේශය
    3. සමෝධානිත ප්‍රවේශය 4. දාර්ශනික ප්‍රවේශය (..........)

02. තුලනාත්මක අධ්‍යාපනය පියවර හතරකින් සිදු කළ හැකි ය. එය අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
    1. විස්තර කිරීම, අර්ථකථනය, සීහුම් කිරීම, සැසඳීම
    2. අර්ථකථනය, සීහුම් කිරීම, විස්තර කිරීම, සැසඳීම
    3. සැසඳීම, අර්ථකථනය, සීහුම් කිරීම, විස්තර කිරීම
    4. සීහුම් කිරීම, සැසඳීම, අර්ථකථනය, විස්තර කිරීම (..........)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

03. ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලනය සම්බන්ධ ව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

1. අනිවාර්ය අධ්‍යාපනය වඩා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම
2. විෂයමාලාව පටු වූවා මෙන් ම ප්‍රායෝගික ද නොවීම
3. විධිමත් පාසල පරිපාලන දාමයට ඇතුළත්වීම
4. ද්විතීයික අධ්‍යාපනයට වැඩි අවධානයක් යොමුවීම (..........)

04. ලන්දේසි අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණක් වූයේ පහත සඳහන් අරමුණු අතුරින් කවරක් ද?

1. ස්වදේශිකයන් රෝමානු කතෝලික ආගමට හරවා ගැනීම
2. ආගම පැතිරවීමට අවශ්‍ය ගුරුවරුන් මව්බසින් පුහුණු කිරීම
3. වෙළෙඳාමට ලැබෙන සහය වර්ධනය කර ගැනීම
4. රෝමානු කතෝලික ආගමට බැඳි අයට සාක්ෂරතාව ලබා දීම (..........)

05. 1939 අංක 31 දරන ආඥා පනතට අනුව,

1. මධ්‍ය විද්‍යාල සංකල්පය බිහි විය
2. අධ්‍යාපන දිස්ත්‍රික් කමිටු අඩු විය
3. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය බිහි විය
4. දේශීය විභාග ක්‍රමයක් ආරම්භ විය (..........)

06. පාසල් දිවා ආහාරය ලබා දීම ආරම්භ කරන ලද්දේ,

1. 1931-1938 මූලික අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මගිනි
2. 1939-1947 ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගිනි
3. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගිනි
4. 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගිනි (..........)

07. 1943 අධ්‍යාපන විශේෂ කාරක සභා වාර්තාවට අනුව හඳුන්වා දුන් ප්‍රබල කරුණක් වන්නේ,

1. ද්විතීයික පාසල ප්‍රායෝගික පාසල වීම
2. විශ්වවිද්‍යාල සඳහා බැංකු ණය ලබා දීම
3. මධ්‍ය පාලක මණ්ඩලයක් පිහිටුවීම
4. ආගම ඉගැන්වීම අනිවාර්ය වීම (..........)

08. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව පහත සඳහන් ප්‍රකාශවලින් කුමන ප්‍රකාශය වඩාත් සත්‍ය වේද?

1. ප්‍රාග්වෘත්තීය විෂයයන් නිසා වෘත්තීය අධ්‍යාපනයක් සිදු විය
2. දේශයේ භෞතික හා මානව සම්පත් පිළිබඳ අවබෝධය වැඩි විය
3. රටේ ඌන සේවා වියුක්තියට පිළියමක් විය
4. සිසුන්ගේ තර්කානුකූල චින්තනය වැඩි දියුණු විය (..........)

09. 1981 ධවල පත්‍රිකාවට අනුව ගුරු සේවයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ගත් පියවරකි,

1. දිස්ත්‍රික්ක ගුරු සේවාවක් පිහිටුවීම
2. උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම
3. ආධුනික ගුරු තනතුර ස්ථාපිත කිරීම
4. අඩු ආදායම්ලාභී උගතුන්ට ගුරු පත්වීම් දීම (..........)

10. ජාතික පොදු අරමුණු නවයක් හා මූලික නිපුණතා පහක් හඳුන්වා දෙන ලද්දේ,

1. 1966 ධවල පත්‍රිකාවෙනි 2. 1972 ප්‍රතිසංස්කරණවලිනි
3. 1981 ධවල පත්‍රිකාවෙනි 4. 1997 ප්‍රතිසංස්කරණවලිනි (..........)

අ.පි.බ.

Rev. Manikwela Suwathana Thero

11. අධ්‍යාපනය හා රැක්යා ලෝකය අතර මනා සබඳතාවක ගොඩනැගෙනනෙ,

1. සම්පදස්ථ අධ්‍යාපනය තුළිනි
2. නිපුණතා පාදක අධ්‍යාපනය තුළිනි
3. විෂය පාදක අධ්‍යාපනය තුළිනි
4. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය තුළිනි (..............)

12. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාධන මට්ටම මැන බැලීම සඳහා පහත ක්‍රමයන් භාවිත කෙරේ. ඒ අනුව පිළිවෙලින් ප්‍රාථමික හා ද්විතීයික අංශ නියෝජනය වන ක්‍රම කවරේ ද?

A – පාසල් පාදක ඇගයීම, තක්සේරුකරණය

B – වාර පරීක්ෂණ, පාසල් පාදක ඇගයීම

C - තක්සේරුකරණය, පාසල් පාදක ඇගයීම

D – කාර්ය සාධන ඉගෙනුම, තක්සේරුකරණය

1. A ය 2. B ය 3. C ය 4. D ය (..............)

13. විශ්ව ගැටලු විසඳාලීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන වැඩසටහනෙහි ඉලක්කයක් වූයේ,

1. දිළිඳු බව සහ සාගින්න අවම කිරීම ය
2. විශ්ව ප්‍රාථමික අධ්‍යාපනය සාධනය කිරීම ය
3. ළදරු ආහාර නිෂ්පාදනය වැඩි කිරීම ය
4. ළදරු මරණ සංඛ්‍යාව අඩු කිරීම ය (..............)

14. එක්සත් රාජධානියේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධ ව පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වයස අවුරුදු 5න් ආරම්භ වී අවුරුදු 11 දක්වා ක්‍රියාත්මක වේ
2. වයස අවුරුදු 5න් ආරම්භ වී අවුරුදු 12 දක්වා ක්‍රියාත්මක වේ
3. වයස අවුරුදු 6න් ආරම්භ වී අවුරුදු 12 දක්වා ක්‍රියාත්මක වේ
4. වයස අවුරුදු 6න් ආරම්භ වී අවුරුදු 11 දක්වා ක්‍රියාත්මක වේ (..............)

15. ජපානය ගුරුවරුන් සම්බන්ධයෙන් ගෙන ඇති ප්‍රතිපත්තියකි,

1. පත්වීම් ලැබීමෙන් පසු සියලු ගුරුවරුන් උපාධිධාරීන් විය යුතු වීම
2. පත්වීම් ලැබ වසර 3ක් ඇතුළත උපාධිධාරීන් විය යුතු වීම
3. ආරම්භක ගුරුවරුන් වර්ෂයක සේවාස්ථ පුහුණුව ලැබිය යුතු වීම
4. පුහුණු උපාධිධාරීන් ලෙසට පන්ති කාමරයට යා යුතු වීම (..............)

16. නවසීලන්තයේ ක්‍රියාත්මක වන නිවාස පාසල් ක්‍රමය සම්බන්ධ ව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ලියාපදිංචි පාසලක දී ලබා දෙන අධ්‍යාපනය ම ශිෂ්‍යයාට ලැබිය යුතු ය
2. නිවාස පාසල්හි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ප්‍රතිශතය 10% ට ඉහළ ය
3. නිවාස පාසල්වලට රජයේ මූල්‍ය ප්‍රතිපාදන නොලැබේ
4. තැපැල් මාර්ගික පාසල් සේවා සමඟ නිවාස පාසල් සම්බන්ධ නොවේ (..............)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

17. ශ්‍රී ලංකාවේ පාසල් යා යුතු වයසේ දරුවන්ගේ පාසල් පැමිණීම හා පාසල හැරයාම සම්බන්ධ ව පර්යේෂණ අනාවරණ කිහිපයක් පහත දැක්වේ.

A – පාසල් අධ්‍යාපනය නොලැබූ සංඛ්‍යාව, පිරිමි ළමයින්ට වඩා ගැහැණු ළමයින් සංඛ්‍යාව වැඩි ය.

B – පාසලෙන් ගිලිහෙන ළමුන්ගෙන් වැඩි සංඛ්‍යාව පිරිමි ළමුන් ය.

C – පාසල් අධ්‍යාපනය නොලබන ළමයින්ගෙන් වැඩි ප්‍රතිශතය සිංහල මාධ්‍ය ළමුන් ය.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි හා පිළිගත හැකි ප්‍රකාශය වන්නේ මින් කවරක් ද?

1. A, B හා C ය
2. A හා B පමණි
3. B හා C පමණි
4. A හා C පමණි (..........)

18. 2008 දී පිහිටුවනු ලැබූ ගුරුවරුන් සඳහා වන ජාත්‍යන්තර කාර්ය සාධන බලකාය මගින් අපේක්ෂා කරන ලද්දේ,

1. ජාත්‍යන්තර ප්‍රයත්න සම්බන්ධීකරණය කිරීම ය
2. නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම ය
3. ගුරුවරුන් සඳහා සේවාස්ථ සැසි පැවැත්වීම ය
4. ගුරුවරුන්ගේ තත්ත්වය උසස් කිරීම ය (..........)

19. රටකට "දැනුම් ආර්ථිකය" හා සහභාගී වීමට සපුරා ගත යුතු වැදගත් ම කරුණ වන්නේ,

1. මූල්‍ය ආයෝජන වැඩි දියුණු කිරීම ය
2. අධ්‍යාපනය සහ පුහුණුව සඳහා දැඩි අවධානයක් දීම ය
3. භෞතික හා මානව සම්පත් දියුණු කිරීම ය
4. යන්ත්‍රසූත්‍ර හා පරිගණක නවීකරණය කිරීම ය (..........)

20. "ගෝලීයකරණයේ දී ශ්‍රී ලංකාවට අධ්‍යාපනය සම්බන්ධ ව අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදු වේ." මෙම තත්ත්වයෙන් මුදවා ගැනීමට ගත යුතු වැදගත් ම පියවර මින් කුමක් ද?

1. සිසුන් තුළ ඉගෙනීම කෙරෙහි ධන ආකල්ප මතු කිරීම
2. දැනුම වර්ධනය කර ගැනීම සඳහා අවස්ථා සැපයීම
3. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වැඩි කරලීම
4. ජීවිතය පුරා ම ඉගෙනීමට හා අත්හදා බැලීමට අවස්ථා සැපයීම (..........)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

Rev Manikwela Sirivathana Thero

4106

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය தேசிய கல்வி நிறுவகம் National Institute of Education
ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0130/PE730 - තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ගැටලු

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. මහින්දාගමනය, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනස් මගකට අවතීර්ණ කිරීමට මග පාදන්නක් විය.

(i) මහින්දාගමනයට සමගාමී ව අධ්‍යාපනයේ ප්‍රබල මෙහෙවරක් ඉටු කළ අධ්‍යාපන ආයතන **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) එම අධ්‍යාපන ආයතන මගින් පුද්ගල සංවර්ධනය සඳහා මුල්කර ගත් අරමුණු **පහක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) ඉන් **එක්** අරමුණක් නම් කර, වර්තමාන අධ්‍යාපන ක්‍රමයකින් පුද්ගල සංවර්ධනය සඳහා එය භාවිත කළ හැකි ආකාරය උදාහරණ සහිත ව විමර්ශනය කරන්න. (ලකුණු 08යි)

02. යටත් විජිත යුගයේ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයට සිදු වූ බලපෑම් පසුකාලීන සමාජ කාර්යයන් සඳහා ද බලපා ඇත.

(i) ලන්දේසි යුගයේ අධ්‍යාපන අරමුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔවුන් ගත් ක්‍රියාමාර්ග සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) ලන්දේසි පාලනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකීය විවිධ ක්ෂේත්‍රවලට එල්ල වූ බලපෑම් උදාහරණ සහිත ව විභාග කරන්න. (ලකුණු 08 යි)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

03. ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ ස්වර්ණමය යුගයක් ලෙස කන්නන්ගර යුගය හඳුන්වනු ලබයි.

(i) 1931-1938 සුළු ප්‍රතිසංස්කරණ යුගයේ දී සිදු වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03යි)

(ii) ඉන් **එක්** යෝජනාවක් තෝරා ගෙන එය ක්‍රියාත්මක කිරීමෙන් ලබා ගත හැකි වාසි මොනවා දැ'යි පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

(iii) ඔබ තෝරා ගත් ප්‍රතිසංස්කරණ යෝජනාව, වර්තමාන අධ්‍යාපන සංකල්ප හා සම්බන්ධ ව ක්‍රියාත්මක වන ආකාරය නිදසුන් දෙමින් විග්‍රහ කරන්න. (ලකුණු 08යි)

04. ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් විධිමත් අධ්‍යාපනයේ තීරණාත්මක වෙනස්කම් සිදු වී ඇත.

(i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) කණිෂ්ඨ ද්විතීයික අංශයේ විෂයමාලාවට එකතු කළ ප්‍රාග්වෘත්තීය I හා II යන විෂයයන්හි ස්වභාවය හා අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාවලියට 1972 ප්‍රතිසංස්කරණවලින් ගත හැකි ආදර්ශයන් උදාහරණ සහිත ව විග්‍රහ කරන්න. (ලකුණු 08යි)

05. ජනාධිපති කාර්ය සාධන බලකාය මෙන් ම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යයන අනාවරණ ද 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලසුම් කිරීම සඳහා බලපාන ලදී.

(i) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා බලපෑ හේතු **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) එම ප්‍රතිසංස්කරණවලට අදාළ ව ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලක්ෂණ **තුනක්** ද ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලක්ෂණ **දෙකක්** ද කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05යි)

(iii) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වූ ගැටලු ඉදිරිපත් කර, එම ගැටලු අවම කර ගැනීමට යෙදූ උපාය මාර්ග විමර්ශනය කරන්න. (ලකුණු 08යි)

06. ලෝකයේ සංවර්ධිත රටවල අධ්‍යාපන ක්‍රමවලින් සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපන ක්‍රමයක් සැලසුම් කිරීමට ගත හැකි ආදර්ශයන් බොහෝ ය.

(i) නවසීලන්ත අධ්‍යාපන ක්‍රමයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික වශයෙන් ගුණාත්මක සංවර්ධනයක් සඳහා නවසීලන්ත අධ්‍යාපන ක්‍රමයෙන් ගත හැකි ආදර්ශ **තුනක්** උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) නවසීලන්ත අධ්‍යාපන ක්‍රමයෙහි කැපී පෙනෙන ලක්ෂණ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළහොත් ඇති විය හැකි අභියෝග හා එම අභියෝග ජය ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විමර්ශනය කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

07. සමාජ ප්‍රාග්ධන සංකල්පය මෑතක සිට අවධානයට යොමු වී ඇති වැදගත් කරුණකි.

(i) සමාජ ප්‍රාග්ධනය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(ii) සමාජ ප්‍රාග්ධන වර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රාග්ධනයේ කාර්යක්ෂමතාව සම්බන්ධ ව පවතින ගැටලු, අභියෝග විමර්ශනයට භාජන කරන්න. (ලකුණු 08යි)

08. පහත සඳහන් මාතෘකාවලින් හතරක් ශ්‍රී ලංකාව ආශ්‍රය කොටගෙන කෙටි සටහන් ලියන්න.

(i) සහශ්‍ර සංවර්ධන ඉලක්ක

(ii) ගෝලීයකරණය

(iii) අධ්‍යාපන නාස්තිය

(iv) අධ්‍යාපනයේ නව ප්‍රවණතා

(v) ඉලෙක්ට්‍රොනික ඉගෙනීම (e-Learning)

(vi) තිරසර සංවර්ධනය

(vii) සාරධර්ම ඉගැන්වීම

(ලකුණු 04 x 4 = ලකුණු 16යි)

********

Rev. Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018

| | |
|---|---|
| PE0130/PE730 | තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ගැටලු<br>COMPARATIVE EDUCATION & CONTEMPORARY ISSUES IN EDUCATION |

2018.12.28 පැය 1300 - පැය 1600 කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:...............................................

### I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධකවලින් ජාතිය හා ආගම අයත් වන්නේ,
    1. සමාජ සාධකයට ය. 2. සංස්කෘතික සාධකයට ය.
    3. දේශපාලන සාධකයට ය. 4. ආර්ථික සාධකයට ය. (...........)

02. මහින්දාගමනයට පසු අධ්‍යාපනයේ ගුරුවරුන් ලෙස සලකන ලද්දේ,
    1. බ්‍රාහ්මණයන් ය. 2. ජෛනාගමිකයන් ය.
    3. භික්ෂූන් වහන්සේලා ය. 4. ගිහි පණ්ඩිතවරුන් ය. (...........)

03. ඉගැන්වීමේ දී ප්‍රශ්නෝත්තර ක්‍රමය ආරම්භ කළ චින්තකයා කවුද?
    1. සොක්‍රටීස් ය. 2. ඇරිස්ටෝටල් ය.
    3. ප්ලේටෝ ය. 4. හිපෝක්‍රටීස් ය. (...........)

අ.පි.බ.

Rev. Manikwela Suwathana Thero

04. බටහිර සංස්කෘතිය මෙරට ව්‍යාප්ත කරන ලද්දේ,

1. පෘතුගීසි ජාතිකයන් ය. 2. ලන්දේසි ජාතිකයන් ය.

3. බ්‍රිතාන්‍ය ජාතිකයන් ය. 4. ප්‍රංශ ජාතිකයන් ය. (..............)

05. විදේශීය ශිෂ්‍යත්ව ලබාදීම අරඹන ලද්දේ,

1. පෘතුගීසි යුගයේ දී ය. 2. ලන්දේසි යුගයේ දී ය.

3. ඉංග්‍රීසි යුගයේ දී ය. 4. කන්නන්ගර යුගයේ දී ය. (..............)

06. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගය ලෙස හඳුන්වන්නේ,

1. විජයාවතරණ යුගය යි. 2. මහින්දාගමන යුගය යි.

3. විදේශීය ආක්‍රමණ යුගය යි. 4. කන්නන්ගර යුගය යි. (..............)

07. වයස අවුරුදු 6-14 සීමාවේ සෑම ළමයකුට ම අධ්‍යාපනය අනිවාර්ය කරන ලද්දේ,

1. 1943 කන්නන්ගර යෝජනා වලිනි. 2. 1950 ධවල පත්‍රිකාවෙනි.

3. 1961 ප්‍රතිසංස්කරණ වලිනි. 4. 1964 ධවල පත්‍රිකාවෙනි. (..............)

08. ඉංග්‍රීසි ඉගැන්වීම තෙවන ශ්‍රේණියේ සිට අරඹන ලද්දේ,

1. 1945 ධවල පත්‍රිකාවට අනුව ය. 2. 1964 ධවල පත්‍රිකාවට අනුව ය.

3. 1966 ධවල පත්‍රිකාවට අනුව ය. 4. 1981 ධවල පත්‍රිකාවට අනුව ය. (..............)

09. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව,

1. අ.පො.ස. (සා.පෙළ) හඳුන්වා දෙනු ලැබිණ.
2. අ.පො.ස. (උ.පෙළ) හඳුන්වා දෙනු ලැබිණ.
3. ශිෂ්‍යත්ව විභාගය හඳුන්වා දෙනු ලැබිණ.
4. N.C.G.E. විභාගය හඳුන්වා දෙනු ලැබිණ. (..............)

10. 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණක් **නොවන්නේ**,

1. අධ්‍යාපනය යාවජීව ක්‍රියාවලියක් බවට පත් කිරීම ය.
2. සුසංගත පෞරුෂයක් ගොඩනැගීම ය.
3. උගත් පුරවැසියන් බිහි කිරීම ය.
4. ක්‍රියාවෙන් අවබෝධය හඳුන්වා දීම ය. (..............)

11. * සැලසුම් සහගත සෙල්ලම් සහ විනෝද ක්‍රීඩා
* ක්‍රියාකාරකම්
* අසුන්ගත වැඩ

ඇසුරින් ක්‍රියාත්මක පාසල් ව්‍යුහයක් ප්‍රාථමික අංශයට හඳුන්වා දෙන ලද්දේ,

1. 1992 දී ය. 2. 1981 දී ය.

3. 1997 දී ය. 4. 2007 දී ය. (..............)

12. නිර්ණායක පදනම් කරගත් තක්සේරුකරණය හා පාසල් පාදක ඇගයීම ක්‍රියාත්මක වන අංශ අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ද්විතීයික අංශය, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය
2. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය, කණිෂ්ඨ ද්විතීයික අංශය
3. ප්‍රාථමික අංශය, ද්විතීයික අංශය
4. ද්විතීයක අංශය, ප්‍රාථමික අංශය (..............)

Rev Manikwela Sirirathana Thero

13. අධ්‍යාපනයේ පොදු අරමුණු 8ක් හා මූලික නිපුණතා 04ක් හඳුන්වා දෙන ලද්දේ,

1. 1992 දී ය. 2. 2007 දී ය.

3. 2016 දී ය. 4. 2017 දී ය. (..........)

14. පරිණාමන ගුරු භූමිකාව ක්‍රියාත්මක කිරීමේ දී,

1. ගුරුවරයා පමණක් සක්‍රිය ව කටයුතු කරයි.
2. ශිෂ්‍යයා පමණක් සක්‍රිය ව කටයුතු කරයි.
3. කණ්ඩායම් පමණක් සක්‍රිය ව කටයුතු කරයි.
4. ඉහත සියලු දෙනා සක්‍රිය ව කටයුතු කරයි. (..........)

15. වර්තමානයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට ප්‍රමුඛත්වයක් ලබා දී ඇත්තේ,

1. බටහිර ජාතීන් මෙරටට හඳුන්වා දුන් භාෂාවක් වන නිසා
2. සමාජයේ ඉහළ පිළිගැනීමක් ලැබෙන භාෂාවක් වන නිසා
3. ජාත්‍යන්තර කටයුතුවල දී වඩාත් භාවිත වන භාෂාවක් වන නිසා
4. සියලු දෙනාට පහසුවෙන් ඉගෙන ගත හැකි භාෂාවක් වන නිසා (..........)

16. කලට වේලාවට වැඩ කිරීම ප්‍රාථමික පාසල් අවධියේ සිට සිසුන්ට ඉගැන්වීමට යොමු වූ රට,

1. චීනය 2. ඉන්දියාව

3. තායිලන්තය 4. ජපානය (..........)

17. එක්සත් රාජධානියේ අධ්‍යාපනයෙහි විශේෂ ලක්ෂණයකි,

1. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් දීම
2. වැඩිහිටි ජනතාවට සතුට ලබා දීම
3. ජීවන තත්ත්වය පහළ යාම වළක්වා ගැනීම
4. හැකි ඉක්මනින් ජනතාවට සාක්ෂරභාවය ලබා දීම (..........)

18. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනයේ දී විශේෂ අවධානයක් යොමු කර ඇත්තේ,

1. සාක්ෂරභාවය ඉහළ නංවා ගැනීමට ය.
2. තාක්ෂණික උපකරණ මගින් ඉගැන්වීමට ය.
3. ජාතීන් අතර සමගිය වර්ධනය කර ගැනීමට ය.
4. සියලු ගුරුවරුන් උපාධිධාරීන් බවට පත් කිරීමට ය. (..........)

19. ජනවාර්ගික ගැටලුව විසඳා ගැනීමට ශ්‍රී ලංකාව ගෙන ඇති වැදගත් පියවරකි,

1. මාධ්‍ය වශයෙන් වෙන් වෙන් ව පාසල් ස්ථාපිත කිරීම
2. බහුසංස්කෘතිකමය වැඩසටහන් අධ්‍යාපන පද්ධතියට එක් කිරීම
3. ගුරුවරු පුහුණු කිරීමේ දී මව් භාෂාව පමණක් යොදා ගැනීම
4. අන්තර් පාසල් වැඩසටහන් සඳහා අවස්ථාව අවම කිරීම (..........)

20. තරුණ අසහනය ඇතිවීමට හේතුවක් **නොවන්නේ**,

1. තරුණයන්ගේ මූලික අවශ්‍යතා ඉටු නොවීම
2. සමාජ අසාධාරණත්වයට ලක් නොවීම
3. තෘතීය අධ්‍යාපනයට ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථා නොලැබීම
4. උසස් අධ්‍යාපනයේ දී ආර්ථික දුෂ්කරතා මතුවීම (..........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev. Mankuwela Suwathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිනි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0130/PE730 - තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ගැටලු

**II කොටස**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) රටක අධ්‍යාපන සඳහා බලපාන ප්‍රධාන සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් සාධකයක් අධ්‍යාපනයට හිතකර ලෙසින් යොදාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (ii) කොටස සඳහා ඔබ තෝරා ගත් සාධකය ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව හා සම්බන්ධ වී ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. (i) මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට එකතු වූ ඉගැන්වීමේ ක්‍රම **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් ක්‍රමයක් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිතය මගින් සිසුන් ඵලදායී ඉගෙනුම් ක්‍රියාවලියක නිරත කරවිය හැකි ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) ලන්දේසි යුගයේ අධ්‍යාපන අරමුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) (i) හි දී දක්වන ලද එම අරමුණු ඉටු කරගැනීම සඳහා ඔවුන් අධ්‍යාපනය ඉවහල් කරගත් ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) ලන්දේසි අධ්‍යාපන ක්‍රමයේ පසුකාලීන බලපෑම් **දෙකක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev. Manikwela Sirirathana Thero

04. (i) 1931-1938 මූලික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) එම ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් පාසල් අධ්‍යාපනයේ සිදු වූ වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (i) කොටසේ නම් කරන ලද ප්‍රතිසංස්කරණයක් වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක නව ප්‍රවණතා **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) (i) හි දී දක්වන ලද එක් ප්‍රවණතාවක් ක්‍රියාත්මක කිරීමේ දී මතුවිය හැකි අභියෝගාත්මක තත්ත්වයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මතුවන අභියෝගාත්මක ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීමට (i) කොටසේ සඳහන් කළ නව ප්‍රවණතාවක් දක්වන දායකත්වය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. (i) ජපානයේ ප්‍රාථමික අධ්‍යාපනයේ ක්‍රියාත්මක විෂයයන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) නොවිධිමත් අධ්‍යාපනය ජපානය තුළ ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ජපානයේ නොවිධිමත් අධ්‍යාපනය සහ ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපනය අතර ඇති සමානතා උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. (i) ගෝලීයකරණයේ වාසි **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) ගෝලීයකරණය නිසා ළමා සංවර්ධනයට ඇතිවන අහිතකර බලපෑම් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) එම බලපෑම් අවම කර ගැනීමට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක ක්‍රියාකාරකම් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. ශ්‍රී ලංකාව ආශ්‍රිත කොටගෙන පහත සඳහන් මාතෘකාවලින් **හතරක්** සඳහා කෙටි සටහන් ලියන්න.

(i) රටේ සංවර්ධනය සඳහා අධ්‍යාපනය යොදා ගැනීම

(ii) ළමා අයිතිවාසිකම් සුරැකීම

(iii) අඛණ්ඩ ගුරු අධ්‍යාපනයක අවශ්‍යතාව

(iv) අධ්‍යාපන තාක්ෂණයේ බලපෑම

(v) ශිෂ්‍ය පෞරුෂත්වය ගොඩනැංවීමට පාසලේ දායකත්වය

(vi) ඵලදායී පාසලක ලක්ෂණ

(ලකුණු 04 x 4 = ලකුණු 16)

********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017

PE0140/PE740

## විෂයමාලා න්‍යාය සහ භාවිතය
## CURRICULUM THEORY & PRACTICE

2017.03.11 | පැය 0900 - පැය1200 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:........................................

### I කොටස

**වඩාත් ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. විෂයමාලා සැලසුමක ප්‍රධාන අංග හතර වන්නේ,

A – අරමුණු B – ඉගැන්වීමේ ක්‍රම C – ඇගයීම D – විෂය අන්තර්ගතය

ඒවායේ නිවැරදි අනුපිළිවෙළ දක්වන කාණ්ඩය තෝරන්න.

1. A, B, C, D 2. B, A, D, C 3. A, D, B, C 4. A, B, D, C (..............)

02. විධිමත් ව තීරණය කරනු ලැබූ ඉගෙනුම් පල සාධනය අරමුණු කරගත් විෂයමාලාවක් සැකසීමට අපේක්ෂා කරන්නේ නම් තෝරා ගත යුතු විෂයමාලා ප්‍රවේශය කුමක් ද?

1. චර්යාවාදී ප්‍රවේශය (Behavioural Approach)
2. කළමනාකරණ ප්‍රවේශය (Management Approach)
3. පද්ධති ප්‍රවේශය (Systems Approach)
4. මානවවාදී ප්‍රවේශය (Humanistic Approach) (..............)

03. වඩාත් ම පලදායී ඉගෙනුම වන්නේ අත්දැකීම් ලබා ගැනීම යි යන මතය අවධාරණය කරනු ලබන මූලික දාර්ශනික ගුරු කුලය වන්නේ,

1. විඥාන වාදය (Idealism) 2. යථා වාදය (Realism)
3. උපයෝගිතා වාදය (Pragmatism) 4. සාංදෘෂ්ටික වාදය (Existentialism)

(..............)

අ.පි.බ.

Rev. Manikwela Sirirathana Thero

04. මිනිස් ශිෂ්ටාචාරය තුළ විද්වතුන් විසින් ගොඩනගන ලද දැනුම ශිෂ්‍ය ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කිරීම අරමුණු කර ගත් අධ්‍යාපනික දාර්ශනික ගුරු කුලය වන්නේ,

1. සන්තතවාදය යි (Perennialism)
2. ප්‍රගතිවාදය යි (Progressivism)
3. සාරාත්මවාදය යි (Essentialism)
4. ප්‍රතිනිර්මාණතාවාදය යි (Reconstructionism) (..........)

05. විෂයමාලා සැලසුම්කරණයේ දී අධ්‍යාපන මනෝවිද්‍යාවේ එන ඉගෙනුම් න්‍යාය පදනම් කර ගන්නේ පහත දැක්වෙන කුමන කාර්යයන් පිළිබඳ ව තීරණය කිරීම සඳහා ද?

1. විෂයමාලාවක මූලික හැඩය තීරණය කිරීමට
2. විෂය අන්තර්ගතය තීරණය කිරීමට
3. ඉගැන්වීමේ ක්‍රම සහ ඇගයීමේ ක්‍රම තීරණය කිරීමට
4. කාල කළමනාකරණය පිළිබඳ තීරණය කිරීමට (..........)

06. පහත ගැටලුව සහ පිළියම් සලකා බලන්න.

ගැටලුව - පවතින විෂයමාලාව සමාජ අවශ්‍යතාවලට නොගැලපෙන බව විවේචකයින්ගේ අදහස යි.

පිළියම - A - ඉගෙනුම හා ඉගැන්වීම පිළිබඳ කාලීන පර්යේෂණ පදනම් කරගෙන ඇති නව වැඩසටහන් හා විෂයමාලා සකස් කළ යුතු ය.

B - විෂය, විෂය පථය, ශ්‍රේණිය අතර අනුපිළිවෙල පිළිබඳ ශිෂ්‍යයින්ගේ හා බලපෑම් කණ්ඩායම්වල අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

මේ සම්බන්ධ ව දී ඇති නිවැරදි වාක්‍ය තෝරන්න.

1. ගැටලුවට A හා B පිළියම් දෙක ම ගැලපේ
2. ගැටලුවට A පිළියම ගැලපේ. B පිළියම නොගැලපේ
3. ගැටලුවට A පිළියම නොගැලපේ. B පිළියම ගැලපේ
4. A හා B පිළියම් දෙක ම නොගැලපේ (..........)

07. ගැහැණු හා පිරිමි ළමුන් වෙන් වෙන් ව පාසල් නිල ඇඳුමින් සැරසී පෙළට, ආචාරශීලී ව ගමන් කරයි යන්න,

1. විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි
2. හර විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි
3. සමගාමී විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි
4. සැඟවුණු විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි (..........)

08. නිපුණතා පාදක විෂයමාලාව යනු,

1. විෂයයන් වශයෙන් නම් කොට වෙන් කරනු ලැබූ විෂයමාලාව යි
2. ශිෂ්‍යයා විසින් අවසානයේ අත්පත් කර ගතයුතු ඉහළ හැකියා ජීවන පුරුද්දක් බවට දැක්වෙන විෂයමාලාව යි
3. විෂය අන්තර්ගතය හැදෑරීමෙන් ලබා ගත යුතු සැලසුම් කරන ලද අවසන් පලය යන විෂයමාලාව යි
4. විෂයමාලාවන් අතර අන්තර් සම්බන්ධතා මතුවන පරිදි ඉගැන්වීම හා සංවිධානය කිරීම යන්න යි (..........)

Rev Manikwela Sirirathana Thero

09. හර විෂයමාලාවක වඩාත් වැදගත් ලක්ෂණය වන්නේ,

1. සිසු වරණ මත පදනම් වී තිබීම
2. වැඩසටහන ක්‍රියාකාරකම් රැසකින් සමන්විතවීම
3. අත්‍යවශ්‍ය විෂය සමූහයක් සියලු ම සිසුන් හැදෑරිය යුතු බව
4. විධිමත් විෂයමාලාවට සහය වන විෂයමාලාවක් වීම (..........)

10. විෂයමාලා සංවර්ධන ආකෘති අතර චක්‍රීය ආකෘතියක් ලෙස දැක්විය හැක්කේ,

1. රැල්ෆ් ටයිලර්ගේ ආකෘතිය
2. ඩෙකර් එෆ් වෝකර්ගේ ආකෘතිය
3. වීලර්ගේ ආකෘතිය
4. ස්කිල්බෙක්ගේ ආකෘතිය (..........)

11. විෂයමාලා පිරිසැලසුමක මානයක් වන තිරස් සමෝධානය යනුවෙන් අදහස් කරන්නේ,

1. විෂයමාලාවක විෂය අන්තර්ගතය අනුපිළිවෙළ කිරීම යි
2. විෂයමාලාවක විෂය අන්තර්ගතය සමෝධානය කිරීම යි
3. විෂයමාලාවක විෂය අන්තර්ගතයේ පුළුල් බව හා ගැඹුර පිළිබඳ සලකා බැලීම යි
4. විෂයමාලාවක විෂය අන්තර්ගතයේ අඛණ්ඩ බව රැක ගැනීම යි (..........)

12. විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී එහි සාර්ථක අසාර්ථක බව පිළිබඳ තීරණය වන ප්‍රබල ම සාධකවලින් එකක් වන්නේ ගුරුවරයාගේ සංජානනය බව අවධාරණය කරනු ලබන ආකෘතිය කුමක් ද?

1. වෙනස සඳහා බාධක මගහැරවීමේ ආකෘතිය
2. සංවිධානාත්මක සංවර්ධන ආකෘතිය
3. අපේක්ෂා මූලික අනුවර්තන ආකෘතිය
4. අධ්‍යාපනික වෙනස්කම් සඳහා ආකෘතිය (..........)

13. විෂයමාලාව ක්‍රියාත්මක කිරීම යනු පවත්නා තත්ත්වය වෙනස් කිරීමකි. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධකයක් ලෙස මයිකල් ෆුලන් පෙන්වා දෙන්නේ අදාළ වෙනසෙහි ලක්ෂණය යි. වෙනසෙහි ලක්ෂණයක් ලෙස ඔහු දක්වා ඇති සාධකයක් **නොවන්නේ**,

1. පැහැදිලි බව    2. සංකීර්ණ බව
3. අදාළ බව    4. ගුරුවරයාගේ ලක්ෂණ (..........)

14. විෂයමාලාවක ඇගයීම් අවධි පහත දැක්වේ.

A – තොරතුරු රැස් කිරීම
B – තොරතුරු විශ්ලේෂණය කිරීම
C – තොරතුරු ප්‍රතිචක්‍රීකරණය
D – තොරතුරු සංවිධානය කිරීම
E – ඇගයීම් යොමුව තීරණය කිරීම
F – තොරතුරු වාර්තාකරණය කිරීම

මේ අතුරින් නිවැරදි ව පෙළ ගස්වා ඇති පිළිතුර කුමක් ද?

1. E, A, D, B, F, C    2. A, B, C, D, E, F
3. E, D, A, B, F, C    4. E, D, B, A, F, C (..........)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

15. විෂයමාලාව ඇගයීම සඳහා වූ ස්ටේක්ගේ දිරි ගැන්වීමේ ආකෘතිය මගින් අවධාරණය කෙරෙන ප්‍රධාන ක්‍රියාකාරකම් දෙක වන්නේ,

1. විස්තර කිරීම හා විනිශ්චය ලබා දීම
2. සන්දර්භය ඇගයීම හා විස්තර කිරීම
3. නිමැවුම ඇගයීම හා විනිශ්චය ලබා දීම
4. ක්‍රියාවලිය විස්තර කිරීම හා ඇගයීම (..............)

16. 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණයේ දී ප්‍රාථමික අධ්‍යාපනයේ සුවිශේෂ සිද්ධාන්තයක් නොවනුයේ,

1. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනයක් වීම
2. ක්‍රියාවෙන් අවබෝධය සඳහා වැඩි තැනක් ලැබීම
3. සමෝධානික ස්වරූපයෙන් විෂය ඉදිරිපත් වීම
4. ප්‍රාථමික පන්තිවල දී කථන ඉංග්‍රීසි භාවිතයට වැඩි නැඹුරුවක් හිමිවීම. (..............)

17. ජාතික අධ්‍යාපන කොමිසන් සභාව පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලද්දේ,

1. 1972 දී ය 2. 1981 දී ය
3. 1991 දී ය 4. 1997 දී ය (..............)

18. කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,

1. ක්‍රියාවෙන් අවබෝධය සිද්ධාන්තය මත පිහිටා තිබීම
2. නිපුණතා පාදක අධ්‍යාපනයට අවස්ථාව ලබාදීම
3. අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීමට කටයුතු කිරීම
4. පොදු කුසලතා වර්ධනය කිරීමට කටයුතු කිරීම (..............)

19. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අයත් කාර්යයක් වන්නේ,

1. ඉගැන්වීම් උපකරණ හඳුන්වා දීම
2. ඉගැන්වීම් ආධාරක, පෙළපොත් සම්පාදනය
3. ගුරුවරු, සිසුන්, මහජනතාව දැනුවත් කිරීම
4. ප්‍රතිපත්ති හෝ සැලසුම්වල වෙනස්කම් ඇති කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම (..............)

20. 2015 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනය විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී ඇති කළ ප්‍රධාන වෙනස නම්,

1. නිපුණතා පාදක ව ඉගෙනුම යි
2. පාසල් පාදක ඇගයීම යි
3. ඉගෙනුම් පල පදනම් කර ගත් පාඩම් සැලසුම්කරණය යි
4. 5E ආකෘතියට අනුව පාඩම් සැලසුම්කරණය යි (..............)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

Rev Manikwela Srirathana Thero

4207

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0140/PE740 - විෂයමාලා න්‍යාය සහ භාවිතය

### II කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. විෂයමාලාවක් යනු ශිෂ්‍ය පිරිසක් වෙනුවෙන් අධ්‍යාපන අභිමතාර්ථ හෝ ප්‍රතිඵල හැකිතාක් දුරට ලඟා කර ගැනීම සඳහා පිරිසැලසුම් කළ ක්‍රියාකාරී වැඩසටහනකි.

(i) ඉහත අදහස වෙනත් නිර්වචනයක් ඇසුරින් තහවුරු වනසේ විෂයමාලාව යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) විෂයමාලාවක් සතුව පවතින මූලික ලක්ෂණ **පහක්** නම් කරන්න. (ලකුණු 05යි)

(iii) කාලීන අවශ්‍යතා හා සංස්කෘතියට ගැලපෙන ලෙස සිසුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනයට විෂයමාලාව දායක විය යුත්තේ කෙසේ දැ'යි විමසන්න. (ලකුණු 07යි)

02. ඕනෑම විෂයමාලාවක් ගොඩනැගීම සඳහා දාර්ශනික පදනමක් තිබිය යුතු ය.

(i) විෂයමාලාවක් සැලසුම් කිරීමේ දී දාර්ශනික සංකල්ප පදනම් කර ගැනීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 04යි)

(ii) ඉන් මූලික දාර්ශනික ගුරු කුල දෙකකින් අවධාරණය කරනු ලබන යථාර්ථය පිළිබඳ අධ්‍යාපනයේ අරමුණු හා ගුරු භූමිකාවේ ස්වභාවය යන අංග සංසන්දනය කරන්න. (ලකුණු 05යි)

(iii) විෂයමාලාව සැලසුම් කළ පසු පන්ති කාමරයේ දී එය ක්‍රියාත්මක කරනු ලබන්නේ ගුරුවරයා විසිනි. එබැවින් අධ්‍යාපන දාර්ශනික ගුරු කුලයේ මූලික සංකල්ප අනුව විෂයමාලාවේ අරමුණු හා ගුරු භූමිකාවේ ස්වභාවය වෙනස් වන ආකාරය දැන සිටීම අත්‍යවශ්‍ය වේ. ඔබ කැමති අධ්‍යාපන දර්ශන **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

03. විෂයමාලාව සංවර්ධනය කිරීමේ දී මනෝවිද්‍යාත්මක සාධක පිළිබඳ අවධානය යොමු කොට ඒවා පදනම් කර ගැනීම සිදු කරයි.

(i) විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේ දී උපයෝගී කර ගන්නා මනෝවිද්‍යාත්මක පදනම සපයන ගුරු කුල **හතර** නම් කරන්න. (ලකුණු 04යි)

(ii) ඉන් ගුරු කුල **දෙකක** ඉගෙනුම් න්‍යායන්හි මූලික ලක්ෂණ සංසන්දනය කරන්න. (ලකුණු 05යි)

(iii) ඉහත සඳහන් කළ ගුරු කුල දෙකෙහි මූලික ලක්ෂණ පිළිබඳ ව අවධානය යොමු කරමින් ඒවා විෂයමාලා සැලසුම කෙරෙහි බලපාන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

අ.පි.බ.

Rev Manikwela Sumathana Thero

04. පන්ති කාමරය විවිධ සමාජ ස්තර නියෝජනය කරන ස්ථානයකි.

(i) සමාජ ආර්ථිකයේ ඇති වූ පරිණාමනය මත වෙනස් වූ පවුල් සංස්ථාවේ ස්වභාවය විෂයමාලාවේ අරමුණු කෙරෙහි බලපා ඇති ආකාරය දැක්වීමට උදාහරණ **දෙකක්** දෙන්න. (ලකුණු 04යි)

(ii) රටක විවිධ සමාජ ස්තරවල අවශ්‍යතා ඉටු වනසේ විෂයමාලාවක් සැලසුම් කළ යුතු ය. විශේෂ ලැදියා කණ්ඩායම් **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) වෙනස් වන සමාජ ආර්ථික අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස විෂයමාලාවක් සකස් කළ පසු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා ගුරු භූමිකාව ඊට ගැලපෙන ලෙස අනුවර්තනය වීම අවශ්‍ය වේ. උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 07යි)

05. (i) විෂයමාලාව සාර්ථක ව ක්‍රියාත්මක කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04යි)

(ii) විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ ආකෘති **පහක්** නම් කරන්න. (ලකුණු 05යි)

(iii) විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සිදුවන්නේ පාසලේ දී ය. පාසලේ නායකයා විදුහල්පති වන අතර විෂයමාලාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම ඔහු සතු වේ. උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

06. ඕනෑම ක්‍රියාවලියක් ඇගයීමට ලක් කිරීමෙන් එහි ප්‍රබලතා හා දුර්වලතා හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

(i) විෂයමාලාව ඇගයීම යනු කුමක් දැ'යි දක්වන්න. (ලකුණු 04යි)

(ii) විෂයමාලාවක් ඇගයීමෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු **පහක්** පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

(iii) විෂයමාලාව සංවර්ධනය සඳහා ඇගයීම අත්‍යවශ්‍ය වේ. ඔබ විෂයමාලා සංවර්ධන ඇගයීම් කමිටුවක සාමාජිකයකු ලෙස කටයුතු කරන්නේ නම් තොරතුරු එක් රැස් කිරීමට යොදා ගත හැකි විවිධ ක්‍රම **තුනක්** හා එමගින් ඇති විය හැකි වාසි හා අභියෝග අන් සාමාජිකයන් හට පහදා දීම සඳහා භාවිත කළ හැකි වගුවක් සකස් කරන්න. (ලකුණු 07යි)

07. විෂයමාලාව සැලසුම් කිරීම සඳහා විෂයමාලා සංවර්ධන ආකෘති පිළිබඳ විෂයමාලා සම්පාදකවරු දැන සිටීම අත්‍යවශ්‍ය වේ.

(i) විෂයමාලා සංවර්ධන ආකෘති යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04යි)

(ii) විෂයමාලා සංවර්ධන ආකෘති **තුනක්** නම් කොට, එම විෂයමාලා ආකෘති අතර පවතින ප්‍රධාන වෙනස්කම් දක්වන්න. (ලකුණු 05යි)

(iii) විෂයමාලා ආකෘති පිළිබඳ දැනුම ගුරුවරයකු හට කවරාකාරයෙන් වැදගත් වන්නේ දැ'යි සාකච්ඡා කරන්න. (ලකුණු 07යි)

08. ශ්‍රී ලංකාවේ විෂයමාලාව ඈත අතීතයේ සිට ම කලින් කලට වෙනස්කම්වලට භාජනය වී ඇත.

(i) ලංකාවේ විෂයමාලා සංවර්ධනය හා බැඳුණු ආයතන නම් කරන්න. (ලකුණු 04යි)

(ii) විෂයමාලා සම්පාදනයේ දී ජාතික අධ්‍යාපන ආයතනය සතු කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) වර්තමානයේ ක්‍රියාත්මක වන විෂයමාලාව, ජාතික පොදු නිපුණතා ඉටු කර ගැනීමට මනා දායකත්වයක් දක්වයි. පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

321

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018

**PE0140/PE740** | **විෂයමාලා න්‍යාය සහ භාවිතය**
**CURRICULUM THEORY & PRACTICE**

2018.12.16 පෙ.ව. 0900 - පෙ.ව. 1200 කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:.......................................

### I කොටස

**වඩාත් ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. විෂයමාලාව සංවර්ධනයට දර්ශන විෂයය ක්ෂේත්‍රය පදනම් කර ගැනීම,
    1. ළමයාගේ හැසිරීමේ රටාව තීරණය කිරීමට උපකාරී කරයි.
    2. ශිෂ්‍ය ලැදියා, හැකියා තීරණය කිරීමට උපකාරී කරයි.
    3. සාර්ථක ව ගැටලුවලට මුහුණදීමේ හැකියාව තීරණය කිරීමට උපකාරී කරයි.
    4. සමාජ අවශ්‍යතාවට අනුව දැනුම තීරණය කිරීමට උපකාරී කරයි. (..................)

02. විෂයමාලා සංවර්ධනයේ දී මුලින් ම කළ යුත්තේ,
    1. මූලධර්ම සංස්ථාපනය කර ගැනීම ය.
    2. ඉගැන්වීමේ ක්‍රම සංස්ථාපනය කර ගැනීම ය.
    3. ඇගයීම් ක්‍රම සංස්ථාපනය කර ගැනීම ය.
    4. ක්‍රියාකාරකම් සංස්ථාපනය කර ගැනීම ය. (..................)

03. විෂයමාලාව ව්‍යාප්ත කිරීමේ සන්නිවේදන ක්‍රමවේදයක් **නොවන්නේ,**
    1. විදුහල්පති පුහුණු වැඩසටහන් පැවැත්වීම
    2. ගුරුවරුන්ගේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
    3. නියාමන වැඩසටහන් පැවැත්වීම
    4. ශිෂ්‍ය ක්‍රියාකාරී වැඩසටහන් පැවැත්වීම (..................)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

04. තමා දන්නා කරුණු, මතවාද, විශ්වාස ළමයාට ඉගැන්වීම නොව ළමයාගේ බුද්ධිය ක්‍රියාත්මකවීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කොට ඉදිරිපත් කිරීම ගුරුවරයා විසින් කළ යුතු බව දක්වන්නේ,

1. උපයෝගිතාවාදීන් ය.
2. විඥානවාදීන් ය.
3. යථාවාදීන් ය.
4. සාංදෘෂ්ටිකවාදීන් ය. (..................)

05. සමාජය හා අන් අය සමඟ සැබෑ ජීවිතයේ කටයුතු කිරීම වෙනුවෙන් අධ්‍යාපනය පදනම් විය යුතු බව පෙන්වා දෙන්නේ,

1. ප්‍රගතිවාදයේ දී ය.
2. ප්‍රතිනිර්මාණවාදයේ දී ය.
3. සන්තතවාදයේ දී ය.
4. සරාත්මවාදයේ දී ය. (..................)

06. මනෝවිද්‍යාත්මක න්‍යායන් හා පදනම් පිළිබඳ ව අවධානය යොමු කරනුයේ,

1. කාලය කළමනාකරණය කර ගැනීමට ය.
2. විෂය අන්තර්ගතය තීරණය කිරීමට ය.
3. විෂයමාලාවේ හැඩය තීරණය කිරීමට ය.
4. ඉගැන්වීමේ ක්‍රම හා ඇගයීමේ ක්‍රම තීරණය කිරීමට ය. (..................)

07. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂය නිර්දේශයට අනුව 10-11 ශ්‍රේණි සඳහා ශිෂ්‍යයින් හැදෑරිය යුතු මුළු විෂය සංඛ්‍යාව වන්නේ,

1. 7කි. 2. 8කි. 3. 9කි. 4. 10කි. (..................)

08. විධිමත් ලෙස විෂයමාලාව සැලසුම් කිරීමේ දී එවැනි සැලසුමක තිබිය යුතු ප්‍රධාන අංග පිළිවෙළින් දක්වා ඇත්තේ.

A – විෂය අන්තර්ගතය B – ඉගැන්වීමේ ක්‍රම C – අරමුණු D – ඇගයීම

1. C, B, A, D
2. A, C, B, D
2. B, A, C, D
4. C, A, B, D (..................)

09. උදෑසන පාසල් මිදුල හා පන්තිය පිරිසිදු කිරීම යන්න,

1. විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි.
2. හර විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි.
3. සමගාමී විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි.
4. සැඟවුණු විෂයමාලාව ක්‍රියාත්මක වන අවස්ථාවකි. (..................)

10. වෛෂයික විෂයමාලාව යනු,

1. විෂයයන් වශයෙන් නම් කොට වෙන් කරනු ලැබූ විෂයමාලාව යි.
2. ශිෂ්‍යයා විසින් අවසානයේ අත්පත් කර ගත යුතු ඉහළ හැකියා ජීවන පුරුද්දක් බවට දැක්වෙන විෂයමාලාව යි.
3. විෂය අන්තර්ගතය හැදෑරීමෙන් ලබා ගත යුතු සැලසුම් කරනු ලැබූ අවසන් ඵලය යන විෂයමාලාව යි.
4. විෂයමාලා අතර අන්තර් සම්බන්ධතාව මතු වන පරිදි ඉගැන්වීම හා සංවිධානය කිරීම යන්න දැක්වෙන විෂයමාලාව යි. (..................)

11. 1997 සිට හඳුන්වා දෙන අරමුණු හා නිපුණතා සැකසීම සඳහා පාදක වූයේ,

1. යුනෙස්කෝ වාර්තාව
2. එක්සත් ජාතීන්ගේ වාර්තාව
3. යුනෙස්කෝ මූල්‍ය වාර්තාව
4. සාර්ක් වාර්තාව (..................)

අ.පි.බ.

Rev Maukwela Sirirathana Thero

Rev Manikwela Sirirathana Thero

19. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වගකීමක් **නොවන්නේ,**

   1. අධ්‍යාපන සාධනය මැනීම
   2. විශ්වසනීයතාව ආරක්ෂා වන ලෙස ඇගයීම් උපකරණ සැකසීම
   3. වලංගුතාව රැකෙන පරිදි ක්‍රමශිල්ප භාවිත කිරීම
   4. අධ්‍යාපන පර්යේෂණ පැවැත්වීම (..............)

20. විදුහල්පති පිළිබඳ දක්වා ඇති ප්‍රකාශ මගින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

   1. පාසලේ නායකයා ය.
   2. ප්‍රජාවගේ හා ගුරුවරුන්ගේ දෘශ්‍යමාන නායකයා ය.
   3. සම්පත්දායක නියෝජිතයා ය.
   4. ඉහත ප්‍රකාශ සියල්ලම ය. (..............)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0140/PE740 - විෂයමාලා න්‍යාය සහ භාවිතය

**II කොටස**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) විෂයමාලාව යන්න **එක්** නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන අරමුණු **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) "කාලීන අවශ්‍යතා හා ගැටලුවලට පිළියම් ලැබෙන ලෙස විෂයමාලාව ක්‍රියාත්මක කළ යුතු වේ." පහදන්න. (ලකුණු 08)

02. ඕනෑම විෂයමාලාවක් ගොඩනැගීමට මනෝවිද්‍යාත්මක පදනමක් තිබිය යුතු වේ.

(i) විෂයමාලාවේ මනෝවිද්‍යාත්මක පදනමට බලපාන පදනම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් ගුරු කුලයක පදනම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විෂයමාලාවක් සැලසුම් කිරීමේ දී මනෝවිද්‍යාත්මක සංකල්ප පදනම් කර ගැනීමට පාදක වන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. විෂයමාලාව සැලසුම් කිරීමේ දී රට බලපෑම් ඇති කළ හැකි විශේෂ ළදරුවා කණ්ඩායම්වල අදහස් ඉතා වැදගත් වේ.

(i) විශේෂ ළදරුවා කණ්ඩායම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) වෙනස්වන පවුල් සංස්ථාවට පිළියමක් ලෙස විෂයමාලාව වෙනස් වී ක්‍රියාත්මක වන අවස්ථාවලට උදාහරණ **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) සංස්කෘතික විවිධත්වය සහ විෂයමාලාව අතර පවතින අන්තර් සම්බන්ධතාව උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev. Manikwela Siriwathana Thero

04. විෂයමාලාවක් සංවර්ධනය කිරීමට විෂයමාලා ආකෘති වැඩි දායකත්වයක් ලබා දේ.

(i) පහත ඒවාට උදාහරණ දෙන්න.

A - චක්‍රීය ආකෘති B - ගතික ආකෘති (ලකුණු 03)

(ii) ඉන් එක් ආකෘතියක ප්‍රධාන අංග නම් කරන්න. (ලකුණු 05)

(iii) විෂයමාලා ආකෘති විෂයමාලා සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. ඕනෑම ක්‍රියාවලියක් ඇගයීමට ලක් කිරීමෙන් සංවර්ධනයක් ඇති කළ හැකි ය.

(i) විෂයමාලාව ඇගයීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) විෂයමාලාව ඇගයීම සඳහා භාවිත කළ හැකි ප්‍රධාන ක්‍රමවේද **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) විෂයමාලාවේ සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම අතර වෙනස්කම් වගුවක දක්වන්න. (ලකුණු 08)

06. (i) විෂයමාලාවක් පිරිසැලසුම් කිරීමේ දී දැකගත හැකි පිරිසැලසුම් වර්ග නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් පිරිසැලසුම් වර්ගයක් විෂයමාලා සංවර්ධනයට දායක වන ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) "ගුරුවරයා පරිවර්තකාරකයකු වේ." පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. (i) මයිකල් ෆුලන්ට අනුව වෙනස්වීමේ ක්‍රියාවලියේ ආරම්භක අවධිය සඳහා බලපාන සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් සාධකයක් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට බලපෑම් සිදු කරන ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයකුගේ ආවේණික ලක්ෂණ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට ඇති කරන බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී විවිධ පාර්ශ්වකරුවන්ගේ සහය ලබා ගනී. ඒ අනුව,

(i) ශ්‍රී ලංකාවේ විෂයමාලා සංවර්ධනයට දායක වන පාර්ශ්වකරුවන් නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් පාර්ශ්වකරුවකුගේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයකු ලෙස විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු හා ඒවාට ලබා දියහැකි විසඳුම් විවිධ වේ. ඔබ 1 ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරයා යැ'යි සිතා ඇතිවන ගැටලු නිරාකරණය කර ගන්නා ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

********

Rev Manikwela Siriwathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

4106

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017

| | |
|---|---|
| PE0150/PE750 | අධ්‍යාපනික මිනුම, තක්සේරුකරණය සහ ඇගයුම<br>EDUCATIONAL MEASUREMENT, ASSESSMENT & EVALUATION |

2017.03.18 පෙ.ව. 0900 - පෙ.ව.1200 කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

---

විභාග අංකය:.............................................

### I කොටස

**වඩාත් ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. "අධ්‍යාපනික ඇගයුම" යන්න නිවැරදි ව විස්තර කරන ප්‍රකාශය තෝරන්න.
    1. ශිෂ්‍ය සාධනය ප්‍රමාණනය කිරීම අධ්‍යාපනික ඇගයුම යි
    2. ශිෂ්‍ය සාධනය ලකුණු මගින් දැක්වීම අධ්‍යාපනික ඇගයුම යි
    3. ශිෂ්‍ය සාධනය ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක ව දැක්වීම අධ්‍යාපනික ඇගයුම යි
    4. ශිෂ්‍ය සාධනය ප්‍රමාණාත්මක ව විග්‍රහ කර දැක්වීම අධ්‍යාපනික ඇගයුම යි (..........)

02. මිනුම් පරිමාණ පිළිබඳ ව පහත දැක්වෙන කුමන ලක්ෂණය අඩංගු ප්‍රකාශය නිවැරදි වේ ද?
    1. අනුපාත පරිමාණයෙහි නිරපේක්ෂ ශූන්‍යයක් පවතී
    2. තරා පරිමාණය සියලු ගණිත කර්ම සඳහා යොදා ගත හැකි ය
    3. සිසුන්ට ලකුණු පැවරීමේ දී නාම පරිමාණය යොදා ගැනේ
    4. ආන්තර පරිමාණයෙහි නිරපේක්ෂ ශූන්‍ය අගයක් පවතී (..........)

03. පාසල් පරීක්ෂණ ලේඛ්‍ය පරීක්ෂණවලට පමණක් සීමාවීමේ වඩාත් අවැඩදායක ප්‍රතිඵලය වනුයේ,
    1. ශිෂ්‍යයින්ගේ කථන හැකියා ගැන අවධානය යොමු නොවීම ය
    2. ආකල්ප ගුණාංග ඇගයීමට අවස්ථාවක් නොලැබීම ය
    3. ශාරීරික කුසලතා ඇගයීමට ඉඩ නොලැබීම ය
    4. ශිෂ්‍ය පෞරුෂය සමබර ලෙස මැනීමට අපොහොසත් වීම ය (..........)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

04. නිර්ණායක මූලික ඇගයීම් ප්‍රවේශය තුළ දක්නට ලැබෙන සාධනීය ලක්ෂණයන් වඩාත් නිවැරදි ව විස්තර කෙරෙන පිළිතුර තෝරන්න.

1. නිර්ණායක මූලික ඇගයීම තුළින් සිසුවා අන් සිසුන් අතර සිටින ස්ථානය ඉතාමත් පැහැදිලි ව හඳුනා ගත හැකි ය
2. ශිෂ්‍යයා පාඨමාලාව තුළින් අත්පත් කරගත් සමස්ත සාධනය විස්තර කිරීමට නිර්ණායක මූලික ඇගයීම උදව් වේ
3. ශිෂ්‍යයාගේ පෙර සාධනය හා පසු සාධනය සසඳමින් ශිෂ්‍යයාගේ ඉදිරි ඉගෙනුම සඳහා ආලෝකය ලබා දීමට නිර්ණායක මූලික ඇගයුම වැදගත් වේ
4. ශිෂ්‍යයා අපේක්ෂිත සාධන මට්ටමට ළඟාවූයේ ද යන්න විමසමින් ගුරු-සිසු දෙපාර්ශ්වයට ම ප්‍රතිපෝෂණය ලබා දීමට නිර්ණායක මූලික ඇගයුම උදව් වේ (............)

05. බහුවරණ වනුවල "වරණ" යෙදීම පිළිබඳ නිවැරදි අදහසක් ලබා නොදෙන පිළිතුර තෝරන්න.

1. වරණ සියල්ල ම වනු කඳ හා යම් ආකාරයකට ගැලපෙන ලෙස යෙදීම
2. වික්ෂේප, වනු කඳ හා ව්‍යාකරණානුකූල ව නොගැලපෙන ලෙස යෙදීම
3. වික්ෂේපය යෙදීමේ දී නිතර ම ඒවා නිවැරදි වරණය හා සම්බන්ධ වන ලෙස යෙදීම
4. වනුවල නිවැරදි වරණය වරණ අතර අහඹු ලෙස ස්ථානගත කිරීම (............)

06. මනෝචාලක ක්ෂේත්‍ර වර්ගීකරණයෙහි "සමායෝගය" යන අවස්ථාව පිළිබඳ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

1. අවස්ථාවට ගැලපෙන ලෙස චාලක ක්‍රියාකාරකම්හි නිරතවීමේ හැකියාව ලබා ගැනීම
2. යම් චාලක ක්‍රියාකාරකමක් අලුතෙන් ම නිර්මාණය කිරීමට හැකියාව ලබා ගැනීම
3. ඉතා ඉහළ මට්ටමේ චාලක ක්‍රියාකාරකම්වල යෙදීමේ හැකියාව ලැබීම
4. චාලක ක්‍රියාකාරකම්වල සංගතභාවයකින් යුක්ත ව යෙදීමේ හැකියාව ලැබීම (............)

07. බ්ලූම්ගේ ප්‍රජානන ක්ෂේත්‍ර වර්ගීකරණයෙහි "විශ්ලේෂණය" යන්න සඳහා වඩාත් උචිත උදාහරණයක් වන්නේ මින් කුමක් ද?

1. ලබා දෙන තොරතුරු ආශ්‍රයෙන් ව්‍යාපෘති යෝජනාවක් සැකසීම
2. දෙන ලද ගද්‍ය පාඨයේ දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කිරීම
3. විද්වත් දේශනයකට සවන් දී එහි අන්තර්ගත කරුණු වෙන් කොට දැක්වීම
4. උගත් න්‍යායයක් ආශ්‍රයෙන් ගණිත ගැටලුවක් විසඳීම (............)

08. සංගීතය පිළිබඳ හැකියා ඇති සිසුන් තෝරා ගැනීම සඳහා ගුරුවරයකුට යොදා ගත හැකි පරීක්ෂණයක් වන්නේ,

1. ස්ථාපන පරීක්ෂණ ය
2. බුද්ධි පරීක්ෂණ ය
3. අනාවරණ පරීක්ෂණ ය
4. විශේෂ අභියෝග්‍යතා පරීක්ෂණ ය (............)

09. අනු කොටස් හතරකින් යුක්ත වූ ව්‍යුහගත රචනා ප්‍රශ්නයක් විශ්ලේෂණය කර එම කොටස් හතරට අදාළ වූ දුෂ්කරතා හා විභේදනතා දර්ශක පහත දැක්වේ.

| | දුෂ්කරතා දර්ශකය | විභේදනතා දර්ශකය |
|---|---|---|
| I කොටස | 0.50 | 0.90 |
| II කොටස | 0.20 | -0.30 |
| III කොටස | 0.80 | 0.50 |
| IV කොටස | 0.00 | 0.00 |

ඉහත දක්වා ඇති දත්ත අනුව මෙම ප්‍රශ්නයෙහි සංශෝධනය විය යුත්තේ කුමන කොටස් ද?

1. I හා II කොටස්
2. II හා IV කොටස්
3. I හා III කොටස්
4. III හා IV කොටස් (............)

අ.පි.බ.



Rev Manikwela Siriwathana Thero

10. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයකුට යොදා ගත හැකි විවිධ පරීක්ෂණ අතුරින් පුද්ගලබද්ධ භාවය අඩු විෂයබද්ධ භාවයෙන් ඉහළ පරීක්ෂණ වර්ග අඩංගු පිළිතුර තෝරන්න.

1. කෙටි පිළිතුරු පරීක්ෂණ, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ, ඇදීමේ පරීක්ෂණ
2. කෙටි පිළිතුරු පරීක්ෂණ, ඇදීමේ පරීක්ෂණ, බහුවරණ පරීක්ෂණ
3. රචනා පරීක්ෂණ, ව්‍යුහගත රචනා පරීක්ෂණ, බහුවරණ පරීක්ෂණ
4. ඇදීමේ පරීක්ෂණ, කෙටි පිළිතුරු පරීක්ෂණ, රචනා පරීක්ෂණ (.........)

11. සාධන පරීක්ෂණයක් සැකසීම පියවර කිපයකින් සමන්විත ක්‍රියාවලියකි. එහි දී වනු විශ්ලේෂණය මගින් බලාපොරොත්තු වන්නේ,

1. පිළිතුරු ලිවීමේ දී විෂය කරුණු පහසුවෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට සහය වීමට ය
2. පරීක්ෂණය විෂය කරුණු මූලික වලංගුතාව ආරක්ෂා වන පරිදි සැකසීමට උදව් කර ගැනීමට ය
3. සාධන පරීක්ෂණයෙහි මතුපිට වලංගුතාව ආරක්ෂා කර ගැනීමට ය
4. පරීක්ෂණයෙහි අඩංගු කරන වනුවල නිරවද්‍යතාව ආරක්ෂා කර ගැනීමට ය (.........)

12. පරීක්ෂණයක "විශ්වසනීයතාව" පිළිබඳ ව ඉදිරිපත් වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A – පරීක්ෂණ විශ්වසනීයතාව කෙරෙහි පරීක්ෂකවරයාගේ බලපෑම ඇති වේ.

B – පරීක්ෂණ විශ්වසනීයතාවට අදාල පරීක්ෂණයෙහි ස්වභාවය බලපායි.

C – විශ්වසනීයතා සංගුණකය 0.5ක් වූ විට විශ්වසනීයතාව ඉතා යහපත් ය.

D – විශ්වසනීයතාව මැනීමේ ශිල්පක්‍රමයක් වශයෙන් "සහසම්බන්ධතාව" යොදා ගනී.

E – පරීක්ෂණ විශ්වසනීයතාව මැනීම සඳහා "සමාන්තර පරීක්ෂණ ක්‍රමය" යොදා ගනී.

ඉහත කරුණු අතුරින් විශ්වසනීයතාවට අදාළ වන කරුණු වනුයේ,

1. A, B හා C ය  2. A, D හා E ය
3. A, B හා D ය  4. A, B හා E ය (.........)

13. සාධන පරීක්ෂණයක් භාවිත කිරීමේ දී හඳුනා ගත් අවස්ථා කිහිපයක් පහත දැක්වේ. ඒවා හා සම්බන්ධ වන පරීක්ෂණ ලක්ෂණය නිවැරදි ව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| අවස්ථා | ලක්ෂණ |
|---|---|
| (1) ප්‍රශ්න පත්‍රය, විෂය නිර්දේශය මනාව ආවරණය කොට සැකසීම. | A – වලංගුතාව |
| (2) ප්‍රශ්න පත්‍රයේ උපදෙස් සංකීර්ණ වීම. | B – විශ්වසනීයතාව |
| (3) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා ලබා දුන් කාලය ප්‍රමාණවත් නොවීම. | C – ප්‍රයෝගික බව |
| (4) ලකුණු පැවරීමේ දී පරීක්ෂකවරු අතර විෂමතා පැවතීම. | |

1. (1) - A, (2) – B, (3) - C, (4) - C
2. (1) - A, (2) – A, (3) - C, (4) - C
3. (1) - A, (2) – A, (3) - C, (4) - B
4. (1) - B, (2) – A, (3) - C, (4) - B (.........)

අ.පි.බ

Rev Manikwela Sumathana Thero

14. ගුරුවරයකුට සමාන්තර මධ්‍යන්‍යය ගණනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් **නොවන්නේ,**

1. තම පන්තියේ සිසුන්ගේ සාධන මට්ටම හඳුනා ගැනීමට
2. තම පන්තියේ ඉහළ ම දක්ෂතා පෙන්වන සිසුන් හඳුනා ගැනීමට
3. විෂයයන් කිහිපයක සාධනය සසඳා බැලීමට
4. සිසුන්ගේ ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතා සසඳා බැලීමට (.........)

15. සංඛ්‍යාත ව්‍යාප්ති වගුවක් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද යන්න වඩාත් නිවැරදි ව ප්‍රකාශ වන පිළිතුර කුමක් ද?

1. සංඛ්‍යා රාශියක් අර්ථකථනය සඳහා සාරාංශගත කරන වගුවකි
2. දත්ත සමූහයක් ආශ්‍රයෙන් ගොඩනගන පන්ති ප්‍රාන්තර සමූහයකි
3. පන්ති ප්‍රාන්තර සමූහයක් ආශ්‍රයෙන් ලකුණු ප්‍රස්තාරගත කරන වගුවකි
4. ප්‍රගණන තීරය හා සංඛ්‍යාත තීරය ඇතුළත් වගුවයි (.........)

16. ශිෂ්‍ය ලකුණු නිරූපණය කරන විවිධ ක්‍රම අතුරින් එම තථ්‍ය ලකුණු නොසැඟවී ඒ ආකාරයෙන් ම දැක්වෙන සේ නිරූපණය කරන ක්‍රමය මින් කුමක් ද?

1. කොටු කෙඳි සටහන (Box Plot)
2. ජාල රේඛය (Histogram)
3. කඳ හා පත්‍ර ක්‍රමය (Stem and Leaf)
4. සංඛ්‍යාත බහුඅස්‍රය (Frequency Polygon) (.........)

17. තම සිසුන්ගේ ලකුණු සංඛ්‍යා විද්‍යාත්මක ව අර්ථකථනය කොට සිසුන් පිළිබඳ ව පහත සඳහන් තොරතුරු සොයා ගැනීමට ගුරුවරයකුට අවශ්‍ය විය.

A – සිසුන් ලබා ගත් ලකුණුවල මධ්‍යස්ථය
B - ලකුණුවල අර්ධ අන්තර් චතුර්ථක පරාසය
C - ලකුණුවල මාතය
D - ලකුණුවල 60 වන සහ 75 වන ප්‍රතිශතක තරා

ඉහත තොරතුරු ලබා ගැනීම සඳහා ආධාර කර ගත හැකි ප්‍රස්තාර වර්ග නිවැරදි අනුපිළිවෙළින් ඇති පිළිතුර කුමක් ද?

1. ඔගිව්ය, සංඛ්‍යාත බහුඅස්‍රය, ජාල රේඛය, ඔගිව්ය
2. ජාල රේඛය, ඔගිව්ය, ඔගිව්ය, ඔගිව්ය
3. ඔගිව්ය, ඔගිව්ය, ජාල රේඛය, ඔගිව්ය
4. ඔගිව්ය, ජාල රේඛය, ඔගිව්ය, සංඛ්‍යාත බහුඅස්‍රය (.........)

18. දළ ලකුණ දන්නා විට ඊට අදාළ ප්‍රමිත ලකුණ ලබා ගැනීමේ දී යොදා ගත හැකි සූත්‍රය පහත සූත්‍ර අතුරින් තෝරන්න.

1. $\frac{X-\bar{X}}{SD}$ 2. $\frac{\sum X}{n}$ 3. $X(SD)\pm\bar{X}$ 4. $\frac{\sqrt{\sum(X-\bar{X})^2}}{Z}$ (.........)

19. සිසුවකු ලබා ගත් දළ ලකුණක් ප්‍රමිත ලකුණ බවට පරිවර්තනය කළ විට +1.5 ක අගයක් ලැබුණි. එම ප්‍රමිත ලකුණ මැකෝල් හා හල් යන පරිමාණවලට හැරවූ විට අගය පිළිවෙළින්,

1. 71 හා 60 ය 2. 65 හා 70 ය 3. 71 හා 65 ය 4. 65 හා 71 ය (.........)

20. ක්‍රියාවලිය හා ඵලය යන දෙක ම මැනීම සඳහා නිර්ණායක යොදා ගත යුතු කාර්ය පාදක තක්සේරු අවස්ථාවකට උදාහරණයක් වන්නේ,

1. සිසුන් නිවසේ දී කරන නිර්මාණයක් ඇගයීම
2. සිසුන් ජන කවි ගායනා කරන අවස්ථාවක් ඇගයීම
3. සිසුන් විවාදයක දී දක්වන දක්ෂතාවක් ඇගයීම
4. සිසුන් ලියුම් රඳවනයක් සාදන අවස්ථාවක් සහ සෑදූ නිර්මාණය ඇගයීම (.........)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

Rev Marikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0150/PE750 - අධ්‍යාපනික මිනුම, තක්සේරුකරණය සහ ඇගයුම

**II කොටස**

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) "අධ්‍යාපනික තක්සේරුකරණය" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(ii) (අ) සාධන පරීක්ෂණ ලකුණු අයත් වන්නේ කුමන මිනුම් කෝදුවකට ද? (පරිමාණයකට ද) (ලකුණු 01යි)

(ආ) එම මිනුම් කෝදුවේ (පරිමාණයේ) විශේෂ ලක්ෂණ දෙකක් හඳුන්වන්න. (ලකුණු 04යි)

(iii) "ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද වඩාත් වැදගත් වන්නේ සම්භවන ඇගයීම යි." ඔබේ අත්දැකීම් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

02. (i) බ්ලූම්ගේ සංශෝධිත (ඇන්ඩර්සන්ගේ) ප්‍රජානන වර්ගීකරණයෙහි මට්ටම් හය අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03යි)

(ii) උපදේශන අරමුණු සහ ඉගෙනුම් පල අතර වෙනස උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ඔබ උගන්වන විෂයයට අදාළ නිපුණතා මට්ටමක් සඳහන් කර, එම නිපුණතා මට්ටම ගොඩනැංවීමට උචිත ඉගෙනුම් පල තුනක් ප්‍රධාන ක්ෂේත්‍ර තුන යටතේ ගොඩනගන්න. (ලකුණු 08යි)

03. "ඉගෙනුම් පලයක් ලෙස එක් එක් ශිෂ්‍යයා අත්පත් කරගත් සාධන මට්ටම් හා චර්යාමය වෙනස්කම් මැන බැලීමට මිනුම් උපකරණ භාවිත කෙරේ."

(i) පරීක්ෂණ උපකරණයක් ලෙස වාචික පරීක්ෂණවල ප්‍රබලතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) සාධනය මැනීම සඳහා තේරීම් වර්ගයේ වාස්තවික පරීක්ෂණ යොදා ගැනීමෙන් ගුරුවරයාට අත්වන වාසි තුනක් හා අවාසි දෙකක් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

අ.පි.බ.



Rev Manikwela Sirirathana Thero

(iii) "පාසලේ දී කිසිදින උපස්තම්භනයක් නොලැබූ මහේෂ් සිරිවීර ද්විතීයික පාසල හැර ගිය නමුත් හොඳ මඟපෙන්වන්නකු හමුවීමෙන් පසුකාලෙක ඉතා සාර්ථක ගත් කතුවරයකු විය. මෑතක දී රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වූ ඔහු ප්‍රකාශ කළේ තම නිර්මාණාත්මක ප්‍රකාශන හැකියා ඉදිරිපත් කළ හැකි පරීක්ෂණයකට තමාට කිසිදු අවස්ථාවක් නොලැබුණු බව යි."

(අ) මහේෂ් සිරිවීර අපේක්ෂා කළ, නිර්මාණාත්මක ප්‍රකාශන හැකියා එළි දැක්විය හැකි සාධන පරීක්ෂණ ප්‍රභේදය සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ඉහත පරීක්ෂණ ප්‍රභේදයේ ප්‍රබලතා දක්වා, මහේෂ් සිරිවීර වැනි දරුවන් ඇගයීම සඳහා ගුරුවරයාට එම පරීක්ෂණ ප්‍රභේදය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

04. "හොඳ මිනුම් උපකරණයක අනිවාර්යයෙන් තිබිය යුතු ගුණාංග ලෙස වලංගුතාව, විශ්වසනීයතාව හා ප්‍රායෝගික බව හැඳින්විය හැකි ය."

(i) මිනුම් උපකරණයක ප්‍රායෝගික බව යන්න හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) ජාතික මට්ටමේ පිළිතුරු පත් ඇගයීමේ දී විශ්වසනීයතාව වර්ධනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) මිනුම් උපකරණයක විෂය මූලික වලංගුතාව ආරක්ෂා කර ගැනීම සඳහා සුවිශේෂණ වගුව (නිල්පත) යොදා ගත හැකි ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

05. (i) කේන්ද්‍රික ප්‍රවණතා මිනුමක් වශයෙන් මාතයට හා මධ්‍යස්ථයට වඩා වැඩි වැදගත්කමක් මධ්‍යන්‍යයට හිමි වේය යන මතය තහවුරු කරන කරුණු තුනක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 03යි)

(ii) පහත දැක්වෙන්නේ පාසලක 11 ශ්‍රේණියේ සිසුන් 50 දෙනෙක් III වාර පරීක්ෂණය සඳහා ගණිත විෂයයට හිමි කරගත් ලකුණු ව්‍යාප්තියකි.

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 80 – 84 | 02 |
| 75 – 79 | 03 |
| 70 – 74 | 04 |
| 65 – 69 | 05 |
| 60 – 64 | 06 |
| 55 – 59 | 08 |
| 50 – 54 | 07 |
| 45 – 49 | 06 |
| 40 – 44 | 05 |
| 35 – 39 | 04 |

මාත පන්තියේ මැදි අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස සලකා සිසුන්ගේ ලකුණුවල මධ්‍යන්‍යය සොයන්න. ඒ සඳහා $\bar{X} = A + i\left(\frac{\sum fd}{n}\right)$ සූත්‍රය යොදා ගන්න. (ලකුණු 05යි)

අ.පි.බ.



Rev Manawela Sirirathana Thero

(iii) (අ) ලකුණු ව්‍යාප්තියේ සම්මත අපගමනය සොයන්න. (ලකුණු 05යි)

සම්මත අපගමනය සඳහා $SD = i\sqrt{\left(\frac{\sum fd^2}{n}\right) - \left(\frac{\sum fd}{n}\right)^2}$

(ආ) ලකුණුවල මධ්‍යනය සහ සම්මත අපගමනය ඇසුරෙන් අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල පිළිබඳ පුරෝකථනය කරන්න. (ලකුණු 03යි)

06. (i) අමු ලකුණු ක්‍රමවත් ආකාරයට සංවිධානය කිරීමේ ප්‍රයෝජන තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 03යි)

(ii) සංඛ්‍යාත ව්‍යාප්ති වගුවක් සඳහා පන්ති ප්‍රාන්තර තීරණය කිරීමේ දී ඔබ විසින් අවධානය යොමු කළ යුතු කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) පහත දැක්වෙන්නේ ගුරු සිසුන් සමූහයක් පශ්චාත් උපාධි පරීක්ෂණයක දී අධ්‍යාපන මිනුම, තක්සේරුකරණය සහ ඇගයුම සඳහා ලබා ගත් ලකුණු ව්‍යාප්තියකි.

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 90 – 95 | 05 |
| 85 – 89 | 06 |
| 80 – 84 | 07 |
| 75 – 79 | 08 |
| 70 – 74 | 09 |
| 65 – 69 | 07 |
| 60 – 64 | 05 |
| 55 – 59 | 02 |
| 50 – 54 | 01 |

(අ) ඉහත සංඛ්‍යාත ව්‍යාප්තිය ඇසුරෙන් ජාල රේඛය ගොඩනගන්න. (ප්‍රස්තාර කඩදාසි භාවිත කරන්න.) (ලකුණු 05යි)

(ආ) සංඛ්‍යාත ව්‍යාප්තිය හා ජාල රේඛය ඇසුරින් ශිෂ්‍ය සාධනය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 03යි)

07. පහත දැක්වෙන්නේ විද්‍යාල්පතිවරුන් ලෙස තෝරා ගැනීමේ පරීක්ෂණයක සිද්ධි අධ්‍යයනය පිළිතුරු පත් ලකුණු කිරීමේ දී පරීක්ෂකවරුන් දෙදෙනෙක් අපේක්ෂකයින් 10 දෙනකුට පිරිනැමූ ලකුණු වේ.

| ශිෂ්‍යයා | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පළමු පරීක්ෂකගේ ලකුණු X | 70 | 75 | 85 | 60 | 65 | 60 | 75 | 75 | 60 | 85 |
| දෙවන පරීක්ෂකයගේ ලකුණු Y | 62 | 65 | 68 | 54 | 60 | 54 | 65 | 65 | 54 | 68 |

(i) ඉහත ලකුණුවලට අදාල විසිරි තිත් සටහන අඳින්න. (ප්‍රස්තාර කඩදාසි භාවිත කරන්න.) (ලකුණු 03යි)

(ii) ස්පියර්මන් තරා පරිපාටි ක්‍රමය භාවිත කර, ලකුණු කාණ්ඩ දෙක අතර සහසම්බන්ධතාව ගණනය කරන්න.

$r = 1 - \left(\frac{6\sum d^2}{n(n^2 - 1)}\right)$ සූත්‍රය යොදා ගන්න. (ලකුණු 08යි)

අ.පි.බ.



Rev. Manikwela Sirirathana Thero

(iii) (අ) ඉහත පරිදි සහසම්බන්ධතා සංගුණකය ගණනය කිරීමෙන් නිරූපණය වන්නේ පරීක්ෂකවරුන්ගේ කිනම් ගුණාංගයක් ද? (ලකුණු 02යි)

(ආ) ඔබ ගණනය කර ලබා ගත් සංගුණක අගය අනුව පරීක්ෂකවරුන් දෙදෙනාගේ ලකුණු පැවරීම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 03යි)

08. "ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇගයීම් සංස්කෘතියක සිට තක්සේරු සංස්කෘතියකට මාරු කිරීම පාසල පදනම් කරගත් තක්සේරු වැඩපිළිවෙළ හඳුන්වාදීමේ එක් අරමුණකි."

(i) ඇගයීම් සංස්කෘතියක සිට තක්සේරු සංස්කෘතියකට මාරුවීමේ දී ඉගෙනුම්-ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලියේ සිදුවන වෙනස්කම් තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 03යි)

(ii) පාසල පදනම් කරගත් තක්සේරු වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් සඳහන් කර, එම ගැටලුවලට ඔබ මුහුණ දුන් ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05යි)

(iii) පාසල පදනම් කරගත් තක්සේරු වැඩ පිළිවෙළක දී, ශිෂ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා ධ්‍රැවක ප්‍රස්තාරය යොදා ගත හැකි ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 08යි)

*********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

656

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016**
**පුනර් පරීක්ෂණය - 2018**

**PE0150/PE750** | **අධ්‍යාපනික මිනුම, තක්සේරුකරණය සහ ඇගයීම**
**EDUCATIONAL MEASUREMENT, ASSESSMENT & EVALUATION**

2018.12.29 | පැය 0900 - පැය1200 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

---

විභාග අංකය:...............................................

### I කොටස

**වඩාත් ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. අධ්‍යාපනික තක්සේරුව යොදා ගැනීම තුළින් ගුරුවරයකු ප්‍රධාන වශයෙන් ම බලාපොරොත්තු වන්නේ පහත කුමන අරමුණ ඉටු කර ගැනීමට ද?
 1. සිසුන්ගේ ප්‍රගතිය පරීක්ෂා කිරීම
 2. තම ඉගෙනුම් ක්‍රමවල අඩුපාඩු සකසා ගැනීම
 3. ඉලක්කයක් කරා යෑමට ශිෂ්‍යයාට උදව් දීම
 4. තම සිසුන්ගේ ප්‍රජානන හැකියා හඳුනා ගැනීම (..........)

02. නිරපේක්ෂ ශූන්‍යයක් ඇති මිනුමකට උදාහරණයක් වන්නේ පහත කුමන අවස්ථාවක් හා සම්බන්ධ මිනුමක් ද?
 1. පන්තියේ සිසුන්ගේ ගණිත සාධනය මැනීම
 2 පන්තියේ සිසුන්ගේ බර මැනීම
 3. පන්තියේ සිසුන්ගේ බුද්ධිය මැනීම
 4. පාසල කෙරෙහි ඇති ශිෂ්‍ය ආකල්ප මැනීම (..........)

අ.පි.බ.

Rev Monkuwela Sirirathana Thero

03. පූර්ව සාධන මූලික ඇගයුමෙහි දැකිය හැකි ලක්ෂණයක් අන්තර්ගත වන්නේ පහත කුමන පිළිතුරෙහි ද?

1. ශිෂ්‍යයාගේ වත්මන් සාධන මට්ටම ඔහුගේ/ආයතනයේ මුලින් පැවති සාධනය හා සැසඳීම
2. ශිෂ්‍යයාගේ වත්මන් සාධනය පන්තියේ අනෙක් සිසුන්ගේ සාධනය හා සැසැඳීම
3. ශිෂ්‍යයාගේ පූර්ව සාධනය පන්තියේ අනෙක් සිසුන්ගේ සාධනය සමඟ සැසඳීම
4. ශිෂ්‍යයාගේ වත්මන් සාධන මට්ටම තුළින් ඔහුගේ/ආයතනයේ අනාගත සාධනය පිළිබඳ තීරණ ගැනීම (..............)

04. සම්පිණ්ඩිත ඇගයීමේ ක්‍රියාවලිය අධ්‍යාපන ක්‍රියාවලියට උපකාර වන්නේ පහත කුමන ආකාරයෙන් ද?

1. ඉගෙන ගන්නා අතරතුර ශිෂ්‍යයා විමසීමට ලක් කිරීම තුළින් උදව් වීමෙන්
2. ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලිය විමසමින් ගුරුවරයාට උදව් වීමෙන්
3. ශිෂ්‍ය සාධනය සමාලෝචනය කර ගුරු කාර්යක්ෂමතාව නිගමනය කිරීම තුළින්
4. නිර්ණායක භාවිතයෙන් ශිෂ්‍යයාට අඛණ්ඩ ප්‍රතිපෝෂණය ලබා දීම මගින් (..........)

05. පහත A කොටසේ දක්වා ඇති "පරීක්ෂණ වර්ග" හා සම්බන්ධ B කොටසේ ඇති "ලක්ෂණ" නිවැරදි ව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A කොටස | | B කොටස | |
|---|---|---|---|
| (අ) | බහුවරණ | 1. | ප්‍රබෝධක ප්‍රතිචාර |
| (ආ) | රචනා | 2. | තෝරීම් වර්ගය |
| (ඇ) | ඇඳීම | 3. | පුද්ගල බද්ධ බව |
| (ඈ) | කෙටි පිළිතුරු ලිවීම | 4. | වික්ෂේප |
| (ඉ) | දෙවරණ | 5. | සැපයීම් වර්ගය |
| | | 6. | විෂය වලංගුතාව |

1. (අ) - 4, (ආ) - 3, (ඇ) - 1, (ඈ) - 5, (ඉ) - 2
2. (අ) - 2, (ආ) - 5, (ඇ) - 6, (ඈ) - 5, (ඉ) - 1
3. (අ) - 5, (ආ) - 3, (ඇ) - 2, (ඈ) - 6, (ඉ) - 4
4. (අ) - 4, (ආ) - 3, (ඇ) - 6, (ඈ) - 5, (ඉ) - 1 (..........)

06. ආවේදන ක්ෂේත්‍රයේ වර්ගීකරණයෙහි "වරිතායනය" යන මට්ටමට අදාළ ඉගෙනුම් පල විදහාපාන ප්‍රකාශය තෝරන්න.

1. උගත් ක්‍රියාකාරකම්ක් ඉතා ඉහළ මට්ටමකින් කර පෙන්වයි.
2. ශිෂ්‍යයා තම සාධන මට්ටම පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබයි.
3. පරිසරයේ ඇති විවිධ සාරධර්ම කෙරෙහි සිත යොමු කරයි.
4. තමා විසින් ගොඩනගා ගත් අගයයන් මත කටයුතු කරයි. (..........)

07. ප්‍රජානන ක්ෂේත්‍ර වර්ගීකරණය ආශ්‍රිත පහත ඉගෙනුම් පලවලට අදාළ එම වර්ගීකරණයේ දළ මට්ටම නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(අ) ශිෂ්‍යයා දී ඇති ඡේදය කියවා එහි ඇති විශේෂණ පද වෙන් කර ලියයි.
(ආ) දී ඇති මාතෘකාවට අනුව ශිෂ්‍යයා රචනයක් ලියයි.
(ආ) ප්‍රස්තාරයේ අඩංගු දෑ වචනයෙන් විස්තර කරයි.
(ඇ) සතුන් ජීවත්වන ස්ථාන අනුව වර්ගීකරණය කර දක්වයි.

1. විශ්ලේෂණය, අවබෝධය, දැනුම, භාවිතය
2. ඇගැයීම, විශ්ලේෂණය, අවබෝධය, දැනුම
3. විශ්ලේෂණය, සංස්ලේෂණය, අවබෝධය, දැනුම
4. දැනුම, විශ්ලේෂණය, ඇගැයුම, අවබෝධය (........)

අ.පි.බ.

Rev Manikwela Siirathana Thera

08. සාධන පරීක්ෂණ මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන අරමුණ වඩාත් හොඳින් දැක්වෙන අවස්ථාව කුමක් ද?

1. ශිෂ්‍යයා උගත් දෑ පිළිබඳ තීරණ ගැනීමට
2. ශිෂ්‍යයාගේ බුද්ධි ඵලය පිළිබඳ අවබෝධ කර ගැනීමට
3. ශිෂ්‍යයාට ඉගෙනීමට ඇති හැකියාව විමසීමට
4. ශිෂ්‍යයාගේ අනාගත කාර්ය සාධනය හඳුනා ගැනීමට (..........)

09. වාස්තවික වර්ගයේ පරීක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. බහුවරණ, ව්‍යුහගත, විවෘත ග්‍රන්ථ, ඇඳීම
2. දෙවරණ, ඇඳීම, රචනා, කෙටි පිළිතුරු ලිවීමේ ප්‍රශ්න
3. ඇඳීම, බහුවරණ, ව්‍යුහගත, රචනා
4. බහුවරණ, දෙවරණ, ඇඳීම, කෙටි පිළිතුරු ලිවීමේ ප්‍රශ්න (..........)

10. බහුවරණ වනුවක දුෂ්කරතා දර්ශකයෙහි අගය +0.78ක් ද විභේදනතා දර්ශකය +0.30ක් ද වූයේ නම් එම වනුව පිළිබඳ නිවැරදි අර්ථකථනය කුමක් ද?

1. තරමක් පහසු ප්‍රශ්නයක් වන මෙයින් සාර්ථක ලෙස දක්ෂයින් වෙන් නො කරයි.
2. ඉතා පහසු ප්‍රශ්නයක් වුව ද සාර්ථක ව දක්ෂ, අදක්ෂ අය වෙන් කරයි.
3. ඉතා අපහසු වූ එම ප්‍රශ්නය මගින් දක්ෂ, අදක්ෂ අය සාර්ථක ව වෙන් කරයි.
4. මධ්‍යස්ථ ලෙස දුෂ්කර වූ මෙම වනුව මගින් සාර්ථක ව දක්ෂයින් වෙන් කරයි. (..........)

11. පරීක්ෂණයක විෂය කරුණු මූලික වලංගුතාව ආරක්ෂා කිරීම සඳහා පරීක්ෂණයක් සැකසීමේ දී යොදා ගන්නා ක්‍රමවේදය වන්නේ,

1. වනු විශ්ලේෂණය කොට වනුවල නිවැරදි බව තහවුරු කිරීම
2. ප්‍රශ්න සැකසීම සඳහා උචිත විෂය විශේෂඥයින් යොදා ගැනීම
3. නිල්පත සැකසීම මගින් ප්‍රශ්න පත්‍රය සැකසීම
4. සැකසූ ප්‍රශ්න පත්‍රය නියැදියකට ලබා දී ප්‍රතිචාර ලබා ගැනීම (..........)

12. පරීක්ෂණයක විශ්වසනීයතාව ගණනය කිරීම සඳහා පරීක්ෂණ ප්‍රතිපරීක්ෂණ ක්‍රමය යොදා ගැනීම අසාර්ථක වන්නේ පහත කුමන හේතු නිසා ද?

1. එකම ආකාරයේ පරීක්ෂණ දෙකක් සැකසීමේ අපහසුව
2. යොදා ගන්නා කණ්ඩායම් දෙක විෂම වීම
3. පරීක්ෂණ අවස්ථා දෙක අතර දී සිසුන් ඉගෙනීම
4. පරීක්ෂණ දෙක අතර වෙනස්කම් පැවතීම (..........)

13. බහුවරණ වනු විශ්ලේෂණ පියවර අනුපිළිවෙළින් පහත දැක්වේ. වඩා නිවැරදි අනුපිළිවෙළට සැකසූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

A පිළිතුරු පත් ලකුණු කිරීම
B දර්ශක ගොඩනැගීම
C එක් එක් වනුවේ වරණ තේරූ ආකාරය වගුගත කිරීම
D සැකසූ ප්‍රශ්න පත්‍රය පිළිතුරු ලිවීම සඳහා ලබා දීම
E ඉහළ, මැද, පහළ වශයෙන් පිළිතුරු පත් වෙන් කිරීම

1. D, A, C, E, B 2. D, A, E, C, B
3. A, D, C, E, B 4. D, A, B, C, E (..........)

අ.පි.බ

Rev. Manikwela Siriathana Thero

14. ලකුණු අර්ථකථනයේ දී ව්‍යාප්තික විසිරීම පිළිබඳ හඳුනා ගැනීමට අදාළ වන මිනුම් පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

1. මාතය, පරාසය, සම්මත අපගමනය
2. චතුර්ථක, මාතය, පරාසය
3. පරාසය, සම්මත අපගමනය, අන්තර් චතුර්ථක පරාසය
4. ප්‍රතිශත, මාතය, අන්තර් චතුර්ථක පරාසය (..........)

15. සාමූහික සංඛ්‍යාත ව්‍යාප්තියක් පිළියෙල කිරීමේ ප්‍රයෝජනයක් **නොවන්නේ,**

1. ප්‍රස්තාර නිර්මාණයට පහසු වීම
2. සිසුන්ගේ විශේෂ හැකියා හඳුනා ගැනීම
3. විශාල මිනුම් සංඛ්‍යාවක් සාරාංශ කිරීම
4. විවිධ මිනුම් ගණනය කිරීම පහසු වීම (..........)

16. ඔගිව්ය නිර්මාණය කිරීමෙන් ලබා ගත හැකි මිනුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න

1. ප්‍රතිශතක තරා, චතුර්ථක, මධ්‍යස්ථය
2. ප්‍රතිශතක තරා, මාතය, මධ්‍යස්ථය
3. චතුර්ථක, ප්‍රතිශතක, මධ්‍යනය
4. මාතය, මධ්‍යනය, චතුර්ථක (..........)

17. සංඛ්‍යාත බහුඅස්‍රය නිර්මාණය කිරීම තුළින් පන්තියේ සාධන මට්ටම පිළිබඳ ලබා ගත හැකි තොරතුරක් **නොවන්නේ,**

1. ව්‍යාප්තියේ කුටිකතාව හඳුනා ගැනීම
2. ලකුණුවල මධ්‍යනය හඳුනා ගැනීම
3. ලකුණුවල මාතය හඳුනා ගැනීම
4. ලකුණුවල විසිරීම පිළිබඳ හඳුනා ගැනීම (..........)

18. අර්ධ අන්තර් චතුර්ථක පරාසය සෙවීම සඳහා යොදා ගන්නා නිවැරදි සූත්‍රය තෝරන්න.

1. $\frac{Q_2 - Q}{2}$
2. $\frac{Q_3 - Q_1}{2}$
3. $\frac{Q_1 - Q_2}{2}$
4. $\frac{Q_3 - Q_2}{2}$ (..........)

19. ප්‍රමත ව ව්‍යාප්ත වූ ලකුණු පේළියක +0.5 යන ප්‍රමිත ලකුණ හල් පරිමාණයට පරිවර්තනය කළ විට අගය වනුයේ,

1. 55 ය.
2. 54 ය.
3. 61 ය.
4. 57 ය. (..........)

20. පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලියේ දී යොදා ගන්නා "ශිෂ්‍ය පැතිකඩ" මගින් ලබා ගත හැකි ප්‍රයෝජනය මින් කවරක් ද?

1. ශිෂ්‍ය පිරිසක් යම් කාලයක් තුළ විෂයයක දී ලබා ගත් ප්‍රගතිය දැක්වීමට
2. ශිෂ්‍යයකු කාලයක් තුළ දී යම් විෂයයක දී ලබා ගත් ප්‍රගතිය හඳුනා ගැනීමට
3. ශිෂ්‍යයකු යම් කාලයක් තුළ දී විෂයයක දී ලබා ගත් ප්‍රගතිය බැලීමට
4. ශිෂ්‍ය කණ්ඩායමක් කාලයක් තුළ දී විෂය කීපයක දී ලබා ගත් ප්‍රගතිය දැක්වීමට (..........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

Rev Manikwela Sirirathana Thero

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0150/PE750 - අධ්‍යාපනික මිනුම, තක්සේරුකරණය සහ ඇගයුම

**II කොටස**

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) "අධ්‍යාපන මිනුම" යන්න අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන මිනුම, අධ්‍යාපන ඇගයුම හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධ්‍යාපනික ඇගයුම ගුරු-සිසු දෙපාර්ශ්වයට ම ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. (i) නිර්ණායක මූලික ඇගැයුම යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ශිෂ්‍ය ඇගැයුම සඳහා නිර්ණායක භාවිතය වැදගත් වන ආකාරය උදාහරණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අධ්‍යාපන තක්සේරුකරණයේ දී යොදා ගන්නා ඇගයීම් ක්‍රමශිල්ප දෙකක් දක්වා, ශිෂ්‍ය සංවර්ධනය තක්සේරුවේ දී ඒවායේ ඇති ප්‍රබලතා පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) ශිෂ්‍ය සංවර්ධනයේ දී සලකා බලන ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ හඳුනා ගත් නිශ්චිත පාඩමක් සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර තුන නියෝජනය කෙරෙන ඉගෙනුම් පල තුනක් ලියා දක්වා, එම ඉගෙනුම් පල ඇගයීම සඳහා ආකාර තුනක වාස්තවික වනු තුනක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍ය සාධනය ඇගයීමේ දී වාස්තවික පරීක්ෂණ වල ප්‍රබලතා හා සීමා දක්වා, ද්විතීයික ශ්‍රේණිවල ඇගයීම සඳහා වාස්තවික පරීක්ෂණ යොදා ගැනීමේ වැදගත්කම තුලනය කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

04. (i) ප්‍රශ්න පත්‍රයක් සැකසීමේ දී පිරික්සෙන්නා වෙත අනිවාර්යයෙන් ලබා දිය යුතු පොදු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පරීක්ෂණයක මතුපිට වලංගුතාව ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) වනුවක "වික්ෂේප සංශෝධනය" යන්න හඳුන්වා, එහි දී සලකා බලන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. (i) කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් නම් කරන්න. (ලකුණු 03)

පහත දැක්වෙන්නේ සිසුන් 50 දෙනකු ගණිත විෂයය සඳහා ලබාගත් ලකුණු ආශ්‍රයෙන් සැකසූ සංඛ්‍යාත ව්‍යාප්තියකි.

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 65-69 | 2 |
| 60-64 | 3 |
| 55-59 | 4 |
| 50-54 | 7 |
| 45-49 | 8 |
| 40-44 | 10 |
| 35-39 | 6 |
| 30-34 | 5 |
| 25-29 | 3 |
| 20-24 | 2 |

(ii) මාත පන්තියේ මැදි අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස සලකා සිසුන්ගේ ලකුණුවල මධ්‍යන්‍යය සොයන්න. ඒ සඳහා $\bar{X} = A + i\left(\frac{\Sigma fd}{n}\right)$ සූත්‍රය යොදා ගන්න. (ලකුණු 05)

(iii) (අ) ලකුණු ව්‍යාප්තියේ සම්මත අපගමනය සොයන්න. (ලකුණු 05)

ඒ සඳහා $SD = i\sqrt{\left(\frac{\Sigma fd^2}{n}\right) - \left(\frac{\Sigma fd}{n}\right)^2}$ යන සූත්‍රය යොදා ගන්න.

(ආ) ලකුණුවල මධ්‍යන්‍යය සහ සම්මත අපගමනය ආශ්‍රයෙන් සිසුන්ගේ ගණිත සාධනය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 03)

06. (i) පහත දැක්වෙන ප්‍රස්තාර නිර්මාණයේ දී තිරස් අක්ෂයට යොදා ගන්නා අගයන් දක්වන්න.

(අ) ජාල රේඛය (ආ) සංඛ්‍යාත බහුඅස්‍රය

(ඇ) ඔගිව්ය (ලකුණු 03)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

(ii) පහත දැක්වෙන්නේ පාසලක 9 ශ්‍රේණියේ සිසුන් 50 දෙනකු තම දෙවන වාර පරීක්ෂණයේ දී විද්‍යාව විෂයයට ලබාගත් ලකුණු ආශ්‍රයෙන් සැකසූ සංඛ්‍යාත ව්‍යාප්තියකි.

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 80-84 | 3 |
| 75-79 | 5 |
| 70-74 | 4 |
| 65-69 | 7 |
| 60-64 | 8 |
| 55-59 | 6 |
| 50-54 | 5 |
| 45-49 | 6 |
| 40-44 | 4 |
| 35-39 | 2 |
| එකතුව | 50 |

ඉහත සංඛ්‍යාත ව්‍යාප්තිය ආශ්‍රයෙන් ජාල රේඛය නිර්මාණය කරන්න.
(ප්‍රස්තාර කඩදාසි භාවිත කරන්න.) (ලකුණු 05)

(iii) (අ) ඉහත ඔබ නිර්මාණය කළ ජාල රේඛය ආශ්‍රයෙන් සිසුන්ගේ වසර මැද විද්‍යා විෂයය සාධනය පිළිබඳ අදහස් දක්වා, අවසාන පරීක්ෂණයේ දී විෂය සාධනය පිළිබඳ පුරෝකථන ඉදිරිපත් කරන්න. ගුරුවරයාට සුදුසු උපදෙස් ලබා දෙන්න. (ලකුණු 05)

(ආ) ප්‍රස්තාර මගින් ලකුණු නිරූපණය කිරීමේ වාසි මොනවා ද? (ලකුණු 03)

07. (i) පහත දැක්වෙන සහසම්බන්ධතා සංගුණකවලට අදාළ දළ විසිරි තිත්සටහන් නිර්මාණය කරන්න.

(අ) 0 (ආ) +1.0 (ඇ) -1.0 (ලකුණු 03)

(ii) පහත දැක්වෙන්නේ සිසුන් 10 දෙනකු පාසලේ දී ගණිතය හා විද්‍යාව යන විෂයයන් දෙක සඳහා ලබා ගත් ලකුණු දැක්වෙන වගුවකි.

| සිසුා නම | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාව ලකුණු X | 84 | 85 | 90 | 68 | 60 | 55 | 48 | 46 | 45 | 36 |
| ගණිතය ලකුණු Y | 75 | 85 | 88 | 65 | 73 | 82 | 82 | 60 | 40 | 40 |

මෙම ලකුණු කාණ්ඩ දෙක අතර සහසම්බන්ධතා සංගුණකය ස්පියර්මන් තරා පටිපාටි ක්‍රමය යොදාගෙන ගණනය කරන්න. ඒ සඳහා

$$r = 1 - \left(\frac{6\sum d^2}{n(n^2-1)}\right)$$

යන සූත්‍රය යොදා ගන්න. (ලකුණු 05)

(iii) (අ) ඉහත ලකුණු කාණ්ඩ දෙක අතර සහසම්බන්ධතාව දැක්වීමට විසිරි තිත් සටහන් නිර්මාණය කරන්න. (ලකුණු 04)

අ.පි.බ.



Rev Mankuela Siriwathana Thero

(ආ) ඉහත ගණනය කළ සහසම්බන්ධතා සංගුණකය හා නිර්මාණය කළ විසිරි තින් සටහන ඇසුරෙන් විද්‍යාව හා ගණිතය ලකුණු අතර සබඳතාව පැහැදිලි කරන්න. (ලකුණු 04)

08. පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලියේ දී පාසල ශිෂ්‍ය තක්සේරුකරණ ක්‍රියාවලියේ වැදගත් ස්ථානයක් වේ.

(i) තක්සේරුකරණ සංස්කෘතියකට ආවේණික ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) පාසල් පාදක තක්සේරුවේ දී "ශිෂ්‍ය ඉගෙනුම" සංවර්ධනය සඳහා ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05)

(iii) "තක්සේරුකරණ සංස්කෘතියක දී ශිෂ්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ස්ථාපිත වේ." මෙම අදහස සාර්ථක කර ගැනීමට නූතනයේ දී පාසල් පාදක තක්සේරුව කොතරම් සමත් වී ඇද්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

*********

Rev Manikwela Sirirathana Thera

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016
## අවසාන පරීක්ෂණය 2017

**PE0160/PE760** | **අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය**
**EDUCATIONAL LEADERSHIP & MANAGEMENT**

2017.03.04 | පැය 1300 - පැය 1600 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:.................................

### I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. කළමනාකරුවකුගේ හා නායකයකුගේ කාර්යයන් අතර සමානතා මෙන් ම අසමානතා ද ඇත. කළමනාකරුවකුගෙන් වෙන් කර හඳුනා ගැනීමට ආධාර වන නායකයකු සතු ලක්ෂණය වන්නේ,
    1. සැලසුම් නිවැරදි ව ක්‍රියාත්මක කිරීම යි
    2. සෑම අංශයක ම පාලනය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම යි
    3. නිවැරදි දේ සිදු කිරීමට කටයුතු කිරීම යි
    4. පවතින තත්ත්වය පවත්වාගෙන යාමට කටයුතු කිරීම යි (........)

02. පාසලක සැලසුම් හා සම්බන්ධ ලේඛන ලෙස දැක්විය හැක්කේ,
    1. පන්ති වාර්තා පොත, පාසල් ලිත, පස් අවුරුදු සැලැස්ම
    2. වාර සටහන, කාල සටහන, පස් අවුරුදු සැලැස්ම
    3. ශිෂ්‍ය නාම ලේඛනය, පාඩම් සැලසුම්, අධීක්ෂණ වාර්තා
    4. ගුරු පැමිණීමේ ලේඛනය, වාර්ෂික සැලැස්ම, පස් අවුරුදු සැලැස්ම (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

03. පාසල් සැලසුම්කරණයේ අදියර පහත දී ඇත.

A - ගැටලු විශ්ලේෂණය හා අවශ්‍යතා හඳුනා ගැනීම

B – වාර්ෂික සැලසුම් සැකසීම

C – චක්‍රලේඛ උපදෙස් අනුව පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම

D – ව්‍යාපෘති සැලසුම් කිරීම

නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1. ABCD  2. BACD

3. ACBD  4. CDAB (........)

04. ගුණපාල මහතා අවුරුදු 28ක් අඛණ්ඩ ව සේවය කර නියමිත වැටුප් වර්ධක උපයා ගත් ගුරුවරයෙකි. නමුත් ඔහුගේ වැටුපේ යම් ගැටලුවක් ඇති බව ඔහුට පෙනිණ. මෙම ගැටලුව පිළිබඳ විමසා බැලීමට ඔහු පරිශීලනය කළ යුතු මූලාශ්‍ර මොනවා ද?

1. මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය
2. ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා ආයතන සංග්‍රහය
3. මුදල් රෙගුලාසි හා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය
4. ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා ගුරු වැටුප් සංශෝධන සම්බන්ධ අදාළ චක්‍රලේඛ (........)

05. 1987 දී සිදු කළ 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනය අධ්‍යාපනයට බලපාන නීතියෙහි විශාල වෙනසකට මුල් විය. ඒ අනුව සිදු වූ වෙනස්කමක් ලෙස සැලකීමට නොහැක්කේ,

1. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පිහිටුවීම
2. ඩිප්ලෝමා හා උපාධි ඇති තැනැත්තන් ගුරු සේවයට බඳවා ගැනීමට පළාත් සභාවට බලය ලැබීම
3. 1A, 1B, 1C පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීමට අදාළ පළාත් සභාවට හැකිවීම
4. අදාළ ප්‍රදේශයේ ජාතික පාසල් ඇතුළු නිශ්චිත පාසල් හැර අනෙකුත් රජයේ පාසල්වලට පහසුකම් සැලසීම පළාත් සභාවට අයත් වීම (........)

06. පාසල් මට්ටමේ ප්‍රමිති ඇගයීම් ක්‍රියාවලිය අභ්‍යන්තර ව සිදු කිරීම පාසලේ ගුණාත්මක සංවර්ධනය කෙරෙහි ආධාර වේ. මෙහි දී මෙම ක්‍රියාවලියට බාධකයක් වන්නේ,

1. ඇගයීම් ක්‍රියාවලියට ගුරු සහභාගිත්වය වැඩි වීම
2. ප්‍රමිතීන් පිළිබඳ ව ගුරු මණ්ඩලයේ සියල්ලන් ම දැනුවත් වීම
3. ප්‍රමිති ඇගයීම් මනාව සකස් කළ ලිපිගොනුවලට සීමා වීම
4. පාසලේ ප්‍රමිති ඇගයීම් ක්‍රියාවලියට අදාළ ගුරුවරුන්ට සීමිත කාලයක් ලබා දීමට සිදු වීම

(........)

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සංවිධාන මට්ටම් නිවැරදි ව අනුපිළිවෙළින් දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.

1. ජාතික, පළාත්, කලාප, කොට්ඨාස, පාසල්
2. පාසල්, කලාප, පළාත් කොට්ඨාස, ජාතික
3. පාසල්, කලාප, කොට්ඨාස, පළාත්, ජාතික
4. ජාතික, පාසල්, පළාත්, කලාප, කොට්ඨාස (........)

අ.පි.බ.

Rev Manikwela Siriwathana Thero

08. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ධනාත්මක ලෙස ගැටුම් අර්ථකථනය කරන අවස්ථාවක් ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

A - ගැටුමකින් කළමනාකරණයේ දුබලතා හෙළි කර ගැනීමෙන් ප්‍රතිසංවිධානයට යොමු හැකි ය.

B - සංවිධානයක ඒකාකාර වාතාවරණය බිඳ හැර මානසික උත්තේජනයක් ඇති වේ.

C - සියලු දෙනා ගැටලුවට අදාල තීතිරීති පිළිබඳ අවධානය යොමු කිරීම නිසා කාර්ය මණ්ඩලයේ ඉගෙනීමක් ඇති වේ.

1. A පමණක් නිවැරදි ය
2. B හා C පමණක් නිවැරදි ය
3. A හා B පමණක් නිවැරදි ය
4. සියල්ල ම නිවැරදි ය (........)

09. පාසල් විෂයමාලාව ප්‍රතිසංස්කරණය සිදු වූ අවස්ථාවක විදුහල්පතිවරයකු වඩා අවධානය යොමු කළ යුත්තේ,

1. සාමාන්‍ය පරිපාලනය කළමනාකරණය කෙරෙහි ය
2. සංවර්ධනාත්මක කළමනාකරණය කෙරෙහි ය
3. වෙනස්වීම් කළමනාකරණය කෙරෙහි ය
4. කාර්ය සාධන කළමනාකරණය කෙරෙහි ය (........)

10. පුද්ගලයින් විසින් විවිධ නායකත්ව ශෛලීන් දක්වා ඇත. මේ ඇසුරෙන් විදුහල්පති නායකත්වය සඳහා සුදුසු ශෛලිය තෝරන්න.

1. ජේකොබ් ගෙට්සෙල් (Jecob Getzel) දක්වන ආයතන ශෛලිය
2. කර්ට් ලෙවින් (Kert Levin) දක්වන ප්‍රජාතන්ත්‍රවාදී ශෛලිය
3. රොබට් හවුස් (Robert House) දක්වන සාධන කේන්ද්‍රීය නායකත්ව ශෛලි ය
4. අවස්ථාව අනුව ශෛලිය වෙනස් කරමින් පවත්වන නායකත්ව ශෛලිය (........)

11. ගුරු නිවාඩු සම්බන්ධ ඉල්ලුම් පත්‍රයක්/ලේඛනයක් නොවන්නේ කුමක් ද?

1. පොදු 125 2. පොදු 35 3. පොදු 126 4. පොදු 5 (........)

12. පාසල් ප්‍රජා සම්බන්ධතා පාසල් සංවර්ධනය හා ප්‍රජා සංවර්ධනය සඳහා ද ප්‍රයෝජනවත් වේ. එසේ වුව ද පාසල මගින් ප්‍රජා සම්බන්ධතා මනා සැලකිල්ලෙන් කළමනාකරණය කළ යුතු වීමට වඩාත් වැදගත් හේතුව කුමක් ද?

1. ප්‍රජාව සතු විවිධ දැනුම්, කුසලතා හා සම්පත් පාසලට ලබා ගැනීමට
2. විවිධ ව්‍යාපාර හා විවිධ සේවාවන්හි සහය පාසල වෙත යොමු කරවීමට
3. පාසලෙන් ප්‍රජාවට ලබා දිය හැකි උපරිම දායකත්වය සැලසීමට
4. ප්‍රජාවෙන් පාසලට ඇතිවිය හැකි අහිතකර බලපෑම්වලින් වැලකී සිටීමට (........)

13. උපාලි මහතා පශ්චාත් උපාධිධාරී, ගුරු සේවය I ට අයත් ගුරුවරයෙකි. එම පාසලෙන් පත් කරන ලද සහකාර විදුහල්පතිවරයකු වන ගුරු සේවය II ට අයත් පුහුණු ගුරුවරයකු වන ධම්මික මහතා උපාලි මහතාගේ පාඩම් අධීක්ෂණයට පැමිණි විට, ධම්මික මහතාට ම එම පාඩම කරගෙන යාමට පවසා උපාලි මහතා තම අවශ්‍යතාවක් පවසා පන්තියෙන් පිටතට යාමෙන් අධීක්ෂණය පිළිබඳ තම අකමැත්ත දක්වන ලදී. මෙම සිද්ධිය ගැන පැවසිය හැක්කේ,

1. පුද්ගල සම්බන්ධතා ගැටුමක් ඇති බව ය
2. සාරධර්ම ගැටුමක් ඇති බව ය
3. ව්‍යුහමය ගැටුමක් ඇති බව ය
4. අවශ්‍යතා ගැටුමක් ඇති බව ය

(........)

අ.පි.බ.

Rev Manikwela Seirathana Thero

14. පාසල් සංවිධානය තුළ ගුරු නායකත්ව භූමිකාව පැහැදිලි ව දක්වන්නේ කුමන ප්‍රකාශය ද?

1. ශික්ෂණ විද්‍යාත්මක නායකත්වය
2. කාර්ය විමධ්‍යගත කිරීම හා නියාමන නායකත්වය
3. වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීමේ නායකත්වය
4. සිසුන්ගේ සාධන මට්ටම් දියුණු කිරීමේ නායකත්වය (........)

15. දිලිස්ත නීතියෙන් පාසල් දරුවන්ට බලපාන නීති ප්‍රතිපාදන දක්වන ප්‍රකාශය කුමක් ද?

1. ළමුන්ට ශාරීරික දඬුවම් පැමිණවීම වැළැක්වීම
2. සුපරීක්ෂාකාරීත්වයෙන් සුරක්ෂිත භාවය තහවුරු කිරීම
3. දරුවන්ට සිදුවන අපරාධ වැළැක්වීම
4. දරුවන් අපයෝජනයට ලක්වීම නවතාලීම (........)

16. ඵලදායී පාසලක ලක්ෂණ දැක්වෙන ප්‍රකාශය කුමක් ද?

1. පාසලේ අරමුණු වැඩි ප්‍රමාණයක් ඉටු කර ගැනීම
2. ප්‍රජාව, නිලධාරීන්, දේශපාලකයන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම
3. සිසුන් විභාග සමත්වීමේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම
4. අභ්‍යන්තර කාර්ය මණ්ඩලය තම කාර්යයන් හොඳින් ඉටු කිරීම (........)

17. පාසලක ක්‍රමවත් සංවිධාන ව්‍යුහයක් තිබීමෙන් ලබා ගත හැකි වාසියක් **නොවන්නේ,**

1. සමස්ත කාර්යක්ෂමතාව වැඩිවීම
2. කාර්ය මණ්ඩල වගකීම් හා වගවීම් සම තත්ත්වයට පැමිණීම
3. කාර්ය මණ්ඩල අනන්‍යතාව පැහැදිලි වීම
4. තනතුරු අතර වැඩ අධීක්ෂණය පහසු වීම (........)

18. පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියෙහි නිරත ගුරුවරයකු අනුගමනය කළ යුතු ක්‍රියාවලි අඩංගු ප්‍රකාශ දෙක තෝරන්න.

A - කාර්ය විමධ්‍යගත කිරීම හා නියාමනය

B - පන්ති කාමර පිරියත කළමනාකරණය

C - පාසල් සැලසුම්කරණය

D - ශිෂ්‍ය සහභාගිත්වය කළමනාකරණය

1. AB 2. AC 3. CD 4. BD (........)

19. කළමනාකරණයේ මූලික කාර්යයන් අනුපිළිවෙළින් දක්වා ඇති වගන්තිය තෝරන්න.

1. සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙයවීම, පාලනය
2. පාලනය, සැලසුම් කිරීම, මෙහෙයවීම, සංවිධානය
3. සංවිධානය, මෙහෙයවීම, පාලනය, සැලසුම් කිරීම
4. සැලසුම් කිරීම, පාලනය, මෙහෙයවීම, සංවිධානය (........)

20. පාසලක හෝ වෙනත් සංවිධානයක හෝ තීරණ ගැනීමේ දී දැකිය හැකි ප්‍රධාන ගැටලු දෙකකි. ඒවා නම්,

1. ගැටලුව පැහැදිලි නොවීම, අත්දැකීම් හා කුසලතා අඩුවීම
2. තීරණ ගැනීමේ ප්‍රමාදය, අයෝග්‍ය තීරණ ගැනීම
3. පැහැදිලි විකල්පයක් තෝරා ගත නොහැකිවීම, ගැටලුව පැහැදිලි කර නොගැනීම
4. අවශ්‍ය දත්ත ප්‍රමාණවත් නොවීම, ගැටලුව පැහැදිලි කර නොගැනීම (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

Rev Manikwela Sirirathana Thero

4106

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0160/PE760 - අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය

**II කොටස**

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) භෞතික සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ පියවර හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) පාසලක විෂයමාලාව මගින් නිපුණතා සංවර්ධනය කිරීමේ දී භෞතික සම්පත් අවශ්‍ය වේ. පාසලක භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම උක්ත කරුණ කෙරෙහි බලපාන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) පාසලක සම්පත්දායකයින්ගේ ආධාරයෙන් විද්‍යාගාර, ගෘහවිද්‍යාගාර, චිත්‍ර අංශ සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා ක්ෂය වන ද්‍රව්‍ය නිරතුරුව ගෙන්වා ගන්නා නමුත් එම ද්‍රව්‍ය ප්‍රමාණවත් නොවන බව පවසමින් නැවත නැවත ඒවා ලබා දෙන ලෙස ඉල්ලීම කිරීම විදුහල්පතිවරයාට ගැටලුවක් විය. ඔබ විදුහල්පතිවරයා නම් එම භෞතික සම්පත් පාලනය සඳහා ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 08යි)

02. (i) "නායකත්වය යනු අන්‍යයන්ගේ චර්යාවන් හැඩ ගැස්වීම හා මෙහෙයවීමේ බලයකි."

*(Fleet 1984)*

නායකත්වය පිළිබඳ නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03යි)

(ii) නායකත්ව ගුණාංග තුනක් දක්වා, එම ගුණාංග භූමිකාව හා සම්බන්ධ වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) පන්ති කාමරය තුළ සිදු ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නායකත්වය හිමි වන්නේ ගුරුවරයාට ය. ඒ අනුව ගුරු නායකත්ව ලක්ෂණ හා ක්‍රියාකාරකම් විස්තර කරන්න. (ලකුණු 08යි)

03. (i) පාසල සංවිධානයක් ලෙස සැලකිය හැකි ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03යි)

(ii) පාසල් සංවිධානය තුළ දැනුම් යුගයේ මානව සම්පත සංවර්ධනය සඳහා වූ ගුරු භූමිකාවේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ධනාත්මක පාසල් සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ගුරුවරයා ක්‍රියාත්මකවීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග විස්තර කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikwela Siriwathana Thero

04. (i) සැලසුම්කරණයේ දී වර්තමානයේ පවතින තත්ත්වය හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා භාවිත කරන විශ්ලේෂණ සාධක **හතර** දක්වන්න. (ලකුණු 03යි)

(ii) සහභාගිත්ව සැලසුම්කරණයෙන් ලබා ගත හැකි ප්‍රයෝජන **පහක්** දක්වන්න.(ලකුණු 05යි)

(iii) ඔබ පාසලේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා සුදුසු ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන්න. (පහත දැක්වෙන අංග පිළිබඳ කරුණු ඇතුළත් විය යුතුයි.)

- ගැටලුව
- ව්‍යාපෘති මාතෘකාව
- අරමුණු හා ක්‍රියාකාරකම්
- වගකීම
- පිරිවැය සහිත කාල රාමුව

(ලකුණු 08යි)

05. නගරයේ ප්‍රධාන පිරිමි පාසලක 8 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් පස් දෙනකු ඉතා උනන්දුවෙන් නිවසින් පිට වී පෙ.ව. 6.45ට පෙර පාසලට පැමිණෙන නමුත් පන්ති කාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි සහභාගිත්වය අඩු ය. එසේ ම පන්තියේ අනෙකුත් සිසුන්ගේ මුදල් හා වෙනත් වටිනා දේ පැහැර ගන්නා බවට ද පැමිණිලි නිරතුරුව ලැබේ. සමහර අවස්ථාවල දී මුදල් සම්බන්ධ ව පන්තියේ ළමුන් සමඟ මෙන් ම එම ගොඩනැගිල්ල ආසන්නයේ සිටින 7 ශ්‍රේණියේ සිසුන් සමඟ නිතර ම කලහ කර ගැනීම සිදු වේ.

(i) 8 වන ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරයා ලෙස ඔබ මෙම ගැටුම් කළමනාකරණයට අපොහොසත් වුවහොත් උදාවිය හැකි තත්ත්වයන් කෙසේ විය හැකි ද? (ලකුණු 03යි)

(ii) පන්ති කාමර නායකත්ව භූමිකාව තුළ මෙම ගැටුමට හේතු සෙවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි උපක්‍රම මොනවා ද? (ලකුණු 05යි)

(iii) මෙම ගැටුම ධනාත්මක ලෙස අර්ථකථනය කර විසඳීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 08යි)

06. (i) සන්නිවේදනය සඳහා බලපාන සාධක **පහ** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) පාසලේ සන්නිවේදන කාරකයක් නම් කර, එය සන්නිවේදන ක්‍රියාවලියට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ගුරු භූමිකාවේ පන්ති කාමර නායකත්වය තුළ තීරණ ගැනීම සඳහා සන්නිවේදනය උපකාරී වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 08යි)

07. (i) ප්‍රමිතිය (Standard) යනුවෙන් අදහස් වන්නේ කුමක් දැ'යි දක්වන්න. (ලකුණු 03යි)

(ii) ප්‍රමිති පාදක ඇගයීම් ක්‍රියාවලිය යටතේ බාහිර ඇගයීම් හා අභ්‍යන්තර ඇගයීම් සිදු කරන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) පාසලේ සමස්ත ක්‍රියාවලිය ඇගයීම හා පාසලේ ගුණාත්මක දර්ශකය සඳහා ගුරු වගකීම් හා කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

08. (i) පාසල් ප්‍රජා සබඳතා නිර්වචනයක් මගින් දක්වන්න. (ලකුණු 03යි)

(ii) පාසල් ප්‍රජා සබඳතා පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) පාසල හා ප්‍රජාව අතර සබඳතා සඳහා ඇති බාධක හා ගැටලු හඳුන්වා, ඒ සඳහා විසඳුම් හා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08යි)

*********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.] 

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016
අවසාන පරීක්ෂණය - 2018

PE0160/PE760 | අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය
EDUCATIONAL LEADERSHIP & MANAGEMENT

2018.12.14 — පැය 1300 - පැය1600 — කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:.............................................

## I කොටස

වඩාත්ම ගැළපෙන පිළිතුරේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.

01. කළමනාකරණයේ දී පළමුවෙන් ම අවධානය යොමු කිරීම අවශ්‍ය වන්නේ,
    1. සංවිධානය කෙරෙහි ය.
    2. සැලසුම්කරණය කෙරෙහි ය.
    3. පාලනය කෙරෙහි ය.
    4. මෙහෙයවීම කෙරෙහි ය. (........)

02. ගුරුවරයාගේ නායකත්වය පන්ති කාමරයෙහි සිදු ක්‍රියාකාරීත්වය සඳහා වැදගත් ය. මෙහි දී ගුරුවරයාගේ ශික්ෂණ විද්‍යා නායකත්වය මගින් සිදු කරනුයේ,
    1. ශිෂ්‍යයාගේ ප්‍රබල විභවතා හඳුනා ගැනීම යි.
    2. ශිෂ්‍යයාගේ දුර්වලතා සඳහා පිළියම් යෙදීම යි.
    3. ශිෂ්‍යයාගේ සියලු විභවතා ඉදිරියට ගෙන සංවර්ධනය යි.
    4. ශිෂ්‍යයාගේ ඉගෙනුම්-ඉගැන්වීම් පරිසරය සංවර්ධනය යි. (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

03. නායකයකු හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ,

1. අනුගාමිකයන් රඳවාගෙන සිටීම
2. නොයෙක් විෂයයන් පිළිබඳ දැනුම
3. මනා දේහ ස්වරූපයක් පැවතීම
4. ඕනෑම කාර්යයක් හොඳින් ඉටු කිරීම (........)

04. ආයතන, පුද්ගල හා මැදිහත් ලෙස නායකත්ව ශෛලීන් තුනක් හඳුන්වා දෙන ලද්දේ,

1. කර්ට් ලෙවින් 2. රොබට් හවුස්
3. ජේකොබ් ගෙට්සෙල් 4. ගිල්ඩ් හෝල්ඩින් (........)

05. ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්යය වන්නේ,

A - විෂයමාලා සංවර්ධනය

B - ගුරු අධ්‍යාපනය

C - අධ්‍යාපන කළමනාකරණ සංවර්ධනය

D - දූරස්ථ අධ්‍යාපනය

E - පර්යේෂණ කිරීම

1. A, B, C, D 2. B, C, D, E
3. A, B, D, E 4. සියල්ල ම (........)

06. වෙනස්වීම් කළමනාකරණය අනිවාර්යයෙන් ම කළ යුතු වන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේ ද?

1. නව විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී
2. විභාග ප්‍රතිඵල අඩුවීමේ දී
3. භෞතික සම්පත් ප්‍රමාණවත් නොවන විට දී
4. පාසලට ලැබෙන පෙළපොත් ප්‍රමාදවීමේ දී (........)

07. අධ්‍යාපනයට බලපාන නීති අතරෙන් පාසල් ළමයින්ට බලපාන නීති වන්නේ,

1. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය 2. අපරාධ නීතිය
3. දිලිස්ත නීතිය 4. ඉහත සියල්ල ම (........)

08. උපාධිධාරී ගුරුවරයකු වන වසන්ත හදිසියේ අසනීප වූයෙන් ඔහුට එම වර්ෂයට හිමි නිවාඩු ලබාගෙන අවසන් විය. ඔහුගේ මිතුරකු වන අතුර, පසුගිය අනාගාමී වසර දෙකක ඉතිරි නිවාඩු ලබා ගැනීමේ හැකියාව ඇති බව පවසන ලදී. මොහු මේ සඳහා විස්තර දැන ගැනීමට පරිශීලනය කළ යුත්තේ,

1. මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ
2. ආයතන සංග්‍රහය හා අදාළ චක්‍රලේඛ
3. ගුරු සේවා ව්‍යවස්ථාව හා අදාළ චක්‍රලේඛ
4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අදාළ චක්‍රලේඛ (........)

09. දැනුම් යුගයේ මානව සම්පත් සංවර්ධනය සඳහා ගුරු භූමිකාවට අදාළ නොවන්නේ,

1. ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට අවස්ථාව සලසා දීම
2. තාක්ෂණය භාවිතය හා මෙහෙයවීම
3. ගෝලීය දර්ශනය අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දීම
4. තිලබලය පාසල තුළ මෙන් ම බාහිරව ද පවත්වා ගැනීම (........)

අ.පි.බ.

Rev. Manikwela Siriwathana Thero

10. පාසල් සැලසුම්කරණයේ නිවැරදි අනුපිළිවෙළ දක්වන්න.

1. ගැටලු විශ්ලේෂණය, පස් අවුරුදු සැලැස්ම, වාර්ෂික සැලැස්ම, ව්‍යාපෘති
2. ගැටලු විශ්ලේෂණය, ව්‍යාපෘති, වාර්ෂික සැලැස්ම, පස් අවුරුදු සැලැස්ම
3. ගැටලු විශ්ලේෂණය, වාර්ෂික සැලැස්ම, පස් අවුරුදු සැලැස්ම, ව්‍යාපෘති
4. ගැටලු විශ්ලේෂණය, ව්‍යාපෘති, පස් අවුරුදු සැලැස්ම, වාර්ෂික සැලැස්ම (........)

11. විදුහල්පති භූමිකාව තුළ අනිවාර්යයෙන් ම කළ යුතු ම (Must) කළ යුතු (Should) හා කළ හැකි (Could) කටයුතු ඇත. මෙහි දී විදුහල්පති කළමනාකරුවකුට වඩා නායකයකු ලෙස ඉස්මතු වන්නේ,

1. කළ යුතු ම (Must) කාර්යය මනාව ඉටු කිරීම තුළිනි.
2. කළ හැකි (Could) කටයුතු වැඩි කැපවීමකින් ඉටු කිරීම තුළිනි.
3. කළ යුතු (Should) කටයුතු කැපවීමෙන් ඉටු කිරීම තුළිනි.
4. කළ යුතු ම (Must) හා කළ යුතු (Should) කටයුතු නොපිරිහෙලා ඉටු කිරීම තුළිනි.

(........)

12. මවක් පාසලට පැමිණෙන විට සාරියක් ඇඳීම අනිවාර්ය නොකිරීම තුළින් වළක්වා ඇත්තේ කුමන ගැටලුවක් ද?

1. පුද්ගල සම්බන්ධතා ගැටුම්
2. අවශ්‍යතා ගැටුම්
3. සාරධර්ම ගැටුම්
4. ව්‍යුහමය ගැටුම් (........)

13. ධනාත්මක ලෙස ගැටලුවක් අර්ථකථනය කරන අවස්ථාවක දී සිදුවිය හැක්කේ,

A – කළමනාකරණයේ දුබලතා හඳුනා ගැනීම

B – ඒකාකාරී වාතාවරණය බිඳහැර මානසික උත්තේජනයක් ඇති කිරීම

C – කාර්ය මණ්ඩලයේ ඉගෙනීම

D – විධායක සමර්ථකරණය

1. A, B, C නිවැරදි ය.
2. B, C, D නිවැරදි ය.
3. A, C, D නිවැරදි ය.
4. සියල්ල ම නිවැරදි ය. (........)

14. සායනික අධීක්ෂණය ගුරුවරයකුට ඵලදායී ලෙස යෙදිය හැක්කේ පහත දැක්වෙන කුමන අවස්ථාවේ ද?

1. විෂය දැනුම ප්‍රමාණවත් නොවන විට
2. පන්ති කාමරයට පමා වී පැමිණීමේ පුරුද්ද ඇති විට
3. කළමනාකරණ භාවිතයේ දුර්වලතා ඇති විට
4. අධික ලෙස නිවාඩු ලබා ගන්නා විට (........)

15. පාසලක සන්නිවේදන මධ්‍යස්ථාන දක්වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ගුරු දැන්වීම් පොත, පාසල් කාර්යාලය, ගුරු කාමරය
2. පාසල් කාර්යාලය, ගුරු කාමරය, ආපන ශාලාව
3. පාසල් කාර්යාලය, චක්‍රලේඛ ගොනුව, ශිෂ්‍ය වාර්තා පොත
4. චක්‍ර ලේඛ ගොනුව, පාසල් මෙහෙවර ප්‍රකාශය, පස් අවුරුදු සැලැස්ම, (........)

අ.පි.බ.

Rev Manikwela Siriwathana Thero

16. භෞතික සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේ දී පළමුවෙන් ම කළ යුත්තේ,

1. සම්පත් තැන්පත් කිරීමට ස්ථානයක් වෙන් කිරීම
2. සම්පත් ලබා ගැනීම
3. සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම
4. සම්පත් වර්ග කිරීම (........)

17. පාසල ප්‍රජාවගෙන් ඈත්වීමට බලපාන සාධකයක් වන්නේ, පාසල,

1. පාසලේ යහපත පමණක් අපේක්ෂා කරන හා පාසල තුළ කටයුතුවලට පමණක් සීමාවීම
2. කාලීන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ දෙමව්පියන් නිරන්තරයෙන් දැනුවත් කිරීම
3. විශ්වවිද්‍යාල හා වෙනත් පාසල් නිරන්තරයෙන් පාසලට සම්බන්ධ කර ගැනීම
4. අභ්‍යන්තර හා බාහිර ලෙස මත්ද්‍රව්‍ය විරෝධී ව්‍යාපෘති පැවැත්වීම (........)

18. කළමනාකරණයේ දී කාලය සැලසුම් කිරීම ද අවශ්‍ය වේ. කාලය සැලසුම් කිරීම හා අදාළ **නොවන්නේ** කුමක් ද?

1. කාල සටහන
2. වාර්ෂික සැලැස්ම
3. සති සටහන්
4. පන්ති වාර්තා පොත (........)

19. තීරණ ගැනීමේ දී සහභාගිත්ව රටාව පාසල් මට්ටමේ දී වඩාත් වැදගත් වේ. මෙහි දී අවාසිදායක තත්ත්ව ලෙස සැලකිය **නොහැක්කේ,**

A - කණ්ඩායම් හැඟීම වර්ධනය

B - ගුණාත්මක බවින් වැඩි තීරණ ගත හැකිවීම

C - විවිධ විසඳුම් මාර්ග ඉදිරිපත් වීම

D - සියලු දෙනා අභියෝග භාර ගැනීමට සූදානම් වීම

E - වැඩිදෙනාගේ කැමැත්ත මත තීරණ ගැනීමට සිදුවීම

1. A, B පමණක් නිවැරදි ය.
2. A, B, C පමණක් නිවැරදි ය.
3. A, B, C, D පමණක් නිවැරදි ය.
4. සියල්ල ම නිවැරදි ය. (........)

20. කළමනාකරුවකු හා නායකයකු අතර සමානතා මෙන් ම වෙනස්කම් ද ඇත. පහත ලක්ෂණ අතරෙන් කළමනාකරුවකු තුළ දැකිය හැකි ලක්ෂණය වන්නේ,

1. මූලාරම්භකයකු ලෙස කටයුතු කිරීම
2. නිවැරදි ව ක්‍රියා කිරීමට අවධානය යොමු කිරීම
3. නිර්මාණ කිරීමට ඉදිරිපත් වීම
4. නිවැරදි දේ කිරීමට අවධානය යොමු කිරීම (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

Rev. Manikwela Sirirathana Thero

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0160/PE760 - අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය

### II කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) නායකත්වය පිළිබඳ නිර්වචනයක් දෙන්න. (ලකුණු 03)

(ii) නායකත්ව ගුණාංග පහක් දක්වන්න. (ලකුණු 05)

(iii) නායකත්වය හා කළමනාකරණය අතර සම්බන්ධතාව හා වෙනස්කම් විමර්ශනය කරන්න. (ලකුණු 08)

02. (i) පාසල සංවිධානයක් ලෙස හැඳින්වීමට හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඔබේ පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව හා පවතින මානව සම්පත අනුව සංවිධාන ව්‍යුහයක් ගොඩනගන්න. (ලකුණු 05)

(iii) පාසල් සංවිධානය තුළ ගුරු භූමිකාවට අයත් නායකත්ව ක්‍රියාකාරකම් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

03. (i) 'සැලසුම්කරණය' කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන සැලසුම්කරණය වැදගත් වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පාසල් සැලසුම්කරණයේ දී සහභාගිත්ව සැලසුම්කරණය යොදා ගැනීමේ වාසි හා අවාසි විස්තර කරන්න. (ලකුණු 08)

04. (i) පාසල් කළමනාකරණයේ දී සන්නිවේදන බාධාවක් බලපෑ හැකි අවස්ථාවක් සඳහා උදාහරණයක් දෙන්න. (ලකුණු 03)

(ii) එකවර වැඩි පිරිසකට සන්නිවේදනය සඳහා පාසලක භාවිත කළ හැකි සන්නිවේදන මෙවලම් තුනක් නම් කර, ඒවා ආධාර කර ගත හැකි ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) විදුහල්පති භූමිකාවේ දී සන්නිවේදනයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

05. (i) 'අධීක්ෂණය' නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) සාර්ථක අධීක්ෂණයක් සඳහා අධීක්ෂකයකු සතු විය යුතු ගුණාංග පහක් දක්වන්න. (ලකුණු 05)

(iii) පාසලක විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් තුළින් ලබා ගත හැකි ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 08)

06. (i) 'ගැටුම් කළමනාකරණය' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ගැටුම් කළමනාකරණය නොකිරීම නිසා සංවිධානයක් තුළ ඇතිවිය හැකි තත්ත්වයන් සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) පාසල සංවර්ධනය සඳහා ධනාත්මක දෘෂ්ටිකෝණයකින් ගැටුමක් අර්ථකථනයේ වැදගත්කම විමර්ශනය කරන්න. (ලකුණු 08)

07. ජනප්‍රිය පාසලක විදුහල්පති බවට පත් වූ ජයදේව මහතාට කළමනාකරණය සම්බන්ධ ගැටලු රාශියකට මුහුණ දීමට සිදු විය. දෙමව්පියන්, ගුරුවරුන් හා ප්‍රසිද්ධ පුද්ගලයන් තමා හමුවීමට නිරතුරුව ම කාර්යාලයට පැමිණීම හේතුවෙන් පාසලේ කටයුතු කිරීමට බාධාවක් වීම ප්‍රධාන ගැටලුව විය.

(i) පාසලක සම්පත් කළමනාකරණය කාර්යක්ෂමතාව කෙරෙහි බලපායි.
ඉහත ගැටලුවේ දී කළමනාකරණය වහා ම යොමු විය යුත්තේ කුමන සම්පත කෙරෙහි ද? (ලකුණු 03)

(ii) ඉහත ගැටලුව කළමනාකරණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි සම්පත්වල දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. (i) 'ඵලදායී පාසලක්' අර්ථකථනය කරන්න. (ලකුණු 03)

(ii) ඵලදායී පාසලක් හඳුනා ගත හැකි ලක්ෂණ දක්වන්න. (ලකුණු 05)

(iii) පාසල ඵලදායීතාව කරා මෙහෙයවීම සඳහා ගුරු කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 08)

*********

Rev Manikwela Siwathana Skero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

410

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016**

**අවසාන පරීක්ෂණය 2017**

**PE0170/PE770 | අධ්‍යාපන මාර්ගෝපදේශනය සහ උපදේශනය**
**EDUCATIONAL GUIDANCE & COUNSELLING**

2017.03.19 පෙ.ව 0900 - පෙ.ව 1200 කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:..............................

## I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. "උපදේශනය" යන්න නිවැරදි ව අර්ථ ගන්වන්නේ කුමන ප්‍රකාශනය මගින් ද?
    1. උපදේශනය මගින් සේවාලාභියාට උපදෙස් ලබාදීම සිදු කරයි
    2. උපදේශනය මගින් සේවාලාභියාට විසඳුම් ලබාදීම සිදු කරයි
    3. උපදේශනය මගින් සේවාලාභියාට විසඳුම් සොයා ගැනීමට සහය වෙයි
    4. උපදේශනය මගින් සේවාලාභියාට තොරතුරු ලබා දෙයි (........)

02. උපදේශනය භාර ගුරුවරයා විවිධ සම්පත් දායකයන් ගෙන්වා වෘත්තීය උපදේශන වැඩමුළුවක් පැවැත්වීය. එය අයත් වන්නේ උපදේශකවරයාගේ කුමන භූමිකාවට ද?
    1. සම්බන්ධීකරණ භූමිකාවට යි
    2. මාර්ගෝපදේශ භූමිකාවට යි
    3. මැදිහත්කරුගේ භූමිකාවට යි
    4. සැලසුම්කරුවකුගේ භූමිකාවට යි (........)

03. ශිෂ්‍යයාගේ වාචික හා අවාචික සන්නිවේදනය හඳුනා ගැනීම සඳහා උපදේශකවරයකුට භාවිත කළ හැකි ක්‍රමශිල්පය වන්නේ,
    1. නිරීක්ෂණය හා ලුහුඬු ප්‍රවෘත්ති වාර්තා
    2. නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා
    3. සමාජමිතික පරීක්ෂණ හා ලුහුඬු ප්‍රවෘත්ති වාර්තා
    4. සමාජමිතික පරීක්ෂණ හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයන (........)

අ.පි.බ.



Rev. Manikwela Sirirathana Thero

04. උපදේශන කාර්යයේ සාර්ථකත්වයට උපදේශන න්‍යායාත්මක දැනුම අවශ්‍ය වේ. ඊට හේතුව වන්නේ,

1. ශිෂ්‍යයන් අතර උපදේශනය කිරීමට යි
2. සේවාලාභියා සමඟ මනා අන්තර්සබඳතාවක් පවත්වා ගැනීමට යි
3. ගැටලුවට නිවැරදි ව විසඳුම් ලබාදීමට යි
4. ගැටලුව නිවැරදි ව හඳුනාගෙන මැදිහත්වීම සඳහා යි (........)

05. වෘත්තීය මාර්ගෝපදේශයේ පුරෝගාමියා වූ ෆ්‍රෑන්ක් පාසන් වෘත්තීය වරණය සඳහා ඉදිරිපත් කළ ක්‍රමවේදය ඇතුළත් පිළිතුර වන්නේ,

1. වෘත්තීය විශ්ලේෂණය, සමාජ විශ්ලේෂණය, පුද්ගල විශ්ලේෂණය
2. වෘත්තීය විශ්ලේෂණය, පුද්ගල විශ්ලේෂණය, සමාජ විශ්ලේෂණය
3. පුද්ගල විශ්ලේෂණය, වෘත්තීය විශ්ලේෂණය, පුද්ගල හා වෘත්තීය විශ්ලේෂණය
4. පුද්ගල විශ්ලේෂණය, පුද්ගල හා වෘත්තීය විශ්ලේෂණය, වෘත්තීය විශ්ලේෂණය (........)

06. උපදේශන සේවාව සම්බන්ධයෙන් ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කිරීමේ පරමාර්ථයක් ලෙස දැක්විය නොහැකි කරුණ වන්නේ,

1. උපදේශන සේවාවේ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම
2. උපදේශන ක්‍රියාවලියේ දී සේවාලාභියා ආරක්ෂා කිරීම
3. උපදේශකවරයාගේ ආරක්ෂාව තහවුරු කිරීම
4. උපදේශකවරයාගේ පෞරුෂ ගුණාංග ආරක්ෂා කිරීම (........)

07. අනුක්‍රමික විසංවේදන ප්‍රතිකාර ක්‍රමය මගින් සිදු කරන්නේ,

1. ගැටලුකාරී තත්ත්වයේ සිට අපේක්ෂිත ඉලක්කය වෙත ළඟාවීමේ සුදුසු මට්ටම ඇති කිරීම යි
2. උපස්ථම්භනය මගින් ඉලක්ක ගත චර්යා ලක්ෂණ සංවර්ධනය කිරීම යි
3. ගැටලුවේ ස්වභාවය අනුව මාංශපේශි ලිහිල් කිරීමේ අභ්‍යාස සිදු කිරීම යි
4. චර්යා සංස්කරණය සඳහා සුදුසු ආකෘති අනුකරණයට අවස්ථාව ලබාදීම යි (........)

08. හේතුවාදී ප්‍රවේශයට අනුව පුද්ගලයා ගැටලුවට පත් වන්නේ,

1. පුද්ගලයා මුහුණ දෙන සිද්ධිය නිසා ය
2. පුද්ගලයා මුහුණ දෙන ප්‍රතිඵලය නිසා ය
3. පුද්ගලයාගේ විශ්වාස පද්ධතිය නිසා ය
4. පුද්ගලයා ජීවිතයේ අරුත නොදන්නා නිසා ය (........)

09. පහත කරුණු සලකන්න.

(a) පාසල තුළ උපදේශකවරයා පිළිගැනීමට ලක් වේ.
(b) ශිෂ්‍යයාට තම ගැටලු විශ්වසනීයත්වයෙන් යුතු ව පැවසීමට හැකි වේ.
(c) ශිෂ්‍යයන් තුළ උපදේශනය පිළිබඳ ව උනන්දුවක් ඇති කිරීමට සමත් වේ.
(d) උපදේශනය සඳහා පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණනය කළ හැකි වේ.

මෙවා අතුරින් පාසලක උපදේශන කාමරයක් නිවැරදි ව පවත්වා ගැනීම නිසා උපදේශන සේවයට ඇති වන වාසි දෙකක් වන්නේ,

1. (a) සහ (b) වේ 2. (b) සහ (c) වේ
3. (b) සහ (d) වේ 4. (c) සහ (d) වේ (........)

අ.පි.බ.

Rev. Manikwela Suwathana Thero

10. මෙවර 1 ශ්‍රේණියට ඇතුළත් කළ සුරංග සෙසු ළමුන්ට වඩා වෙනස් බව ගුරුතුමියට වැටහුණි. සෙසු ළමයි සමඟ කථා නොකරන ඔහු අන් අයගේ මුහුණ බැලීමට මැලිකමක් දක්වයි. කථා කළ විට නෑසුනා සේ සිටින අතර තනි ව කථා කරමින් සෙල්ලම් කරන අවස්ථා ද ඇත. සුරංග වෙතින් ප්‍රදර්ශනය වන්නේ කුමන අසාමාන්‍යතාවක් ද?

1. අධික්‍රියාකාරී බව
2. භීතිකාව
3. මන්දමානසික බව
4. ඔටිසම් (........)

11. ඈන්රෝගේ වෘත්තීය උපදේශන න්‍යාය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. වෘත්තීය තේරීම වර්ෂ කිහිපයක තීරණ මාලාවක ප්‍රතිඵලයකි
2. වෘත්තීය සංවර්ධනය ජීවන අවධි හා සම්බන්ධ වේ
3. වෘත්තීය තීරණ සඳහා පෞරුෂ ගුණාංග බලපායි
4. පුළුල් රැකියා ක්ෂේත්‍ර අටක් තුළ මට්ටම් හයක් දක්වා වර්ධනය වේ (........)

12. පාසල් පද්ධතිය තුළ ප්‍රාථමික, කණිෂ්ඨ, ද්විතියික වශයෙන් සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශය ක්‍රියාත්මක වන ආකාරය අනුපිළිවෙළින් දැක්වූ විට පිළිතුර වන්නේ,

1. වෘත්තීය ගවේෂණය, වෘත්තීය සූදානම, වෘත්තීය දැනුවත් භාවය
2. වෘත්තීය දැනුවත් භාවය, වෘත්තීය සූදානම, වෘත්තීය ගවේෂණය
3. වෘත්තීය දැනුවත් භාවය, වෘත්තීය ගවේෂණය, වෘත්තීය සූදානම
4. වෘත්තීය සූදානම, වෘත්තීය ගවේෂණය, වෘත්තීය දැනුවත් භාවය (........)

13. අධික වර්ෂාව නිසා සිදු වූ නායයාම්වලින් පසු සමගිපුර පාසලේ ඉගෙන ගන්නා දරුවන් කිහිප දෙනෙක් තවමත් ඥාති නිවෙස්වල සිට පාසලට පැමිණෙන බවත්, පාසල් පැමිණීම අඩු බවත්, අධ්‍යාපනික කටයුතු කෙරෙහි තිබූ උද්යෝගය අඩු බවත්, ගුරුතුමියට අවබෝධ විය. සිසුන් වෙත මැදිහත්වීම සඳහා වඩාත් ම සුදුසු උපදේශන ක්‍රියාවලිය වන්නේ,

1. මනෝ සමාජීය උපදේශනය
2. මනෝවිද්‍යාත්මක උපදේශනය
3. ව්‍යසන උපදේශනය
4. සමපදස්ථ උපදේශනය (........)

14. පහලගම පාසලේ උපදේශනය භාර ගුරුභවතා වෙත පන්තිභාර ගුරුභවතුන් යොමු කළ ගැටලු කිහිපයක් පහත දැක්වේ.

I 8 ශ්‍රේණියේ මිහිරි ගණිත විෂය සඳහා දක්වන උනන්දුව දවසින් දවස අඩු වෙනවා.

II මේ පාර සාමාන්‍ය පෙළ විභාගයට ළමයින් 36ක් ඉදිරිපත් වෙනවා. එයාලට හරියට උපදෙස් දෙන්න ඕනෑ.

III 13 ශ්‍රේණියේ සුසිරට මම කිව්ව එම ශ්‍රේණියේ ඉන්න යාළුවන්ගෙ ගැටලු හොයල බලල මට කියන්න කියල.

ඉහත අවස්ථාවලට අදාළ උපදේශන ක්‍රම පිළිවෙළින්,

1. කණ්ඩායම් මාර්ගෝපදේශය, පෞද්ගලික උපදේශනය, සමපදස්ථ උපදේශනය
2. පෞද්ගලික උපදේශනය, කණ්ඩායම් මාර්ගෝපදේශය, සමපදස්ථ උපදේශනය
3. පෞද්ගලික උපදේශනය, සමපදස්ථ උපදේශනය, කණ්ඩායම් උපදේශනය
4. කණ්ඩායම් මාර්ගෝපදේශය, සමපදස්ථ උපදේශනය, පෞද්ගලික උපදේශනය (........)

අපිබ.



Rev. Manikwela Suwathana Thero

15. උපදේශනයේ සමස්ත පරමාර්ථ හතරෙන් එකක් වන්නේ නිවාරණය යි. එයින් අදහස් වන්නේ,

1. ශිෂ්‍යයා මුහුණ දෙන ගැටලු මගහැරීමට කටයුතු කිරීම යි
2. පූර්ණ සංවර්ධනයට බාධා ඇති වන ගැටලු කල්වේලා ඇති ව ඉවත් කිරීම යි
3. උපදේශන ආයතන වෙතට අවශ්‍ය යොමු කිරීම යි
4. සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම් නොපමා ව සිදු කිරීම යි (........)

16. පහත දැක්වෙන්නේ මනෝවිශ්ලේෂණාත්මක න්‍යායේ සංරක්ෂණ ප්‍රයෝග කිහිපයකි.

| | "අ" | "ආ" |
|---|---|---|
| (1) | තමාගේ අඩුපාඩු අනුන් නිසා සිදු වූ බවට අදහස් දැක්වීම. | A - ප්‍රක්ෂේපනය |
| (2) | තමාගේ දුබලතා අන් අයගේ දුබලතා සමඟ සැසඳීම. | B - තදාත්මීකරණය |
| (3) | අමිහිරි අත්දැකීම් ලැබූ පරිසරයෙන් මිදීම. | C - යුක්ති ප්‍රතිපාදනය |
| (4) | තමා අගයන ප්‍රිය කරන අය අනුකරණය කිරීම. | D - ප්‍රතිවර්තනය |

"අ" සහ "ආ" කොටස් කියවා සුදුසු පරිදි ගලපා ඇති නිවැරදි වරණය තෝරන්න.

1. C, A, D, B
2. C, D, A, B
3. A, C, D, B
4. A, B, D, C (........)

17. පුද්ගලයා කාංසාත්මක තත්ත්වයකට පත් වන්නේ ඉටු කරගත නොහැකි ආශාවන් අවරෝධනය වීම හේතුවෙන් බව පැවසුවේ,

1. වික්ටර් ෆ්‍රෑන්කල් ය
2. කාල් රොජර්ස් ය
3. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ය
4. ඇල්බට් එලිස් ය (........)

18. වෘත්තීය උපදේශනය පාසල් සඳහා හඳුන්වාදීම තුළින් ඇතිවන වැදගත් ම ප්‍රතිඵලයකි,

1. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් පාසල් කාලය තුළ ලබාදීම යි
2. උසස් පෙළ සඳහා තාක්ෂණික විෂය හඳුන්වාදීම යි
3. වෘත්තීන් පිළිබඳ තොරතුරු රැස් කර තබා ගැනීමට මඟපෙන්වීම යි
4. වෘත්තීය ලෝකයේ අනාගත අභියෝග පහසුවෙන් ජය ගැනීමට මඟපෙන්වීම යි (........)

19. පන්ති කාමරයේ ක්‍රියාකාරකමක යෙදී සිටි සමන්ති තමා වෙත පියාඹා එන සමනලයකු දැක යටිගිරියෙන් කෑගැසුවා ය. එමෙන් ම ඇගේ හෘද ස්පන්දන වේගය වැඩි වූ අතර වෙව්ලන්නට ද විය. ඇය වෙතින් ප්‍රදර්ශනය වූයේ කුමන තත්ත්වයක් ද?

1. විශාදය
2. භීතිකාව
3. ග්‍රස්ථිය අනිවාර්ය අක්‍රමතාව
4. අධික්‍රියාකාරී බව (........)

20. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ අන්තර්ගත වගන්ති ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ වර්ග කර ඇත. පැවැත්ම හා ආරක්ෂාව ඉන් දෙකකි. අනෙක් අයිතිවාසිකම් ක්ෂේත්‍ර දෙක වන්නේ,

1. සංවර්ධනය හා සහභාගීත්වය යි
2. අධ්‍යාපනය ලැබීම හා තොරතුරු ලබා ගැනීම යි
3. නිදහස් අදහස් ප්‍රකාශය හා වදහිංසාවලින් මිදීම යි
4. සෞඛ්‍ය පහසුකම් ලැබීම හා අධ්‍යාපනය යි (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

Rev Manikwela Sirirathana Thero

4106

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017
## PE0170/PE770 - අධ්‍යාපන මාර්ගෝපදේශය සහ උපදේශනය

### II කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පාසල් මාර්ගෝපදේශ හා උපදේශන කාර්යභාරය පිළිබඳ ව මනා අවබෝධයක් උපදේශකවරයා සතු විය යුතු යි.

   (i) මාර්ගෝපදේශය සහ උපදේශනය යන සංකල්ප අතර වෙනස්කම් **තුන** බැගින් ලියන්න. (ලකුණු 03යි)

   (ii) පාසල් උපදේශන සේවා **තුනක්** නම් කර, **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

   (iii) ද්විතීයික පාසලේ උපදේශන සේවයක අරමුණු **හතරක්** සඳහන් කර, ඉන් අරමුණු **දෙකක්** ඉටු කර ගැනීම සඳහා පාසල් උපදේශකවරයාගේ කාර්යභාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. "සංකීර්ණ සමාජ අභියෝග හමුවේ පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව දිනෙන් දින වැඩි වී ඇත."

   (i) එසේ අවශ්‍ය වීමට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

   (ii) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව පාසල තුළ දියත් කිරීම සඳහා ගෙන ඇති පියවර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

   (iii) "අභියෝග ජය ගෙන සතුටින් ඉගෙන ගනිමු" යන තේමාව යටතේ අ.පො.ස. (සා.පෙ.) සිසුන් දැනුවත් කිරීමේ දී ඔබ අවධාරණය කිරීමට අපේක්ෂිත කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08යි)

3. උපදේශනය භාර ගුරුතුමිය හමු වී සතුටු මුහුණින් පැමිණි නිශානි තම යෙහෙළියට පැවසුයේ මෙසේ ය. "මට නම් හරි ම සතුටු යි. මම මැඩම් හමුවෙන්න ගියෙ විභාගෙ ගැන කලකිරිලා. ඒත් සුහද ව කථා කරන කොට මගෙ සිතුවිල්ල වෙනස් වුනා. දැන් මම ආයෙමි ගණිතය විභාගයට ලියනව. විවර හරිම දක්ෂ යි. උපදේශනයට, ඕනැම දෙයක් කියන්න පුළුවන්. හොඳට තේරුම් ගන්නවා."

   (i) ඉහත සිද්ධියෙන් මතුවන ගුරුවරයා සතු උපදේශන ගුණාංග **හයක්** ලියන්න. (ලකුණු 03යි)

අ.පි.බ.



Rev Manikwela Siriwathana Thero

(ii) එම ගුරුවරයාට මෙන් ම සෑම වෘත්තීය ගුරුවරයකු ම සතු ව තිබිය යුතු උපදේශන කුසලතා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) උපදේශන ගුරුවරිය පිළිබඳ ව නිශානි තුළ සුබවාදී සිතුවිලි ජනිත වූයේ ඇය උපදේශන ආචාරධර්මවලට අනුව ක්‍රියා කළ බැවිනි. උපදේශන ආචාරධර්ම **හතරක්** නම් කර, **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

4. ආසිරිගම පාසලට ස්ථාන මාරුවක් ලබා පැමිණි පවිත්‍රා ගුරු මහත්මිය වෙත රාජකාරී කටයුතු භාරදීමේ දී ඇති වුණු දෙබසක කොටසක් පහත දැක්වේ.

**විද්‍යුල්පති** - මිස්, මීට පෙර වැඩ කළ පාසලේ උපදේශන කටයුතු භාර ව හිටිය කිව්වනෙ. මෙහෙ නම් ඒකට ගුරුවරයෙක් ඉන්නව.

**පවිත්‍රා** - මම උපදේශනය සම්බන්ධ ව විශේෂ පාඨමාලාවකුත් කළා. එහෙ වෘත්තීය උපදේශන වැඩසටහන් තමයි භාර දීලා තිබුණේ.

**විද්‍යුල්පති** - මේ ළමයින්ට මොන රස්සා ද? මොකක් ද එහෙම එකක් පවත්වාගෙන යන එකේ අරමුණ.

(i) පවිත්‍රා ගුරුතුමිය විසින් විද්‍යුල්පතිවරයාට ඉදිරිපත් කළ වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශනයේ අරමුණු **තුනක්** ලියන්න. (ලකුණු 03යි)

(ii) ඩොනල්ඩ් සුපර්ගේ වෘත්තීය සංවර්ධන න්‍යායේ දැක්වෙන ගවේෂණ අවධිය සඳහා ගුරුවරයා ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) "වෘත්තීය වරණය සඳහා සහයවීමට නම් වෘත්තීය උපදේශන න්‍යායන් පිළිබඳ ව මනා අවබෝධයක් ගුරුවරයා ලබා ගත යුතු යි."

ඉහත ප්‍රකාශය සනාථ කිරීමට කරුණු **තුනක්** වෘත්තීය උපදේශන න්‍යායන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08යි)

5. "3 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුපුන් කිලිටුවියේ සිට ම මිත්තණිය සමඟ දිවි ගෙවයි. ආර්ථික දුෂ්කරතාවලින් පීඩා විඳින ඔහු හුදකලා ව සිටින ක්‍රියාශීලී නොවන දරුවකු වන අතර ඉගෙනීමේ කටයුතුවල දී ද අවම සාධන මට්ටමක් පෙන්නුම් කරයි."

(i) සුපුන්ගේ චර්යා ගැටලු ඇතිවීම කෙරෙහි බලපාන පාරිසරික සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) එවැනි චර්යා ගැටලු අවම කර ගැනීම සඳහා ගුරුවරයාට මැදිහත් විය හැකි ක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) ප්‍රාථමික පාසලේ ඉගෙනුම් දුෂ්කරතා අවම කර ගැනීම සඳහා පාසල් උපදේශන ඒකක මඟින් ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් **දෙකක්** නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08යි)

අ.පි.බ.

Rev Manikaela Sirirathana Thero

6. උපදේශන ප්‍රවේශය පිළිබඳ අවබෝධය ගැටලු සඳහා මැදිහත්වීමට උපදේශන ගුරුවරයාට අත්‍යවශ්‍ය වේ.

(i) මනෝවිශ්ලේෂණවාදී (Psychoanalytic) ප්‍රවේශයට අනුව මනසේ ස්ථරගත ස්වරූපය කොටස් තුනකට බෙදා ඇත. එම කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) "9 ශ්‍රේණියේ උමාලි තමා යෙහු අයට වඩා මිට්ටීම පිළිබඳ ව දැඩි කනස්සල්ලට පත් ව සිටින්නී ය. අධ්‍යාපන කටයුතු කෙරෙහි ද දක්වන උනන්දුව අඩු වී ඇත."

සංජානනික ප්‍රපංචමය ප්‍රවේශය (Perceptual Phenomenological Approach) ඇසුරින් උමාලිගේ ගැටලුව විග්‍රහ කරන්න. (ලකුණු 05යි)

(iii) "අචල තමාගේ උසස් අධ්‍යාපන කටයුතු අසාර්ථක වේ යැ'යි යන සෘණාත්මක සිතුවිල්ලකින් පීඩා විඳින ශිෂ්‍යයෙකි."

හේතුවාදී ප්‍රවේශයට අදාළ ක්‍රමශිල්ප තුනක් භාවිත කර, අචලගේ සිතුවිලි ප්‍රතිසංස්කරණය සිදු කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

7. "ශිෂ්‍ය ගැටලු සඳහා මැදිහත්වීමට පෙර අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීම උපදේශකවරයාගේ වගකීමකි."

(i) තොරතුරු රැස් කිරීමට අදාළ පරීක්ෂණ ක්‍රමශිල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) අවධානය අඩු අධික්‍රියාකාරී යැ'යි අනුමාන කරන ශිෂ්‍යයකුගේ පන්ති කාමරයේ දී චර්යා නිරීක්ෂණය සඳහා නිර්ණායක **හයක්** ඇතුළත් නිරීක්ෂණ පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 05යි)

(iii) පරීක්ෂණ ක්‍රමශිල්ප මෙන් ම පරීක්ෂණ නොවන ක්‍රමශිල්ප පාසල් උපදේශන කාර්යය සඳහා වැදගත් වන ආකාර **තුනක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

8. ගුරු විවේකාගාරයේ දී පාසලේ ක්‍රියාශීලී සිසුවකු සම්බන්ධයෙන් සිදු කළ කථාබහක කොටසක් පහත දැක්වේ.

"මට හරි කණගාටුයි, චතුර අර හරි ම නිර්මාණශීලී ළමයා, මේ සැරේ නම් යන්තම් පාස්වෙලා තියෙනවා. ආයෙ විභාගෙ කරන්න බැරිලු. ගෙදරට වෙලා නිකන් ඉන්නවලු. ඒ ළමයා ඉදිරියේ දී මොනව ද කරන්න ඕනෑ කියල දන්නෙ නැහිලු. අනේ සර්, මට උදව් වෙන්න පුළුවන් ද කියල මගෙන් අහනවා. ඇත්තට ම අපි එයාට උදව් කරන්න ඕනෑ."

(i) චතුරට වෘත්තීය තොරතුරු ගවේෂණයට අදාළ කර ගත හැකි ද්විතියික මූලාශ්‍ර **හයක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) මෙවැනි සිසුන්ට වෘත්තීය සුදුසුකම් සපුරා ගත හැකි ආකාර **දෙකක්** විස්තර කරන්න.

(ලකුණු 05යි)

(iii) වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශනයට අදාළ වෘත්තීය තොරතුරු පිළිබඳ ව අවබෝධය ලබා දීම සඳහා පන්ති කාමරයේ දී කළ හැකි ක්‍රියාකාරකම් **තුනක්** නිදසුන් මගින් විස්තර කරන්න.

(ලකුණු 08යි)

********

Rev Manikwela Siriwathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016**
**පුනර් පරීක්ෂණය - 2018**

**PE0170/PE770**
**අධ්‍යාපන මාර්ගෝපදේශය සහ උපදේශනය**
**EDUCATIONAL GUIDANCE & COUNSELLING**

2018.12.15 | පැය 0900 - පැය1200 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

---

විභාග අංකය:..........................................

## I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. ඇමෙරිකාවේ බොස්ටන් නගරයේ දී පළමු වෘත්තීය මාර්ගෝපදේශ කාර්යාලයක් ආරම්භ කළේ,
   1. කාල් රොජර්ස් ය.
   2. ෆ්‍රෑන්ක් පාසන්ස් ය.
   3. ඒබ්‍රහම් මාස්ලෝ ය.
   4. ඉවාන් පැව්ලොව් ය. (........)

02. මානසික ආතතීන් මගහරවමින් සතුටින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ශිෂ්‍ය ශිෂ්‍යාවන් දායක කර ගැනීමට සහය වන්නේ,
   1. සෞඛ්‍ය උපදේශනයෙනි.
   2. වෘත්තීය උපදේශනයෙනි.
   3. මනෝ සමාජයීය උපදේශනයෙනි.
   4. කණ්ඩායම් උපදේශනයෙනි. (........)

03. උපදේශනයෙහි ලක්ෂණයක් නොවන්නේ,
   1. විෂයය පිළිබඳ විශේෂ පුහුණුවක් අවශ්‍ය වීම යි.
   2. ගැටලුව සඳහා විසඳුම් ලබා දීම යි.
   3. න්‍යායාත්මක පදනමකින් මැදිහත් වීම යි.
   4. මනා අන්තර් සබඳතාවකින් සිදු කරන ක්‍රියාවලියක් වීම යි. (........)

අ.පි.බ.

Rev Manikwela Sirivathana Thero

04. දිශාභිමුඛ සේවයෙන් සිදුවන ප්‍රධානතම කාර්යයන් දෙකක් තෝරන්න.

A – අනුවර්තනයට සහය වෙයි. B – යොමු කිරීමට සහය වෙයි.

C – ආත්ම විශ්වාසය ගොඩනගා ගැනීමට සහය වෙයි. D – තෝරා ගැනීමට සහය වෙයි.

නිවැරදි පිළිතුර වන්නේ,

1. A සහ B ය. 2. B සහ C ය.

3. C සහ D ය. 4. A සහ D ය. (........)

05. පුද්ගල අවශ්‍යතා මෙන් ම චර්යාව පිළිබඳ ව නිරන්තරව සොයා බලා අදාළ මැදිහත්වීම් කරන්නේ උපදේශකගේ,

1. තක්සේරුකරණ භූමිකාවෙනි. 2. සම්බන්ධීකරුවකුගේ භූමිකාවෙනි.

3. මැදිහත්කරුවකුගේ භූමිකාවෙනි. 3. සංවිධායකවරයකුගේ භූමිකාවෙනි. (........)

06. වෘත්තීය ගරුත්වය පවත්වා ගැනීම සඳහා වැදගත් වන්නේ,

1. උපදේශන කුසලතා වේ. 2. උපදේශන ගුණාංග වේ.

3. උපදේශන ආචාරධර්ම වේ. 4. උපදේශකයේ චර්යාව වේ. (........)

07. පුද්ගල ගැටලුව පිළිබඳ ව විවිධ පැතිකඩයන්ගෙන් යුතු ව කරුණු සොයා ගැනීමට සහය වන උපදේශන කුසලතාව වන්නේ,

1. සහකම්පනය යි. 2. එදිරිසංවාදය යි.

3. ප්‍රතිවර්තනය යි. 4. ප්‍රශ්නකරණය යි. (........)

08. පුද්ගල පෞරුෂයේ ජීව විද්‍යාත්මක පදනම වශයෙන් ෆ්‍රොයිඩ් සලකන්නේ,

1. ඉඩ් සංස්කාරය යි.

2. අහංභාවය යි.

3. උපරිඅහංභාවය යි.

4. ඉහත කරුණු තුනෙහි ම සංකලනය යි. (........)

09. "මගේ වැරදි දැනගෙනත් උපදේශනය භාර මැඩම් මා සමඟ කථා කළේ ලෙංගතුකමෙන්." මෙයින් මතු කරන උපදේශන ගුණාංගය වන්නේ,

1. හෘදයාංගම පිළිගැනීම යි. 2. සහකම්පන ප්‍රතිචාර දැක්වීම යි.

3. කොන්දේසි විරහිත සැලකිල්ල යි. 4. මානව ගරුත්වය යි. (........)

10. අධ්‍යාත්මික හිදැස පිළිබඳ ව අවධාරණය කෙරෙන උපදේශන ප්‍රවේශය වන්නේ,

1. මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශය 2. චර්යාවාදී ප්‍රවේශය

3. සාංදෘෂ්ටිකවාදී ප්‍රවේශය 4. සංජානනික ප්‍රපංචමය ප්‍රවේශය (........)

11. අභ්‍යන්තර ගත වූ අවරෝධිත මතකයන් සඳහා අවකාශ සැලසීම අයත් උපදේශන ක්‍රමශිල්පය වන්නේ,

1. විරෝධතා විශ්ලේෂණය යි. 2. නිදහස් සංගමනය යි.

3. පුද්ගල කේන්ද්‍රීය ක්‍රමශිල්පය යි. 4. ස්ථාපනය යි. (........)

12. අභියෝගාත්මක හෝ තර්ජනාත්මක අවස්ථාවන්ට මුහුණදීමට ඇති අපහසුතාව හඳුන්වන්නේ,

1. සාංකාව ලෙස ය. 2. හිස්නෝන්මාදය ලෙස ය.

3. භීතිකා ලෙස ය. 4. කාංසාව ලෙස ය. (........)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

13. යහළු යෙහෙළියන්ගේ චිත්තවේගීය ගැටලු අවස්ථාවන් හඳුනා ගනිමින් මැදිහත් වීම,

1. පුද්ගල උපදේශනය වේ. 2. කණ්ඩායම් උපදේශනය වේ.

3. ආධ්‍යාත්මික උපදේශනය වේ. 4. සමපදස්ථ උපදේශනය වේ. (........)

14. වෘත්තීය තේරීම් ක්‍රියාවලිය සඳහා පෞරුෂ ගුණාංග වැදගත් වන බව පැවසුවේ,

1. ජෝන් හොලන්ඩ් වේ. 2. ඩොනල්ඩ් සුපර් වේ.

3. ඈන් රෝ වේ. 4. එලි ගින්ස්බර්ගේ වේ. (........)

15. නිතර අඬමින් බියවෙන තරුෂා පිළිබඳ ව 2 ශ්‍රේණිය භාර ගුරුවරිය ඇගේ මවට පැවසුවේ ඇය ළමා මානසික වෛද්‍ය සායනයකට රැගෙන යාම යෝග්‍ය බව යි. මෙය උපදේශනයට අනුව,

1. මැදිහත් වීමකි. 2. නිවාරණයකි.

3. යොමු කිරීමකි. 4. සංවර්ධනයකි. (........)

16. උපදේශන කාර්යයෙහි තොරතුරු රැස් කිරීම සඳහා පරීක්ෂණ ක්‍රමශිල්පයක් **නොවන්නේ,**

1. ලේඛන පරීක්ෂාව ය. 2. බුද්ධි පරීක්ෂණය ය.

3. පෞරුෂ පරීක්ෂණය ය. 4. අභියෝග්‍යතා පරීක්ෂණය ය. (........)

17. හේතුවාදී ප්‍රවේශයට අනුව පුද්ගලයා ගැටලුවට පත්වන්නේ,

1. ඔහු/ඇය මුහුණ දෙන සිද්ධිය නිසා ය.
2. ඔහු/ඇයගේ අහේතුක විශ්වාසය නිසා ය.
3. ඔහු/ඇයගේ සර්ව සුභවාදී සිතුවිලි නිසා ය.
4. ඔහු/ඇයගේ මානසික අවපීඩනය නිසා ය. (........)

18. මනෝවිශ්ලේෂණවාදී උපදේශනයේ දී සැලකිල්ලට ගනු ලබන්නේ,

1. පුද්ගලයාගේ අතීතය සහ එහි අමිහිරි සිදුවීම් ය.
2. පුද්ගලයාගේ සමීප වර්තමානය සහ එහි අමිහිරි සිදුවීම් ය.
3. පුද්ගලයාගේ සමීප වර්තමානය සහ අතීත අත්දැකීම් ය.
4. පුද්ගලයාගේ අතීතය සහ ජීවන බැඳීම් ය. (........)

19. අවුරුදු 7ක් වයසැති තරිඳු පවසන්නේ කෙදිනක හෝ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවකු වන බව ය. මෙය එලි ගින්ස්බර්ගේ න්‍යායට අනුව,

1. ලැදියා මත තේරීම් කරන අවධියට අයත් වේ.
2. මනඃකල්පිත තේරීම් කරන අවධියට අයත් වේ.
3. අත්දැකීම් මත තේරීම් කරන අවධියට අයත් වේ.
4. ගවේෂණ අවධියට අයත් වේ. (........)

20. 2 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චතුෂ පන්තිය පුරා එහෙ මෙහෙ ඇවිදියි. හුණ්ඩු පුවරුවේ කටු ගායි. ඔහුගේ ම ලෝකයක ජීවත් වෙයි. ඉගෙන නොගනියි. මෙය,

1. චිත්තවේග අක්‍රමතාවකි. 2. ශ්‍රස්ථීය අනිවාර්ය අක්‍රමතාවකි.

3. ඔටිසම් තත්ත්වයකි. 4. මානසික අවපීඩනයකි. (........)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev. Manikwela Sirirathana Thero

[සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය தேசிய கல்வி நிறுவகம் National Institute of Education
ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0170/PE770 - අධ්‍යාපන මාර්ගෝපදේශය සහ උපදේශනය

**II කොටස**

...ශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

පාසල් මාර්ගෝපදේශය සහ උපදේශනය ශිෂ්‍ය ජීවිත සංවර්ධනය කරා ගෙනයාමට සහය වන ක්‍රියාවලියකි.

පාසල් උපදේශනයට අදාළ නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03)

(ii) පාසල් උපදේශනයට අදාළ කරගත හැකි උපදේශන ප්‍රභේද **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ද්විතීයික පාසලේ දෙමව්පිය කවයක දී පාසල් උපදේශනය පිළිබඳ ව ඔවුන්ට දැනුවත් කිරීමේ දේශනය ඔබට පැවරී ඇත. එම දේශනයේ දී මතු කරන කරුණු **තුනක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

ද්විතීයික පාසලේ උපදේශන කාර්යය වඩා ශක්තිමත් කිරීමට නම් සමාජයට අවශ්‍ය වී ඇත්තේ මානසික සෞඛ්‍යයෙන් යුතු පිරිසකි.

(i) ද්විතීයික පාසලේ ළමුන් ආශ්‍රිත ගැටලු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) පාසලට උපදේශනය අවශ්‍ය වීමට බලපාන සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) සක්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් වාතාවරණයක් ගොඩනැංවීම සඳහා උපදේශන ගුරු භූමිකාව වැදගත් වන ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

මානසික ආතතියට මුහුණ දෙන සිසුන් ප්‍රමාණය ද්විතීයික පාසලේ පමණක් නොව ප්‍රාථමික පාසලේ ද බොහොමයක් සිටින බව පුවත්පත් වාර්තාවල සඳහන් වේ.

(i) සිසුන් ආතතියට පත්වීමට බලපාන පාසල ආශ්‍රිත සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) නිවසේ ඉගෙනුම් පරිසරයක් ගොඩනගා ගැනීම සඳහා ප්‍රාථමික පාසලේ දෙමව්පියන්ට ලබාදෙන උපදෙස් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විභාග ආතතිය අවම කිරීම සඳහා ගුරුවරයාට මැදිහත් විය හැකි ක්‍රම **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

04. ප්‍රාථමික පාසලේ මාර්ගෝපදේශ සහ උපදේශන වැඩසටහන් සක්‍රියවීම තුළින් සිසුන්ට ද්විතීයික පාසලට අනුවර්තනය පහසු වේ.

(i) ප්‍රාථමික පාසලේ ක්‍රියාත්මක කළ හැකි මාර්ගෝපදේශ වැඩසටහන් **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) ප්‍රාථමික පාසලට අදාළ උපදේශන අරමුණු **දෙකක්** ලියා, ඒවා ඉටුකර ගැනීමට කළ හැකි ක්‍රියාකාරකමක් බැගින් ලියන්න. (ලකුණු 05)

(iii) "ප්‍රාථමික පාසලට උපදේශනයට වඩා මාර්ගෝපදේශය අත්‍යවශ්‍ය වේ." මෙම කියමන නිදසුන් සහිත ව සනාථ කරන්න. (ලකුණු 08)

05. අඹගස්හැන්න මධ්‍ය මහා විද්‍යාලය පළාතේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන පාසල ලෙස මෙම වර්ෂයේ සම්මාන හිමි කර ගැනීමට සමත් විය.

(i) පාසලේ ක්‍රියාත්මක කර ඇතැ'යි අනුමාන කළ හැකි වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන අරමුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ පාසලේ වෘත්තීය මාර්ගෝපදේශය සිසුන් තුළ ප්‍රචලිත කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග **තුනක්** නම් කර, ඒවායින් ශිෂ්‍යයාට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකු[illegible]

06. විවිධ පැතිකඩයන් ඔස්සේ ගැටලු විශ්ලේෂණය කිරීම උපදේශන ප්‍රවේශයන්ගෙන් සිදුවන ප්‍රධා[illegible] වේ.

(i) උපදේශන ප්‍රවේශ ගුරුවරයාට වැදගත් වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) 16 හැවිරිදි සුජානි පාසලේ උස ම ශිෂ්‍යයාව වීම පිළිබඳ ව කණගාටුවෙන් පසු වේ. මේ නිසා ම ඇය අධ්‍යාපනය ද කඩාකප්පල් කර ගනිමින් සිටින්නී ය. මෙම ගැටලුව සංජානනික ප්‍රපංචමය ප්‍රවේශය යටතේ විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(iii) සමස්ත ලංකා තරගයෙන් දෙවන ස්ථානය හිමි කර ගැනීම පිළිබඳ ව අකලංක ඉතා ම කණගාටුවට සහ ලැජ්ජාවට පත් වී ඇත. මෙම ශිෂ්‍යයාට මැදිහත් වීමට යොදා ගත හැකි ක්‍රමශිල්ප **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. නදුන් 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන, පන්තිය පුරා ඇවිදිමින් අනෙකුත් ශිෂ්‍යයන්ට කරදර කරන ශිෂ්‍යයෙකි. ඔහුට එකතැනක විනාඩියක්වත් රැඳී සිටීමට ද අපහසුය. තව ද විෂය කරුණු අමතක වන බැවින් සාධනය ඉතා ම පහළ තත්ත්වයක ඇත.

(i) නදුන්ට ඇති ගැටලුව කුමක් ද? (ලකුණු 03)

(ii) නදුන් පිළිබඳ ව සොයා බැලීමට යොදා ගත හැකි පරීක්ෂණ නොවන ක්‍රමශිල්ප **දෙකක්** ගැටලුව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) මෙම ශිෂ්‍යයාට මැදිහත්වීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev. Manikwela Siriwathana Thero

08. විවිධ නිර්මාණ තරගවලින් සමස්ත ලංකා ජයග්‍රහණ හිමි කරගත් චාමර සාමාන්‍ය පෙළ දෙවරක් ම අසමත් වූයේ ගණිතය විෂයය නිසා ය. ආර්ථික ප්‍රශ්න බොහොමයකට මුහුණ දෙන චාමර පැවසූයේ තම අනාගතය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයකට පත් වී ඇති බව යි.

(i) චාමරට තම අනාගතය පිළිබඳ අවිනිශ්චිත තත්තවයකට පත්වීමට බලපාන සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) එලි ගින්ස්බර්ග්ගේ වෘත්තීය වරණය පිළිබඳ න්‍යායට අනුව චාමරගේ හැකියා, දක්ෂතා විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(iii) චාමර වැනි ගැටලුකාරී තත්ත්වයන්ට පත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ඔබ ගන්නා වෘත්තීය මාර්ගෝපදේශයට අදාල ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

*********

Rev Manikwela Sirirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
### පුනර් පරීක්ෂණය - 2018

PE0180/PE780 | ඉගැන්වීමේ ශිල්පක්‍රම
TEACHING TECHNIQUES

2018.12.15 | පැය 1300 - පැය1600 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" කොටසින් එක් ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න හතරක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

විභාග අංකය:.......................................................

## I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා සබැඳි සංකල්පවල අනුපිළිවෙළ පිළිබඳ ව ගුරු සිසුන් කීප දෙනකු ඉදිරිපත් කරන ලද පිළිතුරු කීපයක් පහත දැක්වේ. නිවැරදි අනුපිළිවෙළ සහිත පිළිතුර තෝරන්න.

    1. න්‍යාය → ප්‍රවේශය → ක්‍රම → ශිල්පක්‍රම
    2. ශිල්පක්‍රම → ක්‍රම → න්‍යාය → ප්‍රවේශ
    3. ප්‍රවේශ → ශිල්පක්‍රම → පටිපාටිය → ක්‍රම
    4. ක්‍රම → ප්‍රවේශ → පටිපාටිය → ශිල්පක්‍රම (.........)

02. ගුරු අධ්‍යාපන පාඨමාලාවක් හදාරා නව පාසලකට යන ඔබ අමතා විදුහල්පති විසින් කරන ලද ප්‍රකාශයක් පහත දැක්වේ.

    "මේ පාසලට කිසිම දවසක නියමිත ගුරුවරු ප්‍රමාණය නැහැ. ඉන්න අයගෙනුත් බොහෝ අය නිවාඩු. ඒ නිසා බොහෝ දිනවල සමහර පන්තිවල ළමයින්ට නිවාඩු දීල ගෙදර යවනව. මම වෙන මොනව කරන්න ද?"

    පාසලේ උද්ගත ව ඇති ගැටලු තත්ත්වය අවම කිරීම සඳහා යොදාගත හැකි ක්‍රමයක් ලෙස ඔබ යෝජනා කරන්නේ කුමන ඉගැන්වීමේ ක්‍රමය ද?

    1. සමූහ ඉගැන්වීමේ ක්‍රමය
    2. ගැටලු විසඳීමේ ක්‍රමය
    3. බහුශ්‍රේණි ඉගැන්වීමේ ක්‍රමය
    4. මඟ පෙන්වන ලද අනාවරණ ක්‍රමය (.........)

අ.පි.බ.

Rev Manikwela Sirivathana Thero

03. එක ම ශ්‍රේණියක එක ම විෂයය සමාන්තර පන්තිවල උගන්වන ගුරුවරුන් දෙදෙනකුගේ එක ම මාතෘකාවකට අදාළ පාඩම් සටහන්වල වෙනස්කම් පිළිබිඹු විය හැක්කේ කුමන අවස්ථාවල දී ද යන්න තෝරන්න.

1. නිපුණතාව, නිපුණතා මට්ටම් සහ ඉගෙනුම් පල තීරණයේ දී
2. ඉගෙනුම් පල සහ විෂය කරුණු තීරණයේ දී
3. ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් ඉගැන්වීමේ ක්‍රම හා ශිල්පක්‍රම තීරණයේ දී
4. ඉගෙනුම් පල, නිපුණතා මට්ටම් හා පාඩමේ පියවර වෙන් කිරීමේ දී (..............)

04. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පන්ති පාලනය කිරීම පිළිබඳ ගැටලුවට මුහුණ පා ඇති නවක ගුරුවරයකුට ඔබ ලබා දෙන ප්‍රතිජනනාත්මක උපදෙසක් වන්නේ මින් කුමක් ද?

1. ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම පමණක් ක්‍රියාත්මක කරන ලෙස ය.
2. තෝරා ගත් ඉගැන්වීම් ක්‍රම සම්බන්ධ අන්තර්ජාල තොරතුරු පරිශීලනය කරන ලෙස ය.
3. ක්‍රියාත්මක කිරීමට පහසු ක්‍රම පමණක් ක්‍රියාත්මක කරන ලෙස ය.
4. ඉගැන්වීම් ක්‍රමවලට අදාළ ගුරු සූදානමේ ස්වභාවය, පන්ති කාමර සාධක පිළිබඳ ව නැවත සැලකිලිමත් වන ලෙස ය. (..............)

05. "A" නමැති ගුරුවරයාගේ පාඩමක් අධීක්ෂණය කළ පාසලේ අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් රැසක් තිබුණ ද ඒවා භාවිතයට ගැනීමේ ගැටලු පවතින බවට සටහන් තබා ඇත. මෙම නිර්දේශය ලද ගුරුවරයා ඔබ නම් ගන්නා වඩාත් උචිත ම ක්‍රියාමාර්ගය කුමක් ද?

1. ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් භාවිත නොකිරීම
2. පාඩම ආරම්භයේ දී ම ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් ඉදිරිපත් කිරීම
3. පාඩම සැලසුමේ සම්පත් භාවිත කරන අවස්ථා හා ආකාරය දැක්වීම
4. පහසුවෙන් පරිහරණය කළ හැකි ඉගෙනුම් සම්පත් පමණක් යොදා ගැනීම (..............)

06. පාඩම් ඉගැන්වීමේ දී පිවිසුම සම්බන්ධ ගුරුවරුන් දෙදෙනකු මෙසේ ප්‍රතිචාර දක්වා තිබුණි.

X ගුරුවරයා - පාඩමක පිවිසුම කුමක් වුණත් එයින් පාඩමට බලපෑමක් නැහැ.

Y ගුරුවරයා - ක්‍රියාකාරී පිවිසුමක් පාඩමට අත්‍යවශ්‍ය යි. එයින් පාඩමට දිශානතියක් ලැබෙනවා.

විෂය ප්‍රධානී ලෙස පාසලේ සිටින X වැනි ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනයට පහත සඳහන් කුමන ක්‍රියාමාර්ගය ඔබ යෝජනා කරන්නේ ද?

1. පිවිසුමක අවශ්‍යතාව, වැදගත්කම සහ විවිධ පිවිසුම් ක්‍රම පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම
2. සියලු ම ගුරුවරුන් සිය පාඩම් සටහන්වල පිවිසුම අනිවාර්යයෙන් ඇතුළත් බව දැක්වීම
3. පාඩම්වල දී එකිනෙකට වෙනස් වූ පිවිසුම් අනුගමනය කිරීමට උපදෙස් දීම
4. ගුරුවරයාගේ ගුරු වාර්තා පොතේ ඒ පිළිබඳ ව සටහන් කිරීම (..............)

07. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්පයක් ලෙස බුද්ධි කලම්බනය යොදා ගැනීමේ දී ගුරුවරයා **නොකළ** යුතු කාර්යය වන්නේ මින් කුමක් ද?

1. බුද්ධි කලම්බන මාතෘකාව හුණු පුවරුවේ සටහන් කිරීම
2. මාතෘකාව කලින් දින සිසුන්ට ඉදිරිපත් කිරීම
3. සිසුන් ප්‍රතිචාර ඉදිරිපත් කිරීමේ දී බාධා කිරීම
4. සිසුන්ගේ ප්‍රතිචාර සටහන් කිරීම (..............)

අ.පි.බ.

Rev. Manikwela Suwathana Thero

08. ඉගෙනුම් ශිල්පක්‍රමයක් ලෙස පැවරුම් ක්‍රමය යොදා ගැනීමේ දී පැවරුම ලබා දීමෙන් අපේක්ෂිත අරමුණ මෙන් ම ………………………, ……………………… යන සාධක පිළිබඳ ව ගුරුවරයා විශේෂ අවධානය යොමු කළ යුතු ය. මෙම ප්‍රකාශයේ හිස්තැන සම්පූර්ණ කිරීමට වඩාත් උචිත යෙදුම් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. කාලය, සහභාගීත්වය
2. උපදෙස්, කාලය
3. අදාලත්වය, ශිෂ්‍ය සංඛ්‍යාව
4. අදාලත්වය, කලින් පාඩම සමඟ සබඳතාව (…………)

09. ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සම්බන්ධ එඩ්ගා ඩේල්ගේ අත්දැකීම් කේතුවෙහි අන්තර්ගත ප්‍රධාන අවස්ථා තුන මොනවා ද?

1. දෘශ්‍ය සංකේත, වාචික සංකේත, ක්‍රියාකාරී අත්දැකීම්
2. සංකේතමය, උපක්‍රමික සහ සෘජු ඵලදායී අත්දැකීම්
3. නාට්‍යමය, උපක්‍රමික සහ සංකේතමය අත්දැකීම්
4. සංකේතමය ආදර්ශන සහ අධ්‍යාපන චාරිකා ආශ්‍රිත අත්දැකීම් (…………)

10. ව්‍යාපෘති ක්‍රමයට පාඩමක් ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයා ප්‍රථමයෙන් ම කළ යුතු කාර්යය කුමක් ද?

1. සැලසුම් කිරීම
2. අරමුණු නිර්ණය කිරීම
3. සම්පත් සපයා ගැනීම
4. තත්ත්ව විශ්ලේෂණය (…………)

11. පන්ති කාමරයක ශිෂ්‍ය විවිධතා තිබුණ ද සෑම ළමයකුට ම ඉගෙනුම පහසු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම ගුරුවරයාගේ අනිවාර්ය වගකීමකි. ඒ සඳහා ගුරුවරයකු අනුගමනය කළ යුතු කාර්ය කීපයක් පහත දැක්වේ.

A – සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා නිරීක්ෂණය කිරීම

B – ඉගෙනුම් දුෂ්කරතා ඇතිවීමට බලපාන සාධක හඳුනා ගැනීම

C – ඉගෙනුම් දුෂ්කරතාවයේ සුවිශේෂී ස්වභාව හඳුනා ගැනීම

D – දුෂ්කරතාවලට විසඳුම් ක්‍රියාමාර්ග සැලසුම් කිරීම

මෙම කාර්යවල නිවැරදි අනුපිළිවෙළ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ACBD 2. ABCD 3. ACDB 4. DCAB (…………)

12. ඉගැන්වීමේ සම්පත් භාවිතය පිළිබඳ පර්යේෂකයකුගේ නිගමනයක් පහත දැක්වේ.

හුණු පුවරුව (කළුලෑල්ල) ඕනෑම පාසලක, ඕනෑම අධ්‍යාපන මට්ටමක දී භාවිත කළ හැකි සම්පතක් වුව ද බොහෝ ගුරුවරු එයින් ප්‍රයෝජන ගැනීමට අසමත් ව ඇත.

මේ ගැටලුව විසඳීමට ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ගයක් ලෙස ඔබ යෝජනා කරන්නේ කුමක් ද?

1. ගුරු පුහුණු පාඨමාලාවල දී මේ පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කිරීමට යෝජන කළ යුතු ය.
2. ගුරුවරයා හුණු පුවරුව භාවිත කිරීමේ කුසලතා ස්වයං මෙහෙයුමෙන් ප්‍රගුණ කළ යුතු ය.
3. හුණු පුවරුව වෙනුවට වෙනත් වර්ගයක පුවරු භාවිතයට දිය යුතු ය.
4. පාඩම ආරම්භ කිරීමට පෙර අවශ්‍ය දෑ හුණු පුවරුවේ ලියා තැබිය යුතු ය. (…………)

අ.පි.බ.

Rev Manikwela Stirathana Thero

13. අනාවරණ ඉගෙනුම සඳහා මූලික වන චින්තන ස්වරූප දෙක පිළිබඳ ව ගුරු සිසුන් දක්වන ලද ප්‍රතිචාර පහත දැක්වේ. ඒවායින් නිවැරදි චින්තන ස්වරූප දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.

1. විමර්ශනාත්මක චින්තනය සහ අනුගාමී චින්තනය
2. අභිසාරී චින්තනය සහ අපසාරී චින්තනය
3. විධිමත් චින්තනය සහ අවිධිමත් චින්තනය
4. අභිසාරී චින්තනය සහ අනුගාමී චින්තනය (..........)

14. ගුරුවරයකුගේ ප්‍රත්‍යවේක්ෂණ සටහනකින් උපුටා ගත් කොටසක් පහත දැක්වේ.

"එක් එක් ආයතනවලින් විවිධ පාඩම් සටහන් ආකෘති හඳුන්වා නොදී පොදු ආකෘතියක් හඳුන්වා දෙන්නේ නම් . . . . "

මෙම සටහන තැබූ ගුරුවරයාට ඔබ ලබාදෙන ප්‍රධාන ධනාත්මක උපදේශය වන්නේ කුමක් ද?

1. විවිධ ආකෘති නිරීක්ෂණය කර, එහි ඇති පොදු අංග හඳුනා ගන්න.
2. තමන් කැමති එක් ආකෘතියක් පමණක් අනුගමනය කරන්න.
3. වාර සටහනේ ඇති අංගවලට අනුකූලව සැලසුම් සකසන්න.
4. විවිධ ආකෘති අතර ඇති වෙනස් අංග පමණක් හඳුනා ගන්න. (..........)

15. න්‍යායානුසාර ඉගැන්වීමේ ක්‍රම යොදා ගැනීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු මනෝවිද්‍යාත්මක සාධක ඇතුළත් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. ශිෂ්‍යයාගේ ආරම්භය සාධක හා පවුල් පසුබිම
2. ශිෂ්‍යයාගේ අවශ්‍යතා, ලැදියා සහ සංවර්ධන අවධිය
3. ශිෂ්‍යයා විවේකය හා විනෝදය ගත කරන ආකාරය
4. ශිෂ්‍යයාගේ පවුල් පසුබිම සහ අනුකරණ හැකියාව (..........)

16. අධ්‍යාපනඥයකු විසින් පාසලක ගුරු මණ්ඩලය අමතා කරන ලද ප්‍රකාශයක් පහත දැක්වේ.

". . . පන්ති කාමර ඉගැන්වීම්වල දී බොහෝ ගුරුවරුන් ප්‍රශ්නකරණය යොදා ගනු ලැබුව ද එමගින් ශිෂ්‍යයාගේ චින්තනය අවදි කිරීමට අසමත් වී ඇත."

මෙම තත්ත්වය ඇතිවීමට බලපාන ලද ප්‍රධාන හේතුව කුමක් ද?

1. ගුරුවරයා සිසුන්ගෙන් ප්‍රශ්න අසනුයේ ඉතා කලාතුරකින් වීම
2. පිළිතුරු ලෙස "ඔව්" සහ "නැහැ" වශයෙන් ප්‍රතිචාර ලැබෙන ප්‍රශ්න විමසීම
3. ගුරුවරුන් විසින් සිසුන්ගේ ප්‍රතිචාර තහවුරු නොකිරීම
4. ප්‍රශ්නයත් පිළිතුරත් ගුරුවරයා විසින් ම ඉදිරිපත් කිරීම (..........)

17. ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම සහ විශේෂ ක්‍රම අතර ඇති සබඳතාව නිරූපණය කිරීම සඳහා ගුරු සිසුන් විසින් ඉදිරිපත් කර ඇති පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම සහ විශේෂ ක්‍රම අතර සම්බන්ධතාවක් නොපවතී.
2. ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම සහ විශේෂ ක්‍රම කීපයක් අතර සම්බන්ධතාවක් ඇත.
3. ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම මගින් ඉගැන්වීමේ විශේෂ ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සපයයි.
4. ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම පිළිබඳ ව අවබෝධයක් නොමැති වුව ද ඉගැන්වීමේ විශේෂ ක්‍රම ක්‍රියාත්මක කළ හැකි ය. (..........)

අ.පි.බ.

Rev Manikwela Srirathana Thero

18. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හා ශිල්පක්‍රම තෝරා ගැනීමේ දී ගුරුවරයකු සැලකිලිමත් විය යුතු ප්‍රධාන සාධක ලෙස විෂය සම්බන්ධ, ඉගෙනුම්ලාභියා සම්බන්ධ සහ ගුරුවරයා සම්බන්ධ සාධක ගුරු ශිෂ්‍යයකු විසින් දක්වා තිබුණි. ඒවා එකතු විය යුතු තවත් ප්‍රධාන සාධකයක් වන්නේ මින් කුමක් ද?

1. විෂය කරුණු සම්බන්ධ
2. ශිෂ්‍යයාගේ බුද්ධි මට්ටම සම්බන්ධ
3. ඉගෙනුම් පරිසරය සම්බන්ධ
4. ගුරුවරයාගේ සූදානම සම්බන්ධ (............)

19. ඉගැන්වීමට අදාළ ව ගුරුවරයාගේ සූදානම සම්බන්ධ ප්‍රථම හා මූලික සැලසුම වන්නේ වාර සටහන යි. වාර සටහනක් පිළියෙල කිරීමේ දී වඩාත් සැලකිලිමත් විය යුතු සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

1. පෙළ පොත, පාසල් ලිත, පාසලේ විවිධ රැස්වීම් දින
2. රජයේ නිවාඩු දින, පෞද්ගලික නිවාඩු, සම්මන්ත්‍රණ දින, පෙළ පොත
3. විෂය නිර්දේශය, පෙළ පොත, පෞද්ගලික නිවාඩු
4. විෂය නිර්දේශය, පෙළ පොත, පාසල් ලිත, රජයේ නිවාඩු දින (............)

20. විෂය නිර්දේශ විග්‍රහ කිරීමෙන් ගුරුවරයකුට සිය විෂය ඉගැන්වීම ක්‍රියාත්මක කළ හැකි ප්‍රධාන අවස්ථා තුනක් හඳුනා ගත හැකි බව විෂයමාලා සම්පාදකයින්ගේ අදහස වේ. එම ප්‍රධාන ඉගෙනුම් අවස්ථා ඇතුළත් පිළිතුර තෝරන්න.

1. පන්ති කාමරයේ දී, විද්‍යාගාරයේ දී, ක්‍රීඩා පිටියේ දී
2. පන්ති කාමරය තුළ, තනි ව, සාමූහික ව
3. පන්ති කාමරයේ දී, එළිමහනේ දී, ක්ෂේත්‍රයේ දී
4. පන්ති කාමරය තුළ, පන්ති කාමරයෙන් බැහැර පාසල තුළ, පාසලින් බැහැර දී (............)

(ලකුණු 01 x 20 = ලකුණු 20)

Rev Manikwela Siirathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

විභාග දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016
## පුනර් පරීක්ෂණය - 2018
## PE0180/PE780 – ඉගැන්වීමේ ශිල්පක්‍රම

### II කොටස

"අ" කොටසින් එක් ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න හතරක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

"අ"

01. "ඉගැන්වීමේ ශිල්පක්‍රම විෂයය වූ කලී ගුරු වෘත්තියේ තාක්ෂණික ප්‍රවේශය විමර්ශනාත්මක ව විග්‍රහ කෙරෙන විෂයයකි."

(i) ඉගැන්වීමේ ශිල්පක්‍රම විෂය හැදෑරීමෙන් ආධුනික ගුරුවරයකු වර්ධනය කර ගන්නා වෘත්තීය කුසලතා **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට එම වෘත්තීය කුසලතා ඉවහල් විය හැකි අවස්ථා **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) පන්ති කාමර ඉගෙනුම් පරිසරය ඵලදායී ලෙස සකස් කිරීමේ දී මෙම විෂයයෙන් ලබා ගත හැකි අත්දැකීම් සෘජුව අදාළ කරගත් අවස්ථා **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. "ක්‍රියාත්මක ස්වභාවය මත ඉගැන්වීම් ක්‍රම ගුරු කේන්ද්‍රීය හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රම වශයෙන් දෙයාකාර වේ."

(i) ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රමවල දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම ඇසුරෙන් ගුරුවරයාට සහ ශිෂ්‍යයාට ලැබෙන වාසි **තුන** බැගින් වෙන් වෙන් ව ලියන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් ගුරු කේන්ද්‍රීය ක්‍රමය යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි පාඩමක් තෝරා ගන්න. එම පාඩම උගන්වන ආකාරය කෙටියෙන් දක්වන්න. තෝරා ගත් ඉගැන්වීමේ ක්‍රමය නිසා එම පාඩම තුළ මතුවිය හැකි ගැටලු මඟහැරවීම සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග **දෙකක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



Rev Manikwela Siriwathana Thero

"ආ"

03. "ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්ප යනු පාඩමක ක්‍රියාත්මක ස්වභාවය වේ."

(i) ගුරුවරයකුට පන්ති කාමරය තුළ බහුල ව යොදා ගත හැකි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්ප තෝරා ගැනීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු සාධක **තුනක්** බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් පාඩමක් තෝරා ගෙන එහි එක් පියවරක් සඳහා තෝරා ගත් ඉගැන්වීම් ක්‍රමශිල්පයක් යොදා ගන්නා ආකාරය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. සමෝධානිත විෂයන් ඉගැන්වීම සඳහා ප්‍රශස්ත ඉගැන්වීම් ක්‍රමයක් සේ සැලකෙන සමූහ ඉගැන්වීමේ ක්‍රමය (Team Teaching) අනෙක් විෂයන් ඉගැන්වීමේ දී ද යොදා ගත හැකි ය.

(i) සමූහ ඉගැන්වීම යන්න හඳුන්වන්න. (ලකුණු 03)

(ii) සමූහ ඉගැන්වීම ක්‍රියාත්මක කිරීමේ දී සැලකිලිමත් විය යුතු සාධක **පහක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් සමූහ ඉගැන්වීමේ ක්‍රමය යටතේ ක්‍රියාත්මක කළ හැකි පාඩමක් තෝරා ගෙන එය ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. "ගැටලු විසඳීමේ (Problem Solving) ක්‍රමය යොදා ගැනීමෙන් අපේක්ෂා කරනුයේ සාර්ථක ජීවිතයක් සඳහා වූ මූලික කුසලතා ශිෂ්‍යයා තුළ ප්‍රගුණ කිරීම යි."

(i) ගැටලු විසඳීමේ ක්‍රමය යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි පාඩම් මාතෘකා **තුනක්** ඔබගේ ප්‍රධාන විෂයය ඇසුරින් දක්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු විසඳීමේ ක්‍රමය තෝරා ගැනීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු සාධක **තුනක්** විග්‍රහ කරන්න. (ලකුණු 05)

(iii) ගැටලු විසඳීමේ ක්‍රමයට ක්‍රියාත්මක කළ හැකි පාඩමක් තෝරා ගෙන, ගැටලු විසඳීමේ මුල් පියවර **තුන** එම පාඩම ඇසුරින් ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

Rev Manikwela Sirirathana Thero

06. "ඉගෙනුමට පෙර නොතිබූ ඉගෙනුමේ ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයා දැන ගත යුතු කළ යුතු හා සිතිය යුතු දෑ පිළිබඳ ව ගුරුවරයා ප්‍රථමයෙන් ඇති කර ගන්නා ඉලක්ක ඉගෙනුම් පල වේ."

(i) ඉගෙනුම් පල ලිවීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම් පල ප්‍රථමයෙන් තීරණය කිරීම ගුරුවරයාගේ ඉගැන්වීම මෙන් ම ශිෂ්‍යයාගේ ඉගෙනුම පහසු කිරීමට හේතු වන ආකාරය පැහැදිලි කරන්න .(ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් තෝරා ගත්, පාඩමකට උචිත දැනුම, ආකල්ප, කුසලතා ක්ෂේත්‍ර නියෝජනය වන සේ ඉගෙනුම් පල **තුනක්** ලියන්න. එයින් එක් ඉගෙනුම් පලයක් ශිෂ්‍යයාට අත් කර දීමට උචිත ක්‍රියාකාරකමක් එම පාඩමට අදාළ ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. "ප්‍රත්‍යවේක්ෂණය ගුරුවරයාගේ ස්වයං වෘත්තීය සංවර්ධනයේ කැඩපතක් බඳු වේ."

(i) ප්‍රත්‍යවේක්ෂණ සටහනක අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රත්‍යවේක්ෂණ සටහන් ලිවීමෙන් ගුරුවරයාට අත්වන වාසි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පාඩම් සැලසුම්වල ඇති ප්‍රත්‍යවේක්ෂණ සටහන්වලින් ඔබ හඳුනා ගත් සිසුන්ගේ ඉගෙනුම් ගැටලු **තුනක්** නම් කරන්න. එයින් එක් ගැටලුවක් විසඳීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. "ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් ඉගැන්වීම් කාර්යය මෙන් ම සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය ද පහසු කරයි."

(i) ඉගෙනුම්-ඉගැන්වීම් සම්පත් තෝරා ගැනීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබගේ ප්‍රධාන විෂයය ඉගැන්වීමේ දී බහුලව යොදා යොදා ගත හැකි සකස් කරන ලද (නිර්මිත - Prepared) සම්පත් **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ප්‍රධාන විෂයයෙන් තෝරා ගත් පාඩමක් සඳහා යොදා ගත හැකි ඉගෙනුම් සම්පතක් තෝරා ගෙන, එය පාඩම ඉගැන්වීමේ දී යොදා ගන්නා ආකාරය සහ අවස්ථා උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

********

Rev Manikwela Siriwathana Thero

© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

4106

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017

**PE0180/PE780** | ඉගැන්වීමේ ශිල්ප ක්‍රම | **TEACHING TECHNIQUES**

2017.03.05 | පැය 1300 - පැය 1600 | කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" කොටසින් එක් ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න හතරක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

විභාග අංකය:..............................................

## I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ මූලික සංකල්ප පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

    1. උගන්වන්නේ කුමක් සඳහා ද යන්න ඉගැන්වීම් ක්‍රමවලින් අවධාරණය කරයි
    2. ඉගැන්වීමේ අනුපිළිවෙළ කෙසේ ද යන්න ඉගැන්වීමේ පටිපාටියෙන් අවධාරණය කරයි
